

# ශ්‍රී ලංකාව විසම්මුතියට පහර දෙයි.

AMNESTY INTERNATIONAL

ඇම්නස්ටි ඉන්ටර්නැෂනල් ලොව පුරා මිලියන 3 කට අධික ක්‍රියාකාරීන්, අනුග්‍රහකයින් ඇතුළු සාමාජිකත්වයක් සහිතව රටවල් හා භූගෝලීය කලාප 150 පුරා ව්‍යාප්ත ව ඇති බරපතළ මානව අයිතිවාසිකම් උල්ලංඝනයන් අවසන කිරිම පිණිස වන ව්‍යාපාරයකි.

අප ගේ දර්ශනය වන්නේ විශ්ව මානව හිමිකම් ප්‍රකාශනය ඇතුළු ජාත්‍යයන්තර මානව හිමිකම් ප්‍රකාශනයන් හි අඩංගු මානව හිමිකම් ප්‍රමිතීන් ලොව පුරා වාසය කරන සෑම පුද්ගලයෙකු විසින් ම භුක්ති විඳිනු දකින්නට ලැබීමයි.

අප සියළු රාජ්‍යයන්, දේශපාලන මතවාදයන් ගෙන් හා ආර්ථික, ආගමික උවමනාවන් ගෙන් ස්වාධීන වූ සංවිධානයකි. අප, සාමාජිකත්වය හා අනුග්‍රහකයින් විසින් සපයන අරමුදල් මත ක්‍රියා කරන සංවිධානයකි.

**AMNESTY INTERNATIONAL**

First published in 2013 by
Amnesty International Ltd
Peter Benenson House
1 Easton Street
London WC1X 0DW
United Kingdom

© ඇම්නස්ටි ඉන්ටර්නැෂනල් සංවිධානය 2013

Index: ASA 37/003/2013 English
මුල් පිටපත ඉංග්‍රිසි බසිනි
මුද්‍රණය ඇම්නස්ටි ඉන්ටර්නැෂනල් විසිනි
ජාත්‍යයන්තර ලේකම් කාර්යංශය එක්සත් රාජධානිය

සියළු හිමිකම් ඇහිරිණ. මෙහි අයිතිය ප්‍රකාශකයන් සතුය.
එහෙත් මෙම ප්‍රකාශනයේ අඩංගු කරුණු නොමිලේ සිදු කරන
මානව හිමිකම් උද්ඝෝෂණ ව්‍යාපාර, ප්‍රචාරණය හා
අධ්‍යාපනික අරමුණු පිණිස අවසරයකින් තොරව උපුටා
දැක්විය හැකි අතර එබඳු අවස්ථාවන් අප වෙත දැනුම් දිම
මෙම ප්‍රකාශනයේ බලපෑම පිළිබඳව තක්සේරු කිරිමට
උපකාර වනු ඇත. ඒ හැර මෙම ප්‍රකාශනය වෙනත්
කාර්‍යයන් සඳහා පිටපත් කිරිම, උපුටා දැක්විම, පරිවර්තනය
හෝ අනුවර්තනය පිණිස ප්‍රකාශක ගෙන් ලිඛිත අවසරයක්
ලබා ගෙන ගෙවීමක් ද කළ යුතු බව සලකන්න.
හිමිකම් අවසරය ලබා ගැනිම පිණිස කරුණාකර
copyright@amnesty.org ඊමේල් කරන්න

කවරයේ ඡායාරූපයට ඊහළ යන ඉන්ධන වියදමට එරෙහිව
කොළඹ දී පවත්වන ලද විරෝධතා පෙළපාලියකට ශ්‍රී ලංකා
පොලිසිය ජල කාලතුවක්කු ප්‍රහාරයක් එල්ල කරන ආකාරය
2012 පෙබරවාරි කොළඹ දීය.
© AP Photo/එරන්ග ජයවර්ධන

**amnesty.org**

| | පටුන | |
|---|---|---|
| 1 | හැඳින්වීම | 3 |
| | අධ්‍යයන ක්‍රමවේදය | 6 |
| | ශ්‍රී ලංකාවේ භාෂණයේ නිදහස, ප්‍රකාශනය ඇතුළුව අදහස් පළ කිරීමේ නිදහස, සාමකාමීව රැස්වීමේ නිදහස හා සමාගමයේ නිදහස | 6 |
| 2 | යුද්ධයෙහි සාක්ෂිකරුවන් මුලින්පුටා දැමීම | 9 |
| | ත්‍රිමලයේ සිසුන් පස් දෙනා ගේ ඝාතනය | 10 |
| | ඇක්ෂන් එගෙන්ස්ට් හන්ගර්" ප්‍රංශ ආධාර සංවිධානයේ සහන සේවකයින් 17 දෙනා ඝාතනය කිරීම | 11 |
| | තොරතුරු වසන් කරනු පිණිස මාධ්‍යවේදීන් ඉලක්ක කිරීම | 12 |
| | මාධ්‍යවේදී තිස්සනායගම්: ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ සිර දඬුවම් ලැබූ පළමු මාධ්‍යවේදියා | 12 |
| | ලසන්ත වික්‍රමතුංග ඝාතනය | 14 |
| | පෝද්දල ජයන්ත: බලහත්කාරයෙන් පැහැර ගැනීම හා පහර දීම | 14 |
| | භීෂණය පුළුල් කිරීම: සාම ක්‍රියාකාරින් හා වෘත්තීය සමිති නායකයින් අත් අඩංගුවට ගැනීම | 15 |
| | සිංහළ කොටි | 16 |
| | ජාත්‍යයන්තර විවේචන පිළිබඳ වර්ධනය වන ප්‍රතිවිරෝධතා | 17 |
| | අවසාන අදියර | 19 |
| 3 | යුද්ධයෙන් පසු ශ්‍රී ලංකාව: බලය සංකේන්ද්‍රනය වීම ( 2009 සිට වර්තමානය දක්වා) | 20 |
| | විධායක බලය ප්‍රසාරණය කිරීම | 21 |
| | අධිකරණයේ ස්වාධීනත්වය උදුරා ගැනීම | 22 |
| | අධිකරණ සේවා කොමිෂන් සභාවේ ලේකම් මංජුල තිලකරත්න මහතාට පහර දීම | 24 |
| | අගවිනිසුරු ශ්‍රීයානි බණ්ඩාරනායක මහත්මියට එරෙහි දෝෂාභියෝගය | 24 |
| | අභියාචනාධිකරණයේ විනිසුරුවන් වන එස් ස්කන්ධරාජා හා අනිල් ගුණරත්න යන විනිසුරුවන්ට එරෙහි තර්ජන | 25 |
| | (සිවිල් සමාජය) කැබලි කිරීම විවිධාංගීකරණය කෙරෙයි | 26 |
| | අතුරුදහන් වූ මාධ්‍යවේදියා ප්‍රගීත් එක්නැලිගොඩ | 26 |
| | සන්ඩේ ලීඩර් පුවත්පතේ ප්‍රධාන කර්තෘ ෆ්‍රෙඩ්රිකා ජැන්ස් | 27 |
| | අතුරුදහන් වුවන් ගේ පවුල් එකතුව | 28 |
| | රාමසාමි ප්‍රභාහරන් අතුරුදහන්වීම | 29 |
| | ඉඩම් අයිතිය ඉල්ලා සිටි කාන්තාවන්ට අවහිර කිරීම | 29 |
| | දේශපාලන ක්‍රියාකාරින්ට පහර දීම | 30 |
| | ප්‍රේමකුමාර ගුණරත්නම් හා දිමුතු ආටිගල | 30 |

| | | |
|---|---|---|
| | ලලිත් වීරගුරු හා කුගන් මුරුගනාදන්<br><br>මහජන මන්ත්‍රී සිවඥානම් ශ්‍රීධරන් | 30<br><br>31 |
| | මාධ්‍යවේදී ශාන්ත විජේසූරිය | 32 |
| | යාපනයෑ උදයන් පුවත් පත | 33 |
| | සන්ඬේ ලීඩර් පුවත් පතෙහි මාධ්‍යවේදී ෆරේස සකුර්අලි | 34 |
| | බි බි සි මාධ්‍ය කණ්ඩායමට තර්ජනය කිරිම හා සංදේශය වැඩ සටහන අවහිර කිරීම | 34 |
| | දැවැන්ත මහජන විරෝධතා යලි හිස එසවීම | 34 |
| | විශ්ව විද්‍යාල ආචාර්යවරුන් ගේ සමිති සම්මේලනයේ ආචාර්ය නිර්මාල් රංජිත් දේවසිරි | 36 |
| | යාපනය සරසවියෑ ශිෂ්‍ය විරෝධතා මර්දනය | 36 |
| | ජේ. සී. වැලිඅමුණ; ජයම්පති වික්‍රමරත්න; එම්. ඒ. සුමන්තිරන් ;රොමේෂ්. ඩී. සිල්වා ඇතුළු නීතිවේදීන්ට එරෙහිව එල්ල වන තර්ජන | 37 |
| | (සිවිල් සමාජයේ) ජාත්‍යයන්තර සම්බන්ධතා ප්‍රතිප්‍රහාරයට ලක් කිරිම | 39 |
| | පීඩනයට ගොදුරු වූ කාන්තා සංවිධාන | 39 |
| | මානවීය සහන සේවකයෙකු අත්අඩංගුවට ගෙන වධ හිංසා පැමිණවීම | 39 |
| | අතුරුදහන් වුවන් ගේ පවුල් සාමාජිකයින් ගේ කොළඹ සංචාරය වාරණය කිරීම | 40 |
| | සුනිලා අබේසේකර, සුනන්ද දේශප්‍රිය, නිමල්කා ප්‍රනාන්දු,පාක්‍යසෝති සරවනමුත්තු හා ජේ සී වැලිඅමුණඃ | 40 |
| | මාධ්‍යවේදී ඥානසිරි කෝට්ටේගොඩට රටින් පළා යන්නට බල කෙරේ | 41 |
| | ප්‍රගීත් එක්නැළිගොඩ ගේ භාර්යාව සන්ධ්‍යා එක්නැළිගොඩ | 42 |
| | හර්මන් කුමාර ජාතික ධීවර සහයෝගිතා ව්‍යාපාරය | 42 |
| | 2013 ආණ්ඩුව 'ජිනීවා' විවේචන මඟ හැරීමේ ප්‍රයත්නයක | 42 |
| | 2013 ආණ්ඩුව 'ජිනීවා' විවේචන මඟ හැරීමේ ප්‍රයත්නයක | 42 |
| 4 | නිගමනයයන් | 43 |
| | නිර්දේශයන් | 46 |
| | පසු සටහන් | 49 |

# ශ්‍රී ලංකාව විසම්මුතියට පහර දෙයි

## 1- හැඳින්වීම

විසම්මුතිවාදියෙක් වීම යනු ශ්‍රී ලංකාවේ භායනක මෙහෙවරකට අත ගැසීමකි. ආයුධ සන්නද්ධ යුද්ධය නිමා වීමත් සමඟම විසම්මුතිය නව ආරක දේශපාලන හා සමාජ ක්‍රියාකාරීත්වයක් ලෙස වර්ධනය වන්නට පටන් ගත් නමුත්, ශ්‍රී ලංකික බලධාරීන් ප්‍රතිචාරය, විවේචනය නොඉවසින සුළු කණ්ඩායමක් බව ක්ෂණිකවම ප්‍රදර්ශණය කෙරිණ. ශ්‍රී ලංකාවේ දිග් ගැස්සුන යුද්ධයෙහි පාර්ශවකරුවන් විසින් අන්තර් ජාතික මානව හිමිකම් හා මානවීය නීතිය බරපතළ ලෙස උල්ලංඝණය කළ බවට සාක්ෂි නොකඩවාම ගොඩ ගැසෙන අතර, ඇතැම් සාක්ෂි එකී පාර්ශවයන්ට එරෙහිව යුද්ධ අපරාධ ගොනු කිරීමට තරම් බරපතළ ඒවා වන හෙයින් ද, ඒ සම්බන්ධයෙන් වගකිව යුත්තන් ගෙන් වගවීමක් ඉල්ලා සිටින්නටත් සිදු වෙයි. ශ්‍රී ලංකික බලධාරීන් හා ඔවුන් ගේ නියෝග පිළිපදින්නන් විසින් ආණ්ඩු ප්‍රතිපත්ති අභියෝගයට ලක් කරන්නන්ට පහර දීම, අත් අඩංගුවට ගැනීම, බලහත්කාර ලෙස අතුරුදහන් කිරීම, එසේත් නැත්නම් ඝාතනය කිරීම කරනු ලබයි. යුද්ධ කාලීන ක්‍රියාවන් හී නෛතික හා දේශපාලන ප්‍රතිවිපාක මගහරිනු පිණිස, සත්‍යය හෙළිදරව් කිරීමට නැගී සිටින්නන් නිහඬ කිරීමේ ප්‍රයත්නයක් පවතී.

ශ්‍රී ලංකා ආණ්ඩුවත්, ද්‍රවිඩ ඊළාම් විමුක්ති කොටි සංවිධානයත් ( එල්. ටී. ටී. ඊ.) අතර පැවති ආයුධ සන්නද්ධ ගැටුමේ දී, දෙපාර්ශවය විසින්ම වරදින් නිදෙස් වීමට ආවරණය වී, අන්තර් ජාතික මානව හිමිකම් හා අන්තර් ජාතික මානවීය නීතිය හිතුවක්කාර ලෙසත්, මහා පරිමාණයෙනුත් උල්ලංඝණය කරන ලදි. ශ්‍රී ලංකා රජයේ හමුද විසින් එල්. ටී. ටී. ඊ. ය පරාජය කළ, 2009 මැයි මාසය වන විට එනම් ගැටුමේ අවසාන අදියරේ දී, ආණ්ඩුවේ හමුද මෙන්ම එල් ටී ටී ඊ ය අතින් ද යුද්ධ අපරාධ මෙන්ම මානව සංහතියට එරෙහි ගණයට වැටෙන අපරාධ සිදු කළ බවට පිළි ගත හැකි සාක්ෂි තිබේ. ගැටුම් පැවති කාල පරිච්ඡේදය තුළ, දෙපාර්ශවයම සිය විවේචකයින් නිහඬ කිරීම පිණිස තර්ජනය මෙන්ම ප්‍රචණ්ඩත්වය ද පාවිච්චි කළෝය. එල්. ටී. ටී. ඊ. ය විසින් සිය පාලන ප්‍රදේශය තුල ජීවත් වූ වැසියන් දහස් ගණනකට මූලික සේවාවන් ලබා ගැනීමට හෝ අත්‍යාවශ්‍ය ආහාර පාන ලබා ගැනීමට පමණක් නොව, සිය පාලන ප්‍රදේශයෙන් බැහැර වීමේ අවසරය ප්‍රතික්ෂේප කර තිබුනී. තමන්ට පක්ෂපාත නොවූ තැනැත්තන් දෝහීන් වශයෙන් සලකා දඩ ගැසීම රඳවා තබා ගැනීම එසේත් නැත්තනම් ඝාතනය කිරීමට පසුබට නොවීය.[1] වර්ෂ ගණනාවක සිටම ආණ්ඩුවේ පිළිවෙත වූයේ තමන් යුද්ධ කරනු ලැබූ ආකාරයෙන්ම, විසම්මුතිය ද ප්‍රචණ්ඩත්වයෙන් මර්දනය කිරීමයි. මීට ගොදුරු වූ බොහෝ දෙනෙක් ශ්‍රී ලංකික හමුද අන්තර් ජාතික මානවීය නීතිය උල්ලංඝණය කිරීම සම්බන්ධයෙන් සිය විවේචන ඉදිරිපත් කළ තැනැත්තන්ය. විසම්මුතික වාදී මාධ්‍යවේදීන් ආරක්ෂක හමුදව විසින් මෙන්ම ආණ්ඩුවේ අනුග්‍රහය ලබන ආයුධ සන්නද්ධ කණ්ඩායම් විසින් ද අත්අඩංගුවට ගැනීම, තර්ජනය කිරීම එසේත් නැත්තනම් ඝාතනය කිරීම කරනු ලැබින. මේ සියල්ලෙහි අරමුණ වූයේ ආණ්ඩුව විසින් කරනු ලබන උල්ලංඝණය කිරීම් පිළිබඳ සාක්ෂිකරුවන්ට තර්ජනය කිරීම හා නිහඬ කිරීමයි.

ශ්‍රී ලංකාවේ සිදු වූ ආයුධ සන්නද්ධ ගැටුමෙහි එක් අහිතකර ප්‍රතිඵලයක් වූයේ ජාතික ආරක්ෂාව මුල් තැන ලා සැළකූ පාලන තන්ත්‍රයක් විසින් භාෂණයේ නිදහස[2] බරපතළ අපරාධයක් ලෙස නම් කිරීමත්, විසම්මුතිය රාජ දෝහි වීම හා සමාන ක්‍රියාවක් ලෙසට පිළි ගැනීමත්ය. ශ්‍රී ලංකාවේ නිලධාරීන් පැළැන්තිය හා රාජ්‍ය මාධ්‍ය විසින් ආණ්ඩුව විවේචනය කරන්නන් රාජ දෝහීන් ලෙස හංවඩු ගසන අතර එබඳු චෝදනා වලට ලක් වන තැනැත්තන්ට මරණීය තර්ජනය කිරීම හෝ ශාරීරික හානි කිරීම දක්නට ලැබේ[3]. ශ්‍රී ලංකාවේ අභයන්තර ප්‍රශ්න, අන්තර් ජාතික කරණය කිරීමේ චෝදනාව යටතේ, සාමාන්‍යයෙන් ශ්‍රී ලංකාවේ මානව හිමිකම් ප්‍රගතිය සමාලෝචනය කරනු ලබන අන්තර් ජාතික රැස්වීම් හා සමගාමීව විසම්මුතිකවාදී මාධ්‍යවේදීන්ට තර්ජනය කිරීම හා 'මඩ ගැසීමේ' ප්‍රචාරයන් ද ආරම්භ වෙයි. ඒ සමඟම බුද්ධි අංශ විසින් බිම් මට්ටමේ මානව හිමිකම් ක්‍රියාකාරීන් හඹා යාම ද ආරම්භ වෙයි[4].

ආණ්ඩුවේ ප්‍රතිපත්තිය හා භාවිතය වි  ඇත්තේ විසම්මුතිය, අධිකරණය ඇතුළු පුමුඛ රාජ්‍ය ආයතන වලින් පවා මුලින්පුටා දැමීමයි. එබඳු ආයතන හොඹවන තැනැත්තන් ඔවුන් දරන ධුර වලින් පවා පලවා හැරීමයි. 2013 ජනවාරි මාසයේ දි කාලයක පටන් විධායකයත් අධිකරණයත් අතර පැවති ගැටුම උච්චස්ථානයකට පත් කරමින්, අග විනිසුරුවරිය විසින් මානව හිමිකම් වින්දිතයින් ආරක්ෂා කරමින් ඔවුන්ට පක්ෂ තීන්දු කිහිපයක්ම දුන් අතර, රාජ්‍ය බලධාරින් ගේ මනදොළ සපුරන ව්‍යාපෘති යෝජනා කිහියක්ම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා විරෝධී බවට තීන්දු ද කරන ලද්දේය. ඊට ආණ්ඩුවේ ප්‍රතිචාරය වුයේ අගවිනිසුරුවරිය බහුතර පිරිසක ගේ විරෝධය මධ්‍යයේ වුවද,  දෝෂාභියෝග යෝජනාවක් මගින් සිය ධුරයෙන් ඉවත් කිරීමයි. (තුන්වන කොටස බලන්න) මෙම සංසිද්ධින් ගේ ප්‍රතිඵලය වුයේ විසම්මුතික වාදි නිතිවේදීන් හා ඉතා පුළුල් පරාසරයක් නියෝජනය කරන බිම් මට්ටමේ මානව හිමිකම් ක්‍රියාකාරින් සිය ගණනක් රාජ්‍ය බුද්ධි අංශ වල විමසිල්ලට හසු විමයි. එසේත් නැත්නම් ඔවුන් සිය සංනිවේදනය පිණිස භාවිතා කරන වෙබ් අඩවි වාරණයට ලක් විමයි.

ආරම්භයේදී  ආයුධ සන්නද්ධ ගැටුමින් විපතට පත් වින්දිතයින්ට ආධාර උපකාර කළ මානවීය ආධාර සේවකයින් අතරින්;  සිය අත්දැකීම් පිළිබඳ තොරතුරු එකතු කළ තැනැත්තන්ට එරෙහිව ප්‍රචණ්ඩත්වය ක්‍රියාත්මක වු අතර, දැන් එය ඊට වඩා පුළුල් වපසරියක  ව්‍යාප්ත කොට තිබේ. කාන්තාවන් ගේ හා සුළු ජන කොටස් වල (ද්‍රවිඩ හා මුස්ලිම් ජන කොටස් ඇතුළුව) මානව අයිතිවාසිකම් ප්‍රවර්ධකයින්, සරසවි ශිෂ්‍යයන් හා කථිකාචාර්යවරුන්, පුජ්‍ය පක්ෂය, වෘත්තීය සමිති ක්‍රියාකාරින් ඇතුළු කම්කරු අයිතීන් ප්‍රවර්ධකයින්, විනිසුරුවරුන් හා නිතීවේදීන්, මාධ්‍යවේදින්, ශ්‍රී ලංකා ප්‍රතිපත්ති අධ්‍යයන කේෂ්ත්‍රයේ හා මානව හිමිකම් කේෂ්ත්‍රයේ ක්‍රියාකාරින් අඛණ්ඩවම බිය වැද්දීම, හෙළා දැකීම, පහර දීම හා ඝාතනය කිරීම්  වාර්තා වෙයි.

2012 එක්සත් ජාතීන් මානව හිමිකම් කවුන්සිලය විසින් ශ්‍රී ලංකාවට අන්තර් ජාතික නිතීය යටතේ වරදක් වන චෝදනා සම්බන්ධයෙන් වගවිම ඉල්ලා සිටින 19/2 යෝජනාව සාකච්ඡා කළ වකවානුවේදී  දී හා එම යෝජනාව සම්මත කළ අවස්ථාවේ  දී විසම්මුතිකවාදීන් මත එල්ල කළ පීඩනය වඩාත් තීව්‍ර වීය.[5] එක්සත් ජාතින් ගේ මානව හිමිකම් කමිටුවේ මෙම සැසිවාරයට සහභාගි වු නියෝජිතයින්ට හා එම සැසිවාරය ආවරණය කළ මාධ්‍යවේදීන්ට ආණ්ඩුවේ මාධ්‍ය විසින් නොකඩවා පහර එල්ල කළ අතර අවස්ථාවක් ලද විට ශාරිරිකව ද පහර දිමට පසුබට නොවිය[6]. මීටත් වඩා අධි තීව්‍රතාවයකින් යුක්ත පීඩනයක් 2013 මාර්තු 21 දින එක්සත් ජාතීන් ගේ මානව හිමිකම් කමිටුවේ 22 වන සැසිවාරයේ දි 22/1 යෝජනාව සම්මත කිරිමට  සමගාමීව ශ්‍රී ලංකික විසම්මුතිකවාදින්ට අත් දකින්නට  සිදුවිය[7]. අන්තර් ජාතික උද්දේශනය ( advocacy) පිළිබඳ පළපුරුද්දක් ඇති මානව හිමිකම් ක්‍රියාකාරින්  පහත් කොට සැලකිමට මෙන්ම දූෂමාන ආරංචි පැතිර විම හා අවලාද නැගීම් වලට ඉලක්ක විය. 2013 ජනවාරි 21 දින ප්‍රකාශයක් නිකුත් කළ ශ්‍රී ලංකා විකල්ප ප්‍රතිපත්ති අධ්‍යයන කේන්ද්‍රය " තම සංවිධානයේ ජ්‍යෙෂ්ඨ සාමාජිකයෙකුට විරුද්ධව අන්තර් ජාලය ඔස්සේ මෙන්ම මුද්‍රිත හා ගුවන් විදුලි හා රූපවාහිනි මාධ්‍යයන් ඔස්සේ ඉතාමත් නින්ද සහගත ප්‍රචාරයක් දියත් කොට තිබෙන බව" පෙන්වා දෙමින් එය හෙළා දකින ලද්දේය.[8]

ශ්‍රී ලංකාවේ සිදු වු ආයුධ සන්නද්ධ ගැටුමෙහි කේන්ද්‍රස්ථානය වුයේත්, බහුතරයක් ද්‍රවිඩ ජනතාව ඒක රාශී වි වාසය කරන්නේත්  උතුරු හා නැගෙනහිර පළාතෙහිය. මෙම පළාත් දෙකෙහිම බිම් මට්ටමෙහි මානව හිමිකම් ආරක්ෂකයින් ගේ ඉතා සුළු පරිමාණයේ මැදිහත් විමක් පවා පොලිසිය විසින් නිරික්ෂණයට ලක් කරයි. ඔවුන් ගේ ක්‍රියාකාරකම්, අන්තර් ජාතික සම්බන්ධතා හා ආධාර සපයන සංවිධාන  පිළිබඳව නැවත නැවතත් ප්‍රශ්න කරයි. මෙම නව ආරක මර්දනයෙහි වින්දිතයින් අන්තර් ජාතික මට්ටමෙහි උද්දේශනය පිළිබඳ පළපුරුද්දක් ඇති ප්‍රමුඛ පෙළේ මානව හිමිකම් ක්‍රියාධරයන් නොවන අතර, වින්දිතයින් සියළු දෙනාම පාහේ  බිම් මට්ටමේ අත්දැකිම් අඩු, ස්වේඡා මානව හිමිකම් ක්‍රියාකාරින්  වෙයි. ඔවුන් ගේ අරමුණ නිමා වු ආයුධ සන්නද්ධ ගැටුමෙන් පසු නැවත සිය ජිවිතය ගොඩ නගා ගන්නට වෑර දරන ජනතාව සමඟ උරෙන් උර ගැටි ක්‍රියා කිරිමයි.

මෙම සන්දර්භය තුළ වඩාත්ම පිඩාවට පත් වන්නේ මාධ්‍යවේදීන් හා මාධ්‍ය ආයතන වන අතර සිය විවේනාත්මක වාර්තාකරණය නිසා ඔවුහු බිය ගැන්විම්, තර්ජනය කිරිම් හා පහර දීම් වලට ගොදුරු වෙයි. 2001 සිට මේ දක්වා මාධ්‍යවේදීන් විසිපස් දෙකෙුට ආසන්න සංඛ්‍යාවක් මෙරටින් පළා ගොස් ඇති අතර 2006 සිට අඩු තරමින් මාධ්‍යවේදීන් පහළොස් දෙනෙකු ඝාතනය ලක් වි තිබේ. ඉන් නව දෙනෙකු ඝාතනය කරන ලද්දේ ඍජුවම ඔවුන් ගේ මාධ්‍ය වාර්තාකරණය නිසා යැයි ජන මාධ්‍යවේදි

සංගම් වාර්තා කළේය.[9] එල් ටි ටි ඊ යට පක්ෂපාත ස්ථාවරයක පිහිටා ක්‍රියා කරන ටැමිල් නෙට් වෙබ් අඩවිය 2007 සිට මේ දක්වාම ශ්‍රී ලංකාව තුළ වාරණය කොට තිබේ. 2011 දී ශ්‍රී ලංකා ආණ්ඩුව, බලධාරින් විවේනය කරන තවත් වෙබ් අඩවි පහක් වාරණයට ලක් කරන ලද්දේය[10].

ඇම්නස්ටි ඉන්ටර්නැෂනල් සංවිධානයට වාර්තා වූ පරිදි, ආණ්ඩුව විවේචනය කරන ලිපි වාර්තා කාටුන් යනාදිය පළ කරන මාධ්‍යයන් 'විසංගතයක්' වන පරිදි නොකඩවාම අන්තර් ජාල පහසුකම් අවහිර කරන ලද්දේය. එම මාධ්‍ය කාර්යාල පොලිසිය විසින් නිතර වටලනු ලැබූ අතර ඇතැම් මාධ්‍ය කාර්යාල හඳුනා නොගත් කඩකප්පල්කාරීන් විසින් ගිනිබත් කරනු ලැබීන. මාධ්‍ය කාර්යාල කාර්ය මණ්ඩල සාමාජිකයින්ට පහර දීම හා අත්අඩංගුවට ගැනීම සිදු විය. වෙනත් විකල්පයක් නොමැති තැන, මෙම මාධ්‍යවේදීන් වෙනත් රටවල පදිංචි වීම පිණිස ශ්‍රී ලංකාවෙන් පළා ගියෝය. රජයේ ඉහත කී පියවරයන් ගෙන් මාධ්‍යවේදීන් නිශ්ශබ්ද නොවූ කළ, බලධාරීන්ට පිළිගත නොහැකි අන්තර්ගතයන් අඩංගු වෙබ් අඩවි ඇතුළු මාධ්‍ය ආයතන වසා දැමීමේ අරමුණින් නව රෙගුලාසි හඳුන්වා දෙන ලදී.[11]

උතුරු නැගෙනහිර ආයුධ සන්නද්ධ ගැටුමට පෙරත්, පසුවත් නිල පුවත් වාරණය බහුල ව සිදු විය. නමුත් වසර ගණනාවක මාධ්‍ය මර්දනයේ ප්‍රතිඵලයක් වශයෙන් බොහෝ මාධ්‍යවේදීන් ස්වයං වාරණය තෝරා ගත් බව පෙනින. බි. බි. සි. ලෝක පුවත් සේවයේ ස්වාමි නටරාජන්, මෙම විෂය පිළිබඳ කළ අධ්‍යයනයකදී, ඇතැම් ස්ථානයන් වලට මෙන්ම තොරතුරු වලට ද මාධ්‍යවේදීන්ට ප්‍රවේශ විමට අවසර නොදීම හේතු කොට ගෙන, ඇතැම් සිද්ධීන් වාර්තා නොවූ බව පෙන්වා දෙයි. මෙම අධ්‍යයනයේ දී, ශ්‍රී ලංකික මාධ්‍යවේදීන් විසි දෙනෙකු හා කළ සම්මුඛ සාකච්ඡා කළ අතර, ඉන් දෙළොස් දෙනෙකුම යුද්ධය නිමා විමෙන් පසුවත් තමන් ගේ ආරක්ෂාව වර්ධනය නොවූ බව ප්‍රකාශ කොට තිබුනි.[12]

විරුද්ධ පාක්ෂික දේශපාලන ක්‍රියාකාරීන් මෙන්ම, එතරම් ප්‍රසිද්ධියක් නොමැති බිම් මට්ටමේ සංවිධාන කටයුතු වල නියුතු ප්‍රජා නායකයින් ද බොහෝ විට තර්ජන, බිය වැද්දීම, පහර දීම, අත් අඩංගුවට ගැනීම, ආරක්ෂක අංශ විසින් නොකඩවා ප්‍රශ්න කිරිම හෝ බලහත්කාර අතුරුදහන් විම් වලට ගොදුරු වෙයි.[13] මෙම සිදුවීම් පිළිබඳව කිසිදු විමර්ශනයක් හෝ සැකකටයුතු තැනැත්තන් අත්අඩංගුවට ගැනිමක් හෝ සිදු නොවන අතර වගකිව යුත්තන් වරදින් නිදෙස් වෙයි.

ආරක්ෂක අංශයේ ජොෂ්ඨ නිලධාරීන් විසින් යුද්ධයේ අවසාන අදියරේ දී ජාත්‍යයන්තර නීතිය යටතේ අපරාධයක් සිදු කරන ලද බවට ප්‍රමාණවත් සාක්ෂි මතුවිමත් සමඟම අන්තර් ජාතිකව ශ්‍රී ලංකාවේ මානව හිමිකම් ප්‍රගතිය පිළිබඳ විවේචන වඩාත් උග්‍ර විය[14].

මේ අතර 2011 සිටම ශ්‍රී ලංකාව තුළ නිල බලය අයුතු ලෙස පරිහරණය කිරිම, ඉහළ නගින ජීවන වියදම උතුරු හා නැගෙනහිර ද්‍රවිඩ ජනතාව ජිවත් වන ඇතැම් පළාත් මිලිටරිකරණය කිරිම සම්බන්ධයෙන් සැලකිය යුතු ජනතා විරෝධයක් පැන නැගුනි.[15] යුද්ධය නිමා වි සිව් වසරක් ගෙවි ගියත්, ප්‍රතිසංස්කරණ ඉල්ලා සිදු කරනු ලබන මහජන උද්ඝෝෂණ පැන නැගී ඇති අතර එම උද්ඝෝෂණ වලට නායකත්වය හා සහයෝගය දෙන තැනැත්තන් තවදුරටත් මර්දනය කරනු ලබයි.

දශක කිහිපයක සිටම ශ්‍රී ලංකාවේ බලධාරින් සිය දෙස් දක්වන්නන් ජාතික ආරක්ෂාවට මුවා වි බලහත්කාරයෙන් මර්දනය කරනු ලැබිම නිසා අන්තර් ජාතික වශයෙන් ශ්‍රී ලංකාවට සිය මානව හිමිකම් වාර්තාව ආරක්ෂා කරගැනිම අභියෝගයක් වෙයි. ශ්‍රී ලංකා බලධාරීන් කිසිම විටෙක තමන් විසම්මුතිය මර්දනය කරන බව පිළි නොගන්නවා පමණක් නොව සිය ආරක්ෂක හමුද විසින් මානව හිමිකම් මෙන්ම අන්තර් ජාතික නීතිය ද උල්ලංඝණය කළ බව ප්‍රතික්ෂේප කරයි. ඇම්නස්ටි ඉන්ටර්නැෂනල් සංවිධානය මෙම ප්‍රතික්ෂේප කිරීම් හි අවසානයක් දැකිය යුතු බව පිළි ගනී. ශ්‍රී ලංකික මෙන්ම අන්තර් ජාතික ප්‍රජාව ද මානව හිමිකම් ආරක්ෂකයින් මෙන්ම විසම්මුති වාදීන් ද ආරක්ෂා කළ යුතු අතර යුද්ධ සමයේ සිදු වූ යුද්ධ අපරාධ පිළිබඳ වගවීම ද අවසාන වශයෙන් යටපත් කළ නොහැකි බව ද කවර ශ්‍රී ලංකික ආණ්ඩුවක් වුවද ඒත්තු ගත යුතුය.

ඇම්නස්ටි ඉන්ටර්නැෂනල් සංවිධානය, නොකඩවාම මාධ්‍යවේදීන්ට, නීතිවේදීන්ට, මානව හිමිකම් ආරක්ෂකයින්ට, සිවිල් සමාජ ක්‍රියාකාරීන්ට ඇතුළු සිය භාෂණයේ අයිතිය භුක්ති විඳින සියළුම තැනැත්තන්ට පහර දීම වහාම නතර කරන මෙන් ද, එබඳු සිද්ධීන් පිළිබඳ පැමිණිලි සැකකරුගේ

හෝ පැමිණිලිකරු ගේ තරා තිරම නොබලා වහාම විමර්ශනය කරන මෙන් ද ශ්‍රී ලංකා ආණ්ඩුවෙන් ඉල්ලා සිටියි.

2013 සැප්තැම්බර් මස එක්සත් ජාතීන් ගේ මානව හිමිකම් කවුන්සිල හා 2013 නොවැම්බර් මස පැවැත්විමට නියමිත පොදු රාජ්‍ය මණ්ඩලීය නායක සමුළු රැස්වීම් වලදී ශ්‍රී ලංකාව ආණ්ඩුවට අන්තර් ජාතික මානව හිමිකම් හා මානවීය නිතීය යටතේ එල්ල කර තිබෙන චෝදනා සම්බන්ධයෙන් වගවීම ප්‍රකාශ කරන මෙන් ශ්‍රී ලංකාණ්ඩුවට බල කරන ඇම්නස්ටි ඉන්ටර්නැෂනල් සංවිධානය එම ජාත්‍යයන්තර සංවිධාන වලින් තරයේම ඉල්ලා සිටියි. අන්තර් ජාතික මට්ටමේ ස්වාධීන මෙන්ම අපක්ෂපාත පරික්ෂණයක් නොපමාව ආරම්භ කිරිමට 2011 එක්සත් ජාතීන් ගේ මහ ලේකම් විසින් පත් කළ විද්වත් කමිටු වාර්තාවේ නිර්දේශ මනා ආරම්භයක් ලබා දෙයි.[16] සෑම විමර්ශනයක් ම අන්තර් ජාතික ප්‍රමිතීන්ට අනුව සාධාරණ හා අපක්ෂපාත ලෙස පැවැත්විය යුතු බවද ඇම්නස්ටි ඉන්ටර්නැෂනල් සංවිධානය අවධාරණය කරයි.

## අධ්‍යයන ක්‍රමවේදයඃ

මෙම වාර්තාව මුලික වශයෙන්ම සාක්ෂිකරුවන්, නීතිවේදීන් හා ක්‍රියාකාරීන් සමඟ පවත්වන ලද සම්මුඛ සාකච්ඡා පදනම් කොට ගෙන සකස් කරන ලද අතර, දිවුරුම් ප්‍රකාශ, අධිකරණ වාර්තා හා ශ්‍රී ලංකාවේ මෙන්ම එක්සත් ජාතීන් ගේ මානව හිමිකම් සංවිධාන සහ කමිටු සහ අන්තර් ජාතික මාධ්‍ය වාර්තා තවදුරටත් පරිශීලනය කළේය.

දැඩිව විසම්මුතිකවාදීන් මර්දනය කිරීම හා මානව හිමිකම් නියාමකයන්ට දක්වන විරෝධය ද, හේතු කොට ගෙන ජගත් මානව හිමිකම් සංවිධාන වලට ශ්‍රී ලංකාවේ මානව හිමිකම් වින්දිතයන් කරා ප්‍රවේශ විම ඉතාමත් අසිරු කටයුත්තක් වන අතර, එකී වින්දිතයින්ට අන්තර් ජාතික සංවිධාන සමඟ තොරතුරු හුවමාරු කර ගැනිම ද කළ නොහැකි කාර්යක් බවට පත් වි තිබේ. ශ්‍රී ලංකාවේ උතුරු හා නැගෙනහිර පළාත් වල මානව හිමිකම් ක්‍රියාකාරීන් ජාතික හෝ අන්තර් ජාතික වශයෙන් ප්‍රබලව අවධානයට ලක් නොවිමත්, මෙම ප්‍රදේශ වල ක්‍රියාකාරීන් නිරන්තරයෙන්ම බිය වැද්දීම් වලට ලක් විමත් නිසා බහුලව වාර්තා වේ. මේ නිසා ඉහත කී පළාත් වල මානව හිමිකම් ක්‍රියාකාරීහු දිවයිනේ අනෙකුත් පළාත් වලට වඩා වැඩි අනතුරකට මුහුණ දී සිටිති. පළි ගැනීමට ලක් වේ යැයි අනුමාන කරන සිද්ධීන් සම්බන්ධයෙන් අනන්‍යතාවය හා එම සිද්ධීන් පිළිබඳ තොරතුරු ලබා ගත් ආකාරය ඇම්නස්ටි ඉන්ටර්නැෂනල් සංවිධානය විසින් හෙළිදරව් නොකරයි.

මෙම වාර්තාව විසම්මුතිකවාදීන් මර්දනය කිරිමේ විෂය පිළිබඳව ජාතික හා ජාත්‍යයන්තර සංවිධානය හා විවිධ පර්යේෂකයින් විසින් පළ කොට ඇති ප්‍රකාශනයන්ට උපාංපූරකයක් ද වෙයි. එම ප්‍රකාශන අතර නෙට්වර්කින් ෆෝ රයිට්ස් ඉන් ශ්‍රී ලංකා, ඉන්ෆෝම් තොරතුරු මධ්‍යස්ථානය, නිදහස් මාධ්‍ය ව්‍යාපාරය[17], කොමිටු ටු ෆෝට්‍රෙක් ජනර්ලිස්ට්, හියුමන් රයිට් වොච්, ඉන්ටර්නැෂනල් කොමිෂන් ඔෆ් ජුරිස්ට්, ඉන්ටර් නැෂනල් ෆිරිඩම් ඔෆ් එක්ස්ප්‍රෂන් එක්ස්චේන්ජ් හා ඉන්ටර්නැෂනල් ක්‍රයිසිස් ගෲෆ් යන සංවිධාන විසින් පළ කළ ප්‍රකාශන ද ඇතුලත්ය[18]

## ශ්‍රී ලංකාවේ භාෂණයේ නිදහස, ප්‍රකාශනය ඇතුළුව අදහස් පළ කිරිමේ නිදහස, සාමකාමීව රැස්විමේ නිදහස හා සමාගමයේ නිදහසඃ

අන්තර් ජාතික මානව හිමිකම් නීතිය සෑම තැනැත්තෙකුටම භාෂණයේ නිදහසට හා ප්‍රකාශනය ඇතුළුව අදහස් පළ කිරීමේ නිදහසට හා සාමකාමිව රැස්විමේ නිදහස හා සමාගමයේ නිදහසට ඇති අයිතිය සහතික කරයි. මෙම අයිතිවාසිකම් 1948 එක්සත් ජාතීන් ගේ මහා මණ්ඩලය විසින් සම්මත කළ මානව අයිතිවාසිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනයේ පැහැදිලිව දක්වා ඇති අතර, 1980 දී ශ්‍රී ලංකාව සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ අන්තර් ජාතික ප්‍රඥාප්තිය පිළි ගත් නිසාත් මෙම ගිවිසුම් වලින් දක්වා ඇති අයිතීන් සහතික කිරිමේ නිතිය්‍යානුකූල බැඳීමක් හා වගකිමක් ශ්‍රී ලංකා රජය සතු වෙයි. පොදු රාජ්‍ය මණ්ඩලයේ සාමාජිකයෙක් වශයෙන් ද ශ්‍රී ලංකාව එක්සත් ජාතීන් ගේ මානව අයිතිවාසිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශණය සම්පූර්ණයෙන් ම ක්‍රියාත්මක කිරිමට බැඳී සිටියි.[19]

මානව අයිතිවාසිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනයේ 19 වන වගන්තියට අනුව ( මෙම පරිවර්තනයෙහි අන්තර්ජාතික මානව අයිතිවාසිකම් පනතෙහි වගන්ති උපුටා ගැනීම, මානව හිමිකම් පිළිබඳ විශ්ව

ප්‍රකාශනයේ 50 වැනි සංවත්සරය ( 1945-1998) නිමිත්තෙන් කොළඹ එක්සත් ජාතීන්ගේ ප්‍රවෘත්ති කේන්ද්‍රය විසින් ප්‍රකාශයට පත් කරන ලද අන්තර්ජාතික මානව අයිතිවාසිකම් පනත නම් වු ප්‍රකාශණයෙනි.) "තම නිදහස් මතය දැරීමට හා ප්‍රකාශ කිරීමට සෑම පුද්ගලයකුටම අයිතිය ඇත." මෙම අයිතියට "අනුන්ගේ බාධාවක් නොමැතිව තම මත දැරීමටත් දේශ සීමා නොසලකා කවර මාධ්‍යයකින් හෝ තොරතුරු ලැබීමට හා දීමටත් ඇති අයිතිය" ද ඇතුලත්ය.

තොරතුරු හා අදහස් ලබා ගැනීමටත්, සිය මතය ප්‍රකාශ කිරීමට හා සංනිවේදනය කිරීමටත් ඇති අයිතිය, භාෂණයේ නිදහසට ඇති අයිතිය යන්නෙන් අදහස් කරයි. සාමාජීක රාජ්‍යයන් විසින් සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ අන්තර් ජාතික සම්මුතිය ක්‍රියාත්මක කරන ආකාරය නියාමනය කරන එක්සත් ජාතීන් ගේ මානව හිමිකම් කවුන්සිලය මහජන වැදගත් ඇති ප්‍රශ්න මෙන්ම දේශපාලන ප්‍රශ්න පිළිබඳව තොරතුරු හා අදහස් හුවමාරු කිරීම පිළිබඳ නිදහස් සංනිවේදනය වැදගත් වන අතර එම අර්ථයෙන් නිදහස් මාධ්‍ය හා වෙනත් මාධ්‍යයන්ට මහජන ප්‍රශ්න පිළිබඳව වාරණයකින් හා බාධාවකින් තොරව සංනිවේදනය කිරීමට ඇති අයිතිය ප්‍රකාශවන බව සඳහන් කරයි[20]

අන්තර් ජාතික මානව අයිතිවාසිකම් පනතෙහි 20 වන වගන්තිය " (1) සාමකාමීව එක්රැස්වීමේ හා සංගම් පැවැත්වීමේ අයිතිය සෑම පුද්ගලයකු ම සතුව ඇති බවත්, සමිති සමාගම්වලට බැඳීමට කිසිවකුට බලකළ නොහැකි බවත් ප්‍රකාශ කරයි. මෙම අයිතිවාසිකම් සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ අන්තර්ජාතික සම්මුතියෙහි 21 වන වගන්තිය මඟින් තවදුරටත් සහතික කොට තිබෙන අතර එම සම්මුතියෙහි 22 වන වගන්තිය " සිය අයිතිවාසිකම් යනාදිය ආරක්ෂා කර ගැනීම සඳහා වෘත්තීය සංගම් පිහිටුවා ගැනීමටත්, ඒවාට බැඳීමටත් තිබෙන අයිතිය ඇතුළුව සෑම කෙනෙකුටම අනිකුත් අය සමග සමාගමය සඳහා අයිතිය" තිබෙන බව ප්‍රකාශ කරයි. සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් ප්‍රකාශනයේ අඩංගු වගන්ති වලට අනුව රාජ්‍ය මෙම අයිතිවාසිකම් භුක්ති විඳීම යම්කිසි ආකාරයකින් සීමා කරන්නේ නම් එකී සීමාවන් පහත දැක්වෙන මිනුම් දඬු සපුරා තිබිය යුතුය.

1- එකී සීමා කිරීම් නිතීය මඟින් පැනවිය යුතුය. ඉන් අදහස් කරන්නේ නිතීය යම් පුද්ගලයෙකු ගේ නිදහස සීමා කරන්නේ නම් එය ඉතාමත් පැහැදිලිව දක්වා තිබිය යුතු අතර පුරවැසියන්ට එක හා සමානව එම නිතී රැකවරණය ලැබීමට හිමිකම් තිබිය යුතුය.
2- සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පනතෙහි දක්වා තිබෙන ආකාරයට ජාතික ආරක්ෂාව, මහජන ආරක්ෂාව, මහජන සාමය සඳහා හෝ මහජන සෞඛ්‍ය හෝ සදචාරය ආරක්ෂා කිරිම සඳහා හෝ අනෙකුත් අයගේ අයිතිවාසිකම් හා බහුවිධ නිදහස ආරක්ෂා කිරීම සඳහා හෝ ප්‍රජාතන්ත්‍රීය සමාජයක අවශ්‍ය වන්නා වු සීමා කිරීම් හැර ඉහත කී අයිතිවාසිකම් ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් වෙනත් කිසිම සීමා කිරීමක් නොපැනවිය යුතු විම.
3- ඉහත කි වගන්තියේ සඳහන් සමාගම් පැවැත්වීමේ නිදහස හා සංවිධානය විමට ඇති අයිතිය ආරක්ෂා කිරීම පිණිස එම සම්මුතියේ රාජ්‍ය පාර්ශවකරුවන්ට එම සම්මුතියේ විධිවිධාන සලසා ඇති සහතිකවීම් වලට අගති සහගත වු නෛතික පියවර ගැනීමට හෝ ඒවාට අගති සහගත වන ආකාරයකට නිතීය අදළ කිරීමට බලය නොලැබිය යුතුය[21].

මේ අනුව අන්තර්ජාතික මානව හිමිකම් නිතීය යටතේ, ආණ්ඩුවකට සිය ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරිමට බාධා වන්නේ යැයි චෝදනා කරමින් භාෂණයේ නිදහස හා තොරතුරු හුවමාරුවට ඇති අයිතිය සීමා කිරීමට නොපුළුවන. විශේෂයෙන්ම ජාතික ආරක්ෂාව නැමති ලේබලයට මුවා වි ඉහත කි අයිතීන් සීමා කිරීම කිසිසේත්ම වලංගු නොවේ.

යම්කිසි රටක පුරවැසියන් ගේ ජීවිතවලට තර්ජනයක් ඇති වි තිබෙන අවස්ථාවක එසේත් නැත්නම් නිල වශයෙන් මහජන හදිසි අවස්ථාවක් හෝ යුද්ධයක් ප්‍රකාශයට පත් කොට ඇති අවස්ථාවක රාජ්‍යයකට අන්තර්ජාතික මානව හිමිකම් ප්‍රඥාප්තීන්ට ඇති බැඳීම තාවකාලිකව අත්හරිමින් වෙනත් නිතී රිතී එම අවස්ථාවට අනුකූලව යොදා ගත හැකිය. මෙය සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ අන්තර්ජාතික සම්මුතියෙහි 4 වන වගන්තියෙන් ප්‍රකාශයට පත් කොට ඇත. එහෙත් එම වගන්තියෙන් "එම වැඩ පිළිවෙලවල් ජාත්‍යන්තර නීතිය යටතේ සිය වෙනත් වගකීම් හා නොගැලපෙන ඒවා නොවිය යුතු අතර, හුදෙක් වර්ගය, වර්ණය, ස්ත්‍රී පුරුෂභාවය, භාෂාව, ආගම හෝ සමාජ සම්භවය හේතු කොට කරන්නක් නොවිය යුතුය" යනුවෙන් ඉතාමත් පැහැදිලිවම ප්‍රකාශ

කොට තිබේ. එපමණක් නොව "සෑම මනුෂ්‍යයකුටම ජීවිතය කෙරෙහි නෛසර්ගික අයිතියක් ඇති බවත්, කිසිම පුද්ගලයකු වධ හිංසාවකට හෝ කෲර අමානුෂික හෝ පහත් සැලකීමට හෝ දඬුවමකට හෝ භාජනය නොකළ යුතු බවත්, හුදෙක් ගිවිසුම්ගත වගකීමක් ඉටු නොකිරීමට නොහැකිවීමේ හේතුව මත කිසිම කෙනකු බන්ධනාගාරගත නොකළ යුතු බවත්, වරදක් කරන අවස්ථාවෙහි දේශීය හෝ ජාත්‍යන්තර නීතිය යටතේ සාපරාධී වරදක් නොවූ කිසියම් ක්‍රියාවක් සම්බන්ධයෙන් කිසිම කෙනකු වරදකරු හැටියට තීරණය නොකළ යුතු බවත්, සිය නිදහස අහිමි කරනු ලැබූ සියළුම තැනැත්තන්ට මනුෂ්‍ය දයාවෙන් සහ මිනිසාට ස්වාභාවයෙන් හිමි අභිමානය පිළිබඳ ගෞරවයෙන් සැලකිය යුතු බවත් පිළි ගැනේ.[22]

සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ අන්තර්ජාතික සම්මුතියේ 2003 පවත්වන ලද හතර වන කාලීන ඇගයුමේ දි ශ්‍රී ලංකා වාර්තාව සම්බන්ධයෙන් සිය නිරීක්ෂණයන් ප්‍රකාශයට පත් කළ එක්සත් ජාතීන් ගේ මානව හිමිකම් කමිටුව "මාධ්‍යවේදීන්ට හිරිහැර කිරිම නතර කිරිමට ගනු ලබන පියවරක් වශයෙන්, මාධ්‍යවේදීන්ට හිරිහැර කිරිම පිළිබඳ ලැබී තිබෙන සියළුම පැමිණිලි ශ්‍රී ලංකා ආණ්ඩුව වහාම විභාග කළ යුතු බවත්, වැරදිකරුවන් වන තැනැත්තන්ට සාධාරණ නඩු විභාගයක් පැවැත්විය යුතු බවත්" ප්‍රකාශ කළේය.[23] සිය පස්වන වාර්තාව 2007 ඉදිරිපත් කිරිමට නියමිතව තිබූ නමුත් එම වාර්තාව ශ්‍රී ලංකාව විසින් ඉදිරිපත් කරන ලද්දේ 2012 ඔක්තෝබර් මාසයේදීය. එම වාර්තාවේ ද මාධ්‍ය ආයතන වලට හා මාධ්‍යකරුවන්ට හිරිහැර කිරිම සම්බන්ධයෙන් රජයේ ප්‍රකාශය වූයේ දැනට ලැබි ඇති පැමිණීලි වහාම විභාග කරන බවත් වර්තමාන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් සහතික කොට ඇති මූලික අයිතීන් මාධ්‍යකරුවන්ට භුක්ති විදිමට අවශ්‍ය වාතාවරණය සකස් කරන බවත්ය[24]නමුත් ශ්‍රී ලංකාවේ නීතිරිති අන්තර්ජාතික මානව හිමිකම් නීති හා ගැලපෙන ආකාරයට තවමත් සකස් වී නැත. 1978 ව්‍යවස්ථාවේ 14 වන වගන්තියෙන් භාෂණයේ හා පළ කිරිමේ නිදහස ඇතුළ ප්‍රකාශනයේ නිදහසත්, සාමකාමී ලෙස රැස්විමේ හා සමාගමයේ නිදහසත් සහතික කොට තිබේ. නමුත් එම ව්‍යවස්ථාවෙන් ම ඉහත කී අයිතීන් සීමා කොට තිබෙන අතර එම සීමාවන් ඉතා පුළුල් පරාසයක පැතීරි තිබෙනවා පමණක් නොව අන්තර්ජාතික මානව හිමිකම් නීතියේ පනවා ඇති සීමා වලින් ඔබ්බට ද ගමන් කරයි. උදහරණයක් වශයෙන් ශ්‍රී ලංකා ආණ්ඩුකම ව්‍යවස්ථාවේ දක්වා ඇති ඉහත කී අයිතීන් "වාර්ගික හා ආගමික එක්සත් භාවයට " හානියක් වන්නේ නම් සීමා කළ හැකි විම දැක්විය හැක. "භාෂණයේ නිදහස ද " පාර්ලිමේන්තු වරප්‍රසාද අධිකරණයට අගෞරව කිරිම හා අපහාස නීතිය" මඟින් සීමා කොට ඇත. සමාගමයේ නිදහස " ජාතික ආර්ථිකය ආරක්ෂා කිරිම" පිණිස සීමා කළ හැකිය[25]

තවද වර්තමාන ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සිතීමේ නිදහස හෘදය සාක්ෂියේ නිදහස සහ ආගමික නිදහස ( 10- වගන්තිය) , සම්බන්ධයෙන් මෙන්ම අත්තනෝමතිකව සිරභාරයට ගැනීම රඳවා තබා ගැනිම දඬුවම් කිරිමෙන් නිදහස සහ අතීතයට බලපාන දණ්ඩන නීති පැනවීම (13-1 වගන්තිය) සම්බන්ධ මූලික අයිතිවාසිකම් වශයෙන් දක්වා තිබුනත් මෙම මූලික අයිතිවාසිකම් භුක්ති විඳිය හැක්කේ ද ක්‍රියාත්මක විය හැක්කේ ද රාජ්‍ය ආරක්ෂාව තහවුරු කිරිම පිණිස නීතියෙන් නියම කරනු ලැබිය හැකි සීමා කිරිම් වලට පමණක් යටත්ව බව 15 ( 1) වගන්තියෙන් සඳහන් කරයි. 14 වන ව්‍යස්ථාවේ සඳහන් භාෂණයේ රැස්විමේ සමාගමයේ රැකියාවේ සහ යාම ඊම් යනාදියේ නිදහස භුක්ති විඳිය හැක්කේ ද ක්‍රියාත්මක විය හැක්කේ ද වාර්ගික හා ආගමික සහයෝගතාව තහවුරු කිරිම සඳහා හෝ පාර්ලිමේන්තු වරප්‍රසාද අධිකරණයට අපහාස කිරිම අපහාසය හෝ වරදකට පෙළඹවිම හා සම්බන්ධව නීතියෙන් නියම කරනු ලැබිය හැකි සීමා කිරිම් වලට යටත්වය.[26]

තවද, වර්තමාන ව්‍යවස්ථාව ඉහත කී මූලික අයිතිවාසිකම් සම්බන්ධයෙන් පනවන සුවිශේෂ සීමාවක් නම් " නීතිය යන්නට මහජන ආරක්ෂාව පිළිබඳ තත් කාලයේ ආදාළ වන නීතිය යටතේ සාදන ලද නියෝග ද ඇතුලත් වන බවයි"[27]. මෙම තත් කාලයේ බලපවත්වන නීති යන්නට ත්‍රස්තවාදය වැළැක්විමේ පනත ද ඇතුලත් වන අතර ඒ යටතේ පනවනු ලබන නීතිරිති මඟින් ද ඉහත කී මූලික අයිතිවාසිකම් තවදුරටත් සීමා කෙරේ.

2004 දී ශ්‍රේෂ්ඨාධිකරණය ප්‍රකාශයට පත් කරන ලද නඩු තින්දුවක්[28] හැර ශ්‍රී ලංකාවේ තොරතුරු දැන ගැනිමේ අයිතිය සහතික කරන නීති හෝ රෙගුලාසි දක්නට නොමැත.ඉහත කී නඩු තීන්දුව මගින් යම් පුරවැසියෙකුට රාජ්‍ය තොරතුරු ලබා ගැනිමට අවහිර කිරිම ඒ තැනැත්තා ගේ ව්‍යවස්ථානුකුල අයිතියක් පැහැර හැරීමක් ලෙසට එම නඩු තීන්දුව මගින් ප්‍රකාශ කරන ලදී.[29] තවද,

රාජ්‍ය ආයතන වෙත ඇති තොරතුරු මහජනයාට ලබා ගැනිමට ඇති අවසරය, භාෂණයේ හා ප්‍රකාශණයේ නිදසහ පිළිබඳ අයිතිය හා බැඳි පවතින බව එක්සත් ජාතීන් ගේ මානව හිමිකම් කවුන්සිලය විසින් අවධාරණය කරන අතර ආණ්ඩු තොරතුරු ලබා ගැනිමේ අයිතිය සහතික කරන අණ පණත් සම්මත කළ යුතු බව සඳහන් කරයි.[30]

2011 දී එක්සත් ජාතික පක්ෂය විසින් "තොරතුරු ලබා ගැනීමේ අයිතිය" පිළිබඳ පණත් කෙටුම්පතක් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ නමුත් ආණ්ඩු පක්ෂයේ බහුතර ජන්ද සංඛ්‍යාව විසින් එම යෝජනාව පරාජය කළේය. 2012 ජුලි මාසයේ දී, ජනමාධ්‍ය හා ප්‍රවෘත්ති අමාත්‍යංශයේ ලේකම් චරිත හේරත් මහතා සාක් සංවිධානයේ නියෝජිත සමූළුවක් අමතමින්, රජය ජාතික ආරක්ෂාව පිළිබඳ හේතූන් නිසා තොරතුරු දැන ගැනිමේ අයිතිය පිලිබඳ පණත් කෙටුම්පතක් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරිමට බලාපොරොත්තු නොවන බව කියා සිටියේය[31]

මෙම වාර්තාවෙන් පෙන්වා දි තිබෙන ආකාරයට ශ්‍රී ලංකාවේ භාෂණයේ හා ප්‍රකාශනයේ නිදහසට ඇති අයිතිය මෙන්ම සාමකාමීව රැස්වීමේ නිදහසට හා සමාගමයේ නිදහසට ඇති අයිතිය පිළිබඳව සිය ජාත්‍යයන්තර වගකිම් ඉටු කිරිමට අසමත් රාජ්‍යයක් බවට පත් වි තිබේ[32]. එම ඌනතාවය ව්‍යවස්ථානුකුල නිතියේ අඩුපාඩුකම් වල සිට දේශපාලන නායකත්වයේ තිබෙන නොසැලකිල්ල දක්වා ඉතා පුළුල් පරාසයක පැතිරි පවතී.[33]

## 2. යුද්ධයෙහි සාක්ෂිකරුවන් මුලින්පුටා දැමීම:

ශ්‍රී ලංකාවේ ආණ්ඩුවත් එල්. ටි. ටි. ඊ. සංවිධානයත් අතර උතුරු හා නැගෙනහිර වාර්ගික ද්‍රවිඩ ජනතාව සඳහා වෙනම රාජ්‍යයක් සඳහා ආයුධ සන්නද්ධ අරගලය ආරම්භ වුයේ 1983 දීය.
2002 දි ශ්‍රී ලංකා ආණ්ඩුවත් එල්. ටි. ටි. ඊ. සංවිධානයත් අතර සටන් විරාම ගිවිසුමක් අත්සන් කළ අතර, එම ගිවිසුම සිව් වසරක් පමණ ක්‍රියාත්මකව තිබුනි. 2006 වන විට දෙපාර්ශවය අතරම එදිරිවාදිකම් වර්ධනය වු අතර එය නිමාවකට පැමිණියේ 2009 මැයි මාසයේ එල්. ටි. ටි. ඊ. ය යුද්ධමය වශයෙන් ශ්‍රී ලංකා යුද්ධ හමුදව විසින් පරාජය කිරිමෙනී. මේ අතරතුර කාලයේ දී එනම් 2008 දී යුද්ධ කලාපය තුළ සහන සේවා කටයුතු ක්‍රියාත්මක කළ මානවීය ආධාර සංවිධාන යුද්ධ කලාපයෙන් ඉවත් කරන ලද්දේය. අද අන්තර්ජාතික ප්‍රජාව ගේ අවධානය යොමු වි ඇත්තේ, 2008 මානවීය ආධාර සංවිධාන යුද්ධ කලාපයෙන් ඉවත් කළ 2008 සැප්තැම්බර් මස සිට යුද්ධය අවසාන වු 2009 මැයි මාසය තෙක් මෙම කලාපය තුල අන්තර්ජාතික නිතියට අනුව දෙපාර්ශවය විසින්ම සිදු කළ අපරාධ සම්බන්ධයෙනි. යුද්ධය ආරම්භයේ සිටම ශ්‍රී ලංකා ආරක්ෂක හමුදව හා එල්. ටි. ටි. ඊ. ය ඇතුළු ආයුධ සන්නද්ධ කණ්ඩායම් විසින් හිතුමතයේ මානව අයිතීන් උල්ලංඝණය කළ අතර, ඉන් විපතට පත් වුවන් දිගින් දිගටම ඒ සම්බන්ධයෙන් පළමුව දේශිය යුක්තිය පසඳලිමේ ආයතන වලටත් පසුව අන්තර්ජාතක ආයතන වලටත් පැමිණිලි කළෝය. මෙම පැමිණිලි සනාථ කරන සාක්ෂිකරුවන් ඉදිරිපත් විම වැළැක්විම පිණිස සුළු පරිමාණයේ ලා සැලකිය හැකි අඩන්තේට්ටම් කිරිම තර්ජනය කිරිම බිය වැද්දීම වැනි ක්‍රියා දෙපාර්ශවය විසින්ම කරන ලදි. ක්‍රමයෙන් යුද්ධයේ ත්‍රීව්‍රතාවය උත්සන්න වෙත්ම, ඒ සම්බන්ධයෙන් දේශීය සිවිල් සමාජය හා අන්තර්ජාතික ප්‍රජාව සිය අවධානය යොමු කළේය. ඔවුන් ගෙන් මානව හිමිකම් උල්ලංඝණය විම් පිළිබඳ සාක්ෂිකරුවන් වසන් කර තැබිම පිණිස දෙපාර්ශවයම වඩාත් සංවිධානාත්මක පියවරයන් පසු කාලයේ ගනු ලැබීය.

2005 නොවැම්බර් මස මහින්ද රාජපක්ෂ ජනාධිපති ධුරය සඳහා තෝරා පත් කර ගන්නා ලද්දේ යුද්ධය අවසාන කිරිම පිණිස ඔහු විසින් දෙන මැතිවරණ ප්‍රතිඥාව ඉටු කරනු පිණිසය. ඔහු එම කර්තව්‍ය ඉටු කරන ලද අතර එල්. ටි. ටි. ඊ. ය ඊට මුහුණ දෙන ලද්දේ ඒ සමානම ආයුධ සන්නද්ධ ප්‍රතිප්‍රහාරයක් එල්ල කිරිමට උත්සාහ දරමිනි. 2005 දෙසැම්බර් වන විට සටන් විරාම ගිවිසුම බිඳ වැටෙන්නට ආසන්නව තිබු අතර දෙපාර්ශවයම එකිනෙකාට එරෙහිව එදිරිවාදි කම් ආරම්භ කොට තිබුනි. 2005 දෙසැම්බර් මුල් සතියේ දී එල්. ටි. ටි. ඊ. ය ක්ලේමෝ බෝම්බයක් අටවා හමුද භටයින් 16 දෙනෙකු ඝාතනය කළේය.[34]
එල්. ටි. ටි. ඊ.ය තවදුරටත් සිය විරුද්ධවාදීන් ඝාතනය කිරිම නොකඩවා කර ගෙන ගියේය.[35]
මෙහි ප්‍රතිඵලය වුයේ දෙපාර්ශවය විසින්ම සිවිල් ජනතාවටත්, රජයට හා එල්.ටි. ටි. ඊ.යට භාර වු තැනැත්තන් ගේ මුලික අයිතීන්, යුද්ධ අපරාධ හා මානව සංහතියට එරෙහිව කරන ලද අපරාද ගණයේ ලා සැලකිය හැකි පරිදි අමු අමුවේම උල්ලංඝණය කරමිනි. ආරක්ෂක හමුදව ධෛර්‍යමත්

කිරිම හා යුද්ධයට ආවැඩිමේ ප්‍රචාරක කටයුතු වලට සමාන්තරව යුද්ධය පැවති ප්‍රදේශ වලට පුවත් පත් වාර්තා කරුවන්ට හා ආධාර සේවකයින්ට ප්‍රවේශ විම තහනම් කරන ලදී.

## ත්‍රිමලයේ සිසුන් පස් දෙනා ගේ ඝාතනය:

2006 ජනවාරි 2 වන දින ත්‍රිකුණාමල වෙරලෙහි සිටි ද්‍රවිඩ ජාතික ශිෂ්‍යයන් පස් දෙනෙකු ( මනෝහරන් රගිහාර් (20) යෝගරාජා හේමචන්ද්‍ර (20) ලෝගිතරාජා රෝහණ (20) තංගතුරෙයි සිවනාථා (20) ෂන්මුගරාජා ගජේන්ද්‍ර (20) ) වෙත මහා මාර්ගයේ ගමන් කරමින් සිටි ත්‍රි රෝද රථයක සිට විසි කරන ලද අත් බෝම්බයක් නිසා මරණයට පත් විය. මෙම සිද්ධියෙන් දිවි ගලවා ගත් එක් තරුණයෙක් ඝාතනය එස්. ටි. එෆ්.[36] විසින් සිදු කරන ලද බව කියා සිටියේය. ආරම්භයේ දී එස් ටි එෆ් ප්‍රකාශයෙක් කියා සිටියේ සිසුන් විසින් රැගෙන විත් තිබු අත් බෝම්බයක් පුපුරා යාමෙන් මෙම මරණ සිදු වු බවයි. එහෙත් ඡායාරූප සාක්ෂි හා පශ්චාත් මරණ පරික්ෂණ වාර්තා අනුව මෙම සිසුන් මිය ගියේ වෙඩි පහර වලින් බව සනාථ විය.[37] මෙම මිනිමැරුම පිළිබඳ තොරතුරු ප්‍රලේඛනය කළ සුබ්‍රමානියම් සුගිත්හරරාජා 2006 ජනවාරි 24 දින නාඳුනන තුවක්කුකරුවෙකු වෙඩි පහරකින් ඝාතනය විය.[38]

වින්දිතයින් ගේ පවුල් වල සාමාජිකයින්ට නිශ්ශබ්දව සිටින මෙන් බලපෑම් එල්ල කෙරිණ. ඇම්නස්ටි ඉන්ටර්නැෂනල් සංවිධානයට ප්‍රකාශයක් කළ වෛද්‍ය කයිලාස පිල්ලේ ( වින්දිත පවුල් අතර ඉතාමත් ක්‍රියාකාරි තැනැත්තා) මහතා 2006 ජනවාරි 10 දින සිය පුතා ගේ හදිසි මරණ පරික්ෂණයේ දි සාක්ෂි දුන් අතර, ඉන් අනතුරුව තමාට නාඳුනන තැනැත්තන් ගෙන් තර්ජනාත්මක දුර කථන ඇමැතුම් ලැබුන බව කියා සිටි[39] අතර, ඔහු ගේ නිවසට ගල් මුල් ප්‍රහාරයක් ද එල්ල කරන ලද්දේය. වෛද්‍ය මනෝහරන් ට අනුව මහේස්ත්‍රාත් පරික්ෂණයේ දි සිංහල පොලිස් නිලධාරියෙක් තමාට " කොටියා" යැයි කියමින් තර්ජනයද කර තිබුනි.

මහේස්ත්‍රාත් පරික්ෂණයෙන් පසු 2006 පෙබරවාරි මස එස්. ටි. එෆ්. සාමාජිකයින් 11 දෙනෙකු හදිසි අවස්ථා රෙගුලාසි යටතේ අත් අඩංගුවට ගන්නා ලදි. නමුත් අපරාධ ස්ථානයේ තිබි හමුවු වෙඩි උන්ඩ කොපු සහ ඔවුන්ට රාජකාරි වශයෙන් නිකුත් කොට තිබු ගිනි අවි අතර පරස්පරයක් තිබු බව පවසා ඔවුහු 2006 මැද භාගයේ දී නිදහස් කළේය.[40] ශ්‍රී ලංකාවේ මානව හිමිකම් සංවිධානයක් වු යාපනය විශ්ව විද්‍යාල ආචාර්යවරුන් ගේ සංගමය විසින් මෙම සිද්ධිය සම්බන්ධයෙන් පළ කළ වාර්තාවකට අනුව මෙම ස්ථානයට මෝටර් බයිසිකලයකින් ළඟා වු නාවික හමුද භටයින් දෙදෙනෙක්, එස්. ටි. එෆ්. භටයින් අතට ගිනි අවි තුනක් ලබා දුන් බවට ඇසින් දුටු සාක්ෂි තිබින.[41]

2006 ජුනි මාසය වන විට රගිහාර් ගේ පවුලේ සාමාජිකයින් වෙත කෙරෙන බලපෑම යලිත් උත්සන්න විය. මෙම අවස්ථාව වන විට වින්දිතයින් ගේ පවුල් අතරින් ඝාතන සිද්ධිය සම්බන්ධයෙන් හඩක් නැගීමට සුදනම් සිටියේ වෛද්‍ය මනෝහරන් පමණකි. ඔහුට එල්ල වු තර්ජනයන් ගේ මුඛ්‍යාර්ථය වුයේ ඔහුත් නිශ්ශබ්ද කිරිමයි. මේ අතර වෛද්‍ය මනෝහරන් ගේ අනෙක් පුතුට, මාර්ග බාධකයකදී හඳුනා ගත් පොලිස් නිලධාරින් දෙදෙනෙක් " වෛද්‍ය මනෝහරන් "ජාත්‍යයන්තරව අසත්‍ය පතුරවන" බවට චෝදනා කළ බව වාර්තා විය. වෛද්‍ය මනෝහරන් ගේ පවුල විදේශීය රැකවරණය පතා ශ්‍රී ලංකාවෙන් පළා ගියේය. සිද්ධිය පිළිබඳ පරික්ෂණ ඇන හිටි අතර සැකකරුවන් නිදහස් කරන ලදි. වෛද්‍ය මනෝහරන් ගේ මතයට අනුව නඩුව විසි කරන ලද්දේය.

2008 මාර්තු මාසයේ දී වෛද්‍ය මනෝහරන්, 2006 දී "බරපතළ මානව හිමිකම් 16 සම්බන්ධයෙන් පරික්ෂා කොට වාර්තා කිරිම" පිණිස පිහිටුවන ලද ජනාධිපති පරික්ෂණ කොමිෂන් සභාව ඉදිරියේ දී ශ්‍රී ලංකාවෙන් පිටත හෙළිදරව් නොකළ ස්ථානයක සිට විඩියෝ තාක්ෂණය භාවිතා කරමින් සාක්ෂි දෙන ලදී.[42] සිය සාක්ෂි විභාගයේ දී ඉහත සඳහන් සිද්ධීන් විස්තර කළ ඔහු එකළ මානව හිමිකම් හා ආපදා කළමනාකරණ අමාත්‍යවරයාව සිටි මහින්ද සමරසිංහ මහතා තමා නිශ්ශබ්ද වන්නේ නම් ජිවතුන් අතර සිටින තම පුතුට කොළඹ පාසැලක් හා තමා ගේ පදිංචියට නිවසක ලබා දිමට යෝජනා කළ බව ද කියා සිටියේය.[43]

දේශිය හා ජාත්‍යයන්තර මානව හිමිකම් සංවිධාන විසින්, මෙම වාර්තාව පිට කරන මෙන් දිගින් දිගටම ඉල්ලා සිටින ලද නමුත් මේ දක්වාම එම වාර්තාව ප්‍රකාශයට පත් කොට නැත. 2013 එක්සත් ජාතීන් ගේ මානව හිමිකම් කොමසාරිස්වරිය එක්සත් ජාතීන් ගේ මානව හිමිකම් කොමිෂන් සභාවට ඉදිරිපත් කළ සිය වාර්තාවෙන් ඉහත කී වාර්තා ප්‍රකාශයට පත් කරන මෙන් ඉල්ලා සිටිමින් "ශ්‍රී ලංකා රජයට සංහිඳියාව හා වගවීම ප්‍රවර්ධනය කිරිම පිණිස උචමනා උපදේස් හා තාක්ෂණික ආධාර ලබා දිමට" සිය කැමැත්ත පළ කළාය.[44]

2012 දී එක්සත් ජාතීන් ගේ මානව හිමිකම් කොමිෂන් සභාවට ශ්‍රී ලංකාව ඉදිරිපත් කළ දෙවන කාලීන සමාලෝචන රැස්වීමට ඉදිරිපත් කළ වාර්තාවෙන්, ත්‍රිකුණාමලේ ශිෂ්‍යයන් පස් දෙනා ඝාතනය කිරීම සම්බන්ධයෙන් අභිචෝදනා ඉදිරිපත් කිරීමට *බැලූ බැල්මට සාදක* ඇත්දැයි සොයා බලා වාර්තා කිරීම පිණිස නීතිපතිවරයා වෙත යොමු කළ බව දන්වා සිටින ලදී. නීතිපතිවරයා විසින් පොලිස්පතිවරයාට වැඩිදුරටත් විමර්ශනය කරන මෙන් උපදෙස් දෙන ලදැයි වාර්තා විය.

## "ඇක්ෂන් එගෙන්ස්ට් හන්ගර්" ප්‍රංශ ආධාර සංවිධානයේ සහන සේවකයින් 17 දෙනා ඝාතනය කිරීම:

2006 අගෝස්තු මාසයේ දී නැගෙනහිර පළාතේ පාලනය සම්බන්ධයෙන් එල්. ටී. ටී. ඊ. සංවිධානය හා ශ්‍රී ලංකා ආරක්ෂක හමුදා අතර උග්‍ර සටන් ඇවිලී ගියේය. 2006 අගෝස්තු මස 6 වන දින " ඇක්ෂන් එගෙන්ස්ට් හන්ගර්" ප්‍රංශ ආධාර සංවිධානයේ, මුතූර් කාර්යාලයේ සේවය කරන ලද සහන සේවකයින් 15 දෙනෙකු ගේ මළ සිරුරු එම කාර්යාල මිදුලෙහි තිබින. එම මළ කඳන් පළමුවරට දකින අවස්ථාවේ මිදුලෙහි මුනින් අතට තිබූ අතර හිසෙහි පිට පැත්තෙහි හා බෙල්ලෙහි වෙඩි තැබීමක් නිසා සිදුවූ තුවාල තිබුනී. බැලූ බැල්මට මෙය යම්කිසිවෙක් විසින් සිදු කරන ලද ඝාතනයක් බව පෙනින[45]. අගොස්තු 8 වන දින තවත් මළ කඳන් දෙකක් එම කාර්යාලය අසල නවතා තිබූ මොටර් රථයක් තුල තිබී හමු විය. ඉහත කී සිද්ධිය සිදු වන අවස්ථාවේ එම ස්ථානයෙන් පැන යාමට මිය ගිය තැනැත්තන් දෙදෙනා දැරූ උත්සාහය වළක්වමින් ඝාතනයන් ගේ වෙඩි පහරට ඔවුන් දෙදෙනා ද ගොදුරු වූ බව පෙනින. ඝාතනය වූ ප්‍රංශ ආධාර සේවකයින් 17 දෙනා අතර කාන්තාවන් හතර දෙනෙක් හා පිරිමින් 13 වූ අතර ඔවුහු අගෝස්තු 5 වන දින හෝ 6 වන දින ඝාතනය කරන්නට ඇති බවට අනුමාන කෙරිණ. මෙම දිනවල දී එල්. ටී. ටී. ඊ. සටන් කරුවන් ගෙන් මුතූර් නගරය ශ්‍රී ලංකා ආරක්ෂ හමුදා විසින් නිදහස් කර ගෙන තිබූ හෙයින් මෙම ඝාතනය ශ්‍රී ලංකා ආරක්ෂ හමුදා විසින් සිදු කරන්නට ඇතැයි අනුමාන කෙරිණ[46]
මෙම ඝාතනය ද ඉහත සඳහන් කළ ජනාධිපති පරික්ෂණ කොමිෂන් සභාව විසින් පරික්ෂා කළ යුතු විෂයක් වශයෙන් ප්‍රකාශ කර තිබුනද, එම කොමිෂන් සභාවට ප්‍රමාණවත් ස්වාධීනත්වයක් හෝ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීමේ විධිවිධාන හෝ නොතිබින.[47] මෙම පරික්ෂණ කොමිෂන් සභා වාර්තාව ජනාධිපතිවරයා වෙත භාර දෙන ලද අතර මේ දක්වා ප්‍රසිධ කොට නොමැත. එහෙත් මෙම කොමිෂන් සභාවේ නිර්දේශ පිළිබඳව මාධ්‍යයන් විසින් හෙළි දරව් කරන ලද තොරතුරු වලට අනුව කොමිෂන් සභාවේ නිගමනය වී තිබුනේ ප්‍රංශ ආධාර සේවකයින් 17 දෙනා ගේ ඝාතනය එල්. ටී. ටී. ඊ. සංවිධානය විසින් සිදු කරන ලද බවයි. මෙම ඝාතනය පිළිබඳ අපරාධ පරික්ෂණ දෙපාර්තුමේන්තුවේ පරික්ෂණ අතර මඟ අතර දමනු ලැබූ බවක් පෙනී ගියේය. ඇක්ෂන් එගෙන්ස්ට් හන්ගර් සංවිධානයේ ප්‍රධාන කාර්යාලය විසින් මෙම ඝාතනය පිළිබඳ අන්තර් ජාතික මට්ටමේ ස්වාධීන පරික්ෂණයක් දිගින් දිගටම ඉල්ලා සිටිනු ලබයි.
ඝාතනයට ලක් වූ ඒ. ඒෆ්. සී. සංවිධානයේ සේවකයින් ගේ ඥාතීන්ට මෙම සිද්ධිය සම්බන්ධයෙන් තමන්ට ජනාධිපති පරික්ෂණ කොමිෂන් සභාව ඉදිරියට පැමිණ සාක්ෂි දීම හෝ ශ්‍රී ලංකාවේ හා ජාත්‍යන්තර මානව හිමිකම් සංවිධාන සමඟ තොරතුරු හුවමාරු කර ගැනීමෙන් වළකින ලෙසට ශ්‍රී ලංකා ආරක්ෂ හමුදා සාමාජිකයින් විසින් බලපෑම් එල්ල කරන ලද වාර්තා කරන ලදි. ඒ ඒෆ් සී සංවිධානයේ ජල හා සනීපාරක්ෂක තාක්ෂණ නිලධාරි අම්බිගාපති ජයසීලන් ගේ ඥාතිවරියක් වූ රවි ශාන්තා මහත්මිය 2008 මාර්තු 24 දින ජානධිපති පරික්ෂණ කොමිෂන් සභාව ඉදිරියේ පෙනී සිටිමින් තම ඥාති පුත්‍රයාගේ ඝාතනයෙන් පසු තමාට නන්නාඳුනන සිවිල් ඇඳුමින් සැරසුන තැනැත්තන් ගේ මරණීය තර්ජන එල්ල වූ බව කියා සිටියාය." ඔවුන්ට අවශ්‍ය වුයේ මෙම සිද්ධිය සම්බන්ධයෙන් අප කිසිවෙක් හා සමඟ සාකච්ඡා කිරීම වැළැක්වීමයි. තමාට ජයසීලන් ගේ අවමඟුල් කටයුතු සඳහා සහභාගි වීමට හෝ පොලිසියට පැමිණිලි කිරීමට ඉඩ නොදුන්"[48] බව කියා සිටියාය.
ජයසීලන් ගේ සහෝදරයා ද ඉහත කී ජනාධිපති කොමිෂන් සභාව ඉදිරියේ සාක්ෂි දීමට පැමිණි අතර මෙම දෙදෙනාම අවසානයේදී ආරක්ෂාව පතා මෙරටින් පළා ගියෝය.

පොන්නතුරෙයි යෝගරාජා ගේ එක් පුතෙක් ත්‍රිමලයේ ශිෂ්‍ය ඝාතනයේ දි මිය ගිය අතර අනෙක් පුතා ඒ. ඒෆ්. සි. ඝාතනයේ දී මිය ගියේය. සිය වැඩිමහල් පුතා වූ හේමචන්ද්‍රන් ගේ ඝාතනයෙන් පසු තමාට තර්ජනාත්මක දුර කථන ඇමතුම් ලැබුන බව කියා සිටියේය. " 2008 මාර්තු මාසයේ දී

ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාව ඉදිරියේ වීඩියෝ තාක්ෂණය ඔස්සේ සාක්ෂි දුන් යෝගරාජ " තමාට " අද මෙම කොමිෂන් සභාව ඉදිරියේ ප්‍රකාශ කරන කරුණු තමාට ශ්‍රී ලංකාව තුල දී ප්‍රකාශ කිරීමට අවශ්‍ය වූ නමුත්, සිය ජීවතුන් අතර සිටින දරුවන් ඊට ඉඩ නොදුන් බවත් සිය ජීවිතය රැක ගැනීම පිණිස තමා සිය පවුලත් සමඟ ශ්‍රී ලංකාවෙන් පළා ගිය බවත් " කියා සිටියේය.[49]

ඒ. සී. එෆ්. සිද්ධිය පිළිබඳ පැමිණිල්ල ජනාධිපති කොමිෂන් සභාව ඉදිරියේ විභාග වන අවස්ථාවේ දී පවා සාක්ෂිකරුවන්ට තර්ජන එල්ල විය. එක් අවස්ථාවක දී කොමිෂන් සභාවේ විමර්ශන ඒකකයේ පොලිස් නිලධාරීන් දෙදෙනෙක් විසින් එක් සාක්ෂිකරුවෙකුට තර්ජනය කළ බවට එම සාක්ෂිකරු විසින් පැමිණිලි කරන ලදි.[50]

## තොරතුරු වසන් කරනු පිණිස මාධ්‍යවේදීන් ඉලක්ක කිරීම:

2006 දී ප්‍රචණ්ඩ ක්‍රියා වර්ධනය වත්ම, ආණ්ඩුව භාෂණයේ නිදහසට සහ ප්‍රකාශනය ඇතුළු අදහස් පළ කිරීමේ නිදහස සීමා කිරීම පිණිස දරන ලද උත්සාහය ද ඉහළ ගියේය. මාධ්‍යවේදීන් මත විශේෂයෙන්ම, ද්‍රවිඩ මාධ්‍යවේදීන් සම්බන්ධයෙන් දැඩි පීඩනයක් ඇති කරන ලදී. ආරක්ෂක අමාත්‍යංශය, මාධ්‍යවේදීන්ට සිය මාධ්‍ය භාවිතය සම්බන්ධයෙන් උපදෙස් මාලාවක් නිකුත් කරමින්, ජාතික ආරක්ෂාව හා සම්බන්ධව මුද්‍රිත, විද්‍යුත් මාධ්‍යය හා ගුවන් විදුලි සේවාවන් වෙත ලැබෙන තොරතුරු ප්‍රකාශයට පත් කිරීමට පෙර, ජාතික ආරක්ෂාව පිළිබඳ මාධ්‍ය මධ්‍යස්ථානයේ පූර්ව අනුමැතිය ලබා ගත යුතු යැයි නියෝග කරන ලදි.[51] මීට සමගාමීව නිකුත් කළ තවත් නියෝගයකට අනුව කටකථා ජංගම දුරකථන, කෙටි පණිවුඩ හා විද්‍යුත් තැපැල මඟින් පතුරුවා හරින්න තැනැත්තන්ට ද හදිසි අවස්ථා රෙගුලාසි යටතේ දඬුවම් කරන බව ප්‍රකාශයට පත් කරන ලද්දේය.[52] මෙම අවස්ථාව වන විට ගැටුම් පවතින විවිධ ස්ථාන වල කොටු වී සිටි තැනැත්තන් මෙන්ම කොළඹ වැනි නාගරික ප්‍රදේශ වල විශේෂයෙන්ම දරුවන් ගේ ආරක්ෂාව පිළිබඳව පිළිබඳ තොරතුරු හුවමාරු කර ගන්නා ලද්දේ ජංගම දුරකථන කෙටි පණිවුඩ හා විද්‍යුත් තැපැල මඟින්[53].

ශ්‍රී ලංකාවේ බලධාරීන්ට සිය සතුරන් අත්අඩංගුවට ගැනීමටත් රැඳවුම් භාරයේ තබා ගැනීමටත් ඉඩ කඩ සැලසූ ඉතාමත් දුෂ්ටතම නීතිය වශයෙන් හැඳින්වෙන ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත, සටන් විරාමය පැවති වකවානුවේදී තාවකාලිකව අක්‍රිය කොට තිබූ අතර යලිත් නිල වශයෙන් 2006 දෙසැම්බර් මාසයේ දී නැවත ස්ථාපිත කරන ලදී. එම පනත මාධ්‍යවේදී ජේ එස් තිස්සනායගම් විසින් පළ කරන ලද ලිපි සම්බන්ධයෙන්, අතීතයට බලපාන පරිදි අභිචෝදනා ඉදිරිපත් කිරීමට යොදා ගත්තේය.

## මාධ්‍යවේදී තිස්සනායගම්: ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ සිර දඬුවම් ලැබූ පළමු මාධ්‍යවේදියා:

ජේ. එස්. තිස්සනායගම් ශ්‍රී ලංකා පොලිසියට අනුබද්ධිත ත්‍රස්ත විමර්ශන ඒකකය විසින් අත්අඩංගුවට ගන්නා ලද්දේ 2008 මාර්තු 7 දිනය. ඔහුට විරුද්ධව ඉදිරිපත් කරන ලද අධිචෝදනාව වූයේ, ඊට දෙවසරකට පෙර, එනම් 2006 දී ඔහු විසින් සංස්කරණය කරන ලද පුවත් පතක කර්තෘ වාක්‍යක අඩංගු වූ ඡේදයක් මඟින්, රජය යුද්ධයෙන් වින්දිතයින් බවට පත් වූ ද්‍රවිඩ සිවිල් වැසියන්ට සලකන ආකාරය විවේචනය කළේය යන්නයි. 2006 ජූලි මාසයේ පළ වූ එම කර්තෘ වාක්‍යයේ ශීර්ෂ පාඨය වූයේ " ද්‍රවිඩ ජනතාවට අද ආරක්ෂාව සලසන ආකාරය අනුව උතුරු-නැගෙනහිර අනාගතය විසඳෙනු ඇතැයි" යනුවෙනි.[54]

එම කර්තෘ වාක්‍යයෙන් ඔහු තවදුරටත් මෙසේ ද කියා සිටියේය. " නියත වශයෙන් ම ද්‍රවිඩ ජනතාවට රජය කිසිම ආකාරයක ආරක්ෂාවක් නොසපයන බව බව සහතිකය. ඇත්ත වශයෙන් ම රජයේ ආරක්ෂක හමුදා එහි සිදුවන ඝාතන වල ප්‍රධාන අපරාධකරු වෙයි." 2006 නොවැම්බර් මස පළ කළ දෙවන ලිපියකින් ඔහු තවදුරටත් නැගෙනහිර පළාතේ වාකරේ හි වර්ධනය වන මානවීය අර්බුදය පිළිබඳ යථා තත්වය අවධානයට ලක් කරමින් මෙසේ ලිවේය. " ආණ්ඩුවේ ක්‍රියාකාරකම් අතර මුල් තැන ගන්නේ එල්. ටී. ටී. ඊ. ය එම ප්‍රදේශයෙන් පලවා හැරීම පිණිස සිවිල් වැසියන්ට පහර දීම බවයි."[55] මෙම දෙවන ලිපියෙන් තිස්සනායගම් ආණ්ඩුව විවේචනය කරමින් රජය සිවිල්

වැසියන් නිරාහාරව තබමින් තමන් ගේ අනාගත යුද්ධමය අරමුණු ඉටු කර ගැනිමට මාන බලන්නේ යැයි" කියා සිටියේය.

මෙම ලිපි පළ විමෙන් අනතුරුව එළඹි මාස කිහිපය තුළ ආරක්ෂ අමාත්‍යංශය මාධ්‍යවේදීන් වෙත එල්ල කරන පීඩනය තවත් තියුණු කළ අතර බොහෝ මාධ්‍යවේදීන් ස්වයං-වාරණයක් කරා ගිය අතර යම් කිසි අවදානමක් ගත්තේ මාධ්‍යවේදීන් ස්වල්ප දෙනෙකු පමණි. තිස්සනායගම් විසින් සිය විවේචනය එල්ල කරන අවස්ථාවේ එය වාකරේ ඇතුළු නැගෙනහිර පළාතේ පවතින තත්වය පිළිබඳ කවුරුත් පාහේ පිළිගත් මතයක් වුයේය.[56]නැගෙනහිර පළාතේ සේවය කළ මානවීය ආධාර සේවකයින් ද මෙම තත්වය නිරීක්ෂණය කළ අතර මාස ගණනාවක් ගැටුම් ඇති වු ප්‍රදේශ වල සිවිල් වැසියන්ට ආහාර පාන නොලැබුන බව වාර්තා කළ අතර සිවිල් වැසියන්ට ආහාර පාන හා වෛද්‍ය පහසුකම් ලබා දීමට කොපමණ කාලයක් ගත වේ දැයි අනුමාන කළ නොහැකි බවත් ඔවුන් ප්‍රකාශ කර තිබුනි.

ඔහු ගේ නඩු විභාගයේ දී පැමිණිල්ලේ නීතිඥවරයා තිස්සනායගම් විසින් පොලිස් අත්අඩංගුවේ සිටිය දී කරන ලදැයි කියන ප්‍රකාශයක් සාක්ෂි වශයෙන් ඉදිරිපත් කරන ලදි. තිස්සනායගම් එම ප්‍රකාශය කරන ලද්දේ, තමා මානසික වශයෙන් වධ හිංසා වලට ලක් කිරිමේ පිඩනය යටතේ බව දිගින් දිගටම කියා සිටින ලදී.[57] අන්තර් ජාතික නීතිය හා ප්‍රමිතීන්ට අනුව යම් කිසි තැනැත්තෙකුට වධහිංසා වලට හෝ කෲර අමානුෂික හෝ අවමන් සහගත සැලකිල්ලකට නැතහොත් දඬුවමකට යටත් කොට ලබා ගන්නා ප්‍රකාශයක් කිසිම නඩු විභාගයක දී එම අපරාධකරුට විරුද්ධව හැර පැමිණිල්ලේ සාක්ෂියක් වශයෙන් ඉදිරිපත් කළ නොහැකිය.[58] මානව හිමිකම් කවුන්සිලයේ නිරීක්ෂණය වුයේ යම්කිසි තැනැත්තෙක් පීඩනකාරී තත්වයක් යටතේ යම්කිසි ප්‍රකාශයක් කරන ලද්දේ යැයි අධිකරණයක් ඉදිරියේ කියා සිටියහොත් එම ප්‍රකාශය එකී තැනැත්තා විසින් සව කැමැත්තෙන් කරන ලද්දක් බව සනාථ කිරිමේ වගකීම රජය සතු වන බවයි.[59] මෙම කරුණු පසෙකට දැමු අධිකරණය තිස්සනායගම් විසින් කරන ලදැයි කියන ලද ප්‍රකාශය පිළි ගැනිමට තීරණය කරන ලදී. ත්‍රස්තවාදය වැළැක්විමේ පණත යටතේ තමා විසින් කරන ලද ප්‍රකාශය පීඩාකාරි තත්වයක් යටතේ කරන ලද්දේ යැයි ඔප්පු කිරිමේ වගකිම සැකකරු සතු වෙයි.

තිස්සනායගම් අත්තනෝමතික ලෙස කිසිදු චෝදනාවක් ගොනු නොකොට පොලිස් අත් අඩංගුවේ මාස පහක් පමණ රඳවා තබා ගන්නා ලදි. ඔහු සහ ඔහු ගේ අනෙකුත් සගයන් දෙදෙනා (ඔවුන් පසුව නිදහස් කරන ලදී) ට එරෙහිව ඉදිරිපත් කරන ලද චෝදනාව වුයේ වර්ගවාදී හා ජනවාර්ගික හැඟිම් අවුස්සන සුළු ලිපි පළ කිරිමත් ත්‍රස්තවාදී කටයුතු සඳහා අරමුදල් රැස් කරන ලද්දේය යන්නයි. ඇත්ත වශයෙන්ම ත්‍රස්තවාදය වැළැක්විමේ පණත 2002 සාම ගිවිසුමත් සමග තාවකාලිකව අහෝසි කරන ලද අතර නැවත සක්‍රීය කරන ලද්දේ 2006 දෙසැම්බර් මාසයේ දීය. 2006 මුල් භාගයේ දී තිස්සනායගම් විසින් සිදු කරන අපරාධ සම්බන්ධයෙන් ත්‍රස්තවාදය වැළැක්විමේ පණත යොදා ගන්නා ලද්දේ පුර්වකාරි විධිවිධානයක් වශයෙනි. 2009 අගෝස්තු මාසයේ දී නඩු තින්දුව ප්‍රකාශයට පත් කරමින් තිස්සනායගම්ට විසි වසරක බරපතළ සිර දඬුවම් නියම කළ අතර 2010 ජනවාරි මාසයේ දි සිර භාරයෙන් නිදහස් කළේය. 2011 ජුනි මාසයේ දී ජනාධිපති සමාව ප්‍රදානය කළ අතර පසුව ඔහු රටින් පිට ව ගියේය. තිස්සනායගම් නිදහස් කිරිම දේශීය හා විදේශීය ඉල්ලීම් වල ප්‍රතිඵලයක් වශයෙන් සැලකිය හැකිය.

ශ්‍රී ලංකාවේ මාධ්‍ය නිදහස සම්බන්ධයෙන් එක්සත් ජාතීන් ගේ සංවිධානයේ මහ ලේකම් විසින් පත් කළ විද්වත් කමිටුව වැදගත් ඉම් ලකුණු දෙකක් සඳහන් කරයි. " පළමු වැන්න ශ්‍රී ලංකාවේ මාධ්‍යවේදීන් සිය ප්‍රකාශන නිදහස භුක්ති විදිම පිණිස හදිසි අවස්ථා නියෝග හා ත්‍රස්ත වාදය වැළැක්විමේ පණතට, අන්තර් ජාතික ප්‍රමිතීන්ට ගැලපෙන පරිදි ආදළ සංශෝධන ඉදිරිපත් කිරිමයි. ( හදිසි අවස්ථා නියෝග 2011 සැප්තැම්බර් මස අහෝසි කරන ලදි) දෙවැන්න දැනට ශ්‍රී ලංකාවෙන් පළා ගොස් සිටින මාධ්‍යවේදීන්ට නැවත ශ්‍රී ලංකාවට පැමිණ සිය වෘත්තිය බියෙන් හා සැකයෙන් තොරව කර ගෙන යාමට හැකි වාතාවරණයක් නිර්මාණය කිරිමයි.[60] සෑම අවස්ථාවක දීම මාධ්‍යවේදීන්ට මුහුණ දීමට සිදුවන පිඩාවන් පිළිබඳව නිශ්චිත උදහරණ සහිතව පෙන්වා දීමට නොපුළුවන. මතභෙදාත්මක ස්ථාවරයන් ගන්නා මාධ්‍යකරුවන්ට නිතරම පාහේ තර්ජනාත්මක දුරකථන ඇමතුම් හා අවවාද කිරිම් මෙන්ම පහර දිම් ද දක්නට ලැබේ.

## ලසන්ත වික්‍රමතුංග ඝාතනය:

**වි**මර්ශනාත්මක පුවත් පත් කලාව සම්බන්ධයෙන් නමක් දිනා ගෙන සිටි සන්ඩේ ලීඩර් පුවත් පතෙහි කර්තෘ ලසන්ත වික්‍රමතුංග 2009 ජනවාරි 8 දින උදෑසන රත්මලාන ගුවන් තොටුපලට ආසන්න අධි ආරක්ෂක කලාපයේ පිහිටි ජනාකීර්ණ මං සන්ධියක් දි ඝාතනය කරන ලදි. වික්‍රමතුංග ගමන් කළ වාහනය තුවක්කුකරුවන් හතර දෙනෙක් විසින් හරස් කොට මෝටර් රථයේ ඉදිරිපස විදුරුව බිඳ බෙල්ලට හා හිසට තුවක්කු බයිනෙත්තු වලින් පහර දි තිබු අතර රෝහල් ගත කෙරුණ ලසන්ත වික්‍රමතුංග මරණයට පත් විය.[61] ලසන්ත වික්‍රමතුංග ඝාතනය සිදු වි 2013 වන විට වසර හතරක් ගත වි ඇතැත් තවමත් ඝාතකයින් නිදැල්ලේ සිටිති.[62] 2006 දී, ලසන්ත වික්‍රමසිංහ ජිවත්ව සිටියදී, ජනාධිපති මහින්ද රාජපක්ෂ ඇතුළු විවිධ පුද්ගලයින් ගෙන් තමාට මරණීය තර්ජන ඇතැයි ප්‍රකාශ කළේය. 2008 දී ජනාධිපති මහින්ද රාජපක්ෂ "රිපෝටර්ස් විත්අව්ට් බෝඩර්ස්" සමඟ පැවැත්වු සම්මුඛ සාකච්ඡාවක දී ලසන්ත "ත්‍රස්තවාදියෙකු" වශයෙන් හැඳින්විය.[63] ලසන්ත ගේ මරණින් දින තුනකට පසු ඔහු විසින් ලියන ලද කර්තෘ වාක්‍යයක් ප්‍රකාශයට පත් කළ අතර එහි යම් කිසි ආකාරයකින් තමා ඝාතනය කළහොත් එහි වගකීම රජය විසින් භාර ගත යුතු යැයි ලියා තිබුනි.

"කවුරුත් දන්නා පරිදි අවස්ථා දෙකකදී මට ඉතාමත් අමානුෂික ලෙස පහර දෙන ලදී. තවත් අවස්ථාවකදී මගේ නිවසට මැෂින් තුවක්කු වෙඩි වරුෂාවක් එල්ල කළේය. බකතපස් ව්‍රතවාදී ආණ්ඩුව මගේ ජිවිතය ගැන සහතිකයක් දෙන ලද නමුත් මා විසින් කරන ලද කිසිදු පැමිණිල්ලක් විභාග කළේවත් සැකකරුවන් අත් අඩංගුවට ගැනීමක් වත් සිදු නොවිය. මේ සෑම ඝාතන ප්‍රයත්නයක් පසුපසම රජය සිටින බවට විශ්වාස කිරිමට මට ප්‍රමාණවත් කරුණු තිබෙන අතර අවසානයේ දී මා ඝාතනයට ලක් වෙතොත් ලක් වන්නේ ඒ අන් කිසිවෙක් අතින් නොව රජය අතින්මය." ලසන්ත ලියා තැබීය.[64]

2010 දී හිටපු හමුදපති මේජර් ජනරාල් සරත් ෆෝන්සේකා රාජපක්ෂ රෙජීමයෙන් බිඳී වෙන් වු කළ, ආරක්ෂක ලේකම් ගෝඨාභය රාජපක්ෂ ප්‍රසිද්ධියේම මාධ්‍යවේදීන්ට පහර දීමට නියෝග කරන ලද්දේත් ලසන්ත වික්‍රමතුංග ඝාතනය කිරිමට නියෝග කළෙත් සරත් ෆෝන්සේකා යැයි කියා සිටියේය. මෙම චෝදනාව සත්‍යය නම් ජනරාල් සරත් ෆෝන්සේකාට එරෙහිව අපරාධ නීති සංග්‍රහය යටතේ පරීක්ෂණයක් කළ යුතුවා සේම සන්නද්ධ සේවාවන්හි සේනාධිනායකවරයා වන ජනාධිපතිවරයා මෙන්ම ආරක්ෂ අමාත්‍යංශයේ ලේකම්වරයා ද මෙම ඝාතනය සම්බන්ධයෙන් යම් කිසි වගකීමක් දරන්නේ ද යන්න විභාග කළ යුතු වෙයි.

## පෝද්දල ජයන්ත: බලහත්කාරයෙන් පැහැර ගැනීම හා පහර දීම

පෝද්දල ජයන්ත, ශ්‍රී ලංකා වෘත්තීය මාධ්‍යවේදීන් ගේ සංවිධානයේ ලේකම් හා ශ්‍රී ලංකා රජය විසින් මාධ්‍යවේදීන්ට කරනු ලබන අඩන්තේට්ටම් පිළිබඳව සිය විරෝධය ප්‍රසිධියේ ප්‍රකාශ කළ මාධ්‍යවේදියෙක් විය. දිනමිණ පුවත් පතෙහි මාණ්ඩලික ලේඛකයෙක් වු ඔහු විශේෂයෙන්ම 2008 මැයි මාසයේ දී 'ද නේෂන්' පුවත් පතෙහි ආරක්ෂක තීරු ලිපි ලේඛක කීත් නොර්යර් පැහැර ගෙන යාම හා වධහිංසා පැමිණ විම පිළිබඳව රජයට දැඩි ලෙස දෝෂාරෝපණය කරන ලද්දේය. [65]2009 ජුනි මාසයේ දී ආයුධ සන්නද්ධ කණ්ඩායමක් විසින් ඔහුව බලහත්කාරයෙන් පැහැර ගෙන ගොස් වධහිංසා පමුණුවා මහ මඟ අතහැර ගොස් තිබුනි. තමා මුහුණ දුන් අත්දැකිම් පිළිබඳව ඇම්නස්ටි ඉන්ටර්නැෂනල් සංවිධානයට විස්තර කරමින් මේසේ කියා සිටියේය.

'ඔවුන් මගේ හිස කෙස් කපා මගේ කටේ එබුවා. මගේ කකුල් දෙකට පහර දුන් අතර ඉන් එක් කකුලක් විලිම්බුවෙන් කැඩි ගියා. පොල්ලකින් මගේ දකුණු අතේ ඇඟිලි වලට පහර දි නැවත පෑනක් පාවිච්චි කරන්නට බැරි විධියට තුවාල කළා. මාව නිදහස් කරන්නට මොහොතකට පෙර ඔවුන් 'උඹව මරන්නනේ නෑ. හැබැයි ආයෙත් ආණ්ඩුවට විරුද්ධව විරෝධතා සංවිධානය කළොත් හරි මාධ්‍යයට ප්‍රකාශ කළොත් හරි උඹව මරනවා' යනුවෙන් තර්ජනය කළා"

ශ්‍රී ලංකික මාධ්‍යවේදියෙකු වු ඩි බි එස් ජෙයරාජ් වාර්තා කළ පරිදි " නොයර් පැහැර ගෙන යාම සම්බන්ධයෙන් සංවිධානය කරන ලද විරෝධතාවට දින කිහිපයකට පසුව ආරක්ෂක අමාත්‍යංශයේ ලේකම් ගෝඨාභය රාජපක්ෂ විසින් පෝද්දල ජයන්ත හා සනත් බාලසූරිය ( 2009 දී ශ්‍රී ලංකාවෙන් පළා ගියේය) විසින් කැඳවන ලද අතර " ලේක්හවුස් ආයතනයට යුද්ධ හමුදවට එරෙහි කටයුතු කළ නොහැකි බව තර්ජනාත්මකව උඹ දැනට කරන දේ ඉස්සරාටත් කළොත් උඹට වෙන දේ බලා ගනින්' යනුවෙන් කියා සිටියේය.[66]

මේ අතර, එවකට යුද්ධ හමුද ආඥාපතිව සිටි සරත් ෆොන්සේකා විසින් ලද රාජ්‍ය ප්‍රතිපත්තිය විවේචනය කරන මාධ්‍යවේදීන්ට මාධ්‍ය ඔස්සේ අවමාන කිරීමේ ව්‍යාපාරයක් ආරම්භ කරන ලදී. හමුද ආඥාපති හා පොලිස්පතිවරයා විසින් ප්‍රසිද්ධියේම ආණ්ඩුව විවේචනය කරන මාධ්‍යවේදීන් මාධ්‍ය නිදහස පිළිබඳ අරගලයට මුවා වි එල් ටි ටි ඊ සංවිධානයේ කොන්ත්‍රාත්කරුවන් ලෙස ක්‍රියා කරන බව කියා සිටියේය.[67] ආණ්ඩුවට අයත් අයි ටි එන් රූපවාහිනි නාලිකාවේ ප්‍රවෘත්ති පසුබිම නම් වැඩ සටහනින් පෝද්දල ජයන්ත ගේ ඡායාරූප ප්‍රදර්ශණය කරමින් ඔහු ජාති ද්‍රෝහියෙකු වශයෙන් හැඳින්වීය. 2009 මැයි මස 22 වන දිනමිණ පුවත් පතෙහි කර්තෘ වාක්‍ය මගින් (මේ වන විට ජයන්ත දිනමිණ පුවත් පතින් ඉවත් වි සිටියේය) එල් ටි ටි ඊ සංවිධානයෙන් මුදල් ලබා ගෙන සිටින (රැවුල් වවා ගත්) මාධ්‍යවේදීන්ට ගල් ගසා මේ රටින් පන්නා දැමිය යුතු යැයි කියා සිටියේය.[68] තවත් පුවත් පතක් එල් ටි ටි ඊ සංවිධානයෙන් මුදල් ලබා ගෙන රට පවා දෙන මාධ්‍යවේදීන්ට මරණ දඩුවම නියම කළ යුතු යැයි කියා සිටියේය.[69]

"මෙම ආණ්ඩුවේ මාධ්‍යවේදීන් ඝාතනය කිරීම හා අතුරුදහන් කිරීම පිළිබඳ වාර්තාව අන් කිසිම යටත් විජිත රටකට වඩා ඉහළින් සිටියි. මෙම බිහිසුණු හා තැති ගැන්වෙන මානව හිමිකම් උල්ලංඝණයන් රාජ්‍ය මාධ්‍ය උපයෝගි කොට ගෙන අතුගා දැමිය නොහැක. මෙරට මහජන මතය පිළිබඳ විචාරකයින් සිය හෘද සාක්ෂියට අනුව අදහස් ප්‍රකාශ කරන්නට නොහැකි තත්වයක් උද වි තිබේ."[70]

2011 දෙසැම්බර් මස නිකුත් කළ එක්සත් ජාතීන් ගේ වධහිංසා පැමිණ විමට එරෙහි කමිටු වාර්තාවේ ශ්‍රී ලංකාව පිළිබඳ මේසේ සඳහන් කරයි. " ශ්‍රී ලංකාවේ මානව හිමිකම් ආරක්ෂකයින් වශයෙන් ක්‍රියා කරන නීතිවේදීන්, දේශපාලන ක්‍රියාකාරින්, වෘත්තීය සමිති නියෝජිතයින්, ස්වාධීන මාධ්‍යවේදීන් හා අනෙකුත් සිවිල් සමාජ ක්‍රියාකාරීන් ට මරණීය තර්ජනය කිරීම ඇතුළු අවමන් කිරීම හා ශාරිරික වශයෙන් අඩන්තේට්ටම් කිරීම් කරන බවට ප්‍රසිද්ධියේම අනතුරු හඟවා තිබේ."[71] එම වාර්තාව තවදුරටත් මේසේ ද සඳහන් කරයි. " මාධ්‍යවේදීන් ගේ මානව අයතීන් උල්ලංඝණය කිරීම් පිළිබඳ කණගාටුවෙන් වුවත් සඳහන් කළ යුතු කාරණය නම් ඒ කිසිම පැමිණිල්ලක් මේ වන තුරු විභාග නොකිරීමත් සැකකරුවන්ට නිදැල්ලේ සිටින්නට ඉඩ දී තිබීමත්ය. පොද්දල ජයන්ත, ප්‍රගීත් එක්නැළිගොඩ, ජේ. එස්. තිස්සනායගම්, නීතිවේදීන් වන ජේ. සී. වැලිඅමුණ හා අමිත ආරියරත්න පිළිබඳව මෙම කමිටුව විසින් ඉල්ලා සිටින ලද නිශ්චිත තොරතුරු ලබා දිමට රජය අපොහොසත් විය. තවද, ආරක්ෂක අමාත්‍යංශයේ වෙබ් අඩවියේ මානව හිමිකම් වෙනුවෙන් පෙනී සිටින තැනැත්තන් නියෝජනය කරන නීතිවේදීන් ජාති ද්‍රෝහීන් වශයෙන් හඳුන්වා දිමත් එබඳු නීතිවේදීන් කළු කෝට් පොරවා ගත් කොටි වශයෙන් හැඳින්විමත් මෙම කමිටුවේ අවධානයට ලක් වි තිබුනි.[72]

## භීෂණය පුළුල් කිරීම: සාම ක්‍රියාකාරින් හා වෘත්තීය සමිති නායකයින් අත් අඩංගුවට ගැනීම:

සංකේන්ද්‍රනය වන රාජ්‍ය බලයට තර්ජනයක් වන, අනෙකුත් සමාජ හා දේශපාලන ක්‍රියාකාරීන් වෙතට ද භීෂණය ව්‍යාප්ත කිරීම මඟින් තවදුරටත් විසම්මුතියට එරෙහි ව්‍යාපාරය ශක්තිමත් කෙරෙයි. 2007 පෙබරවාරි මස වෘත්තීය සමිති නායකයින් කිහිප දෙනෙක් බලහත්කාරයෙන් පැහැර ගත් අවස්ථාවේ, ප්‍රකාශයක් කළ ආරක්ෂක ලේකම් ගෝඨාභය රාජපක්ෂ තම අරමුණ මාධ්‍ය හෝ ප්‍රතිවාදී මත පාගා දැමීම නොව විසම්මුතිවාදීන් ජාතික ආරක්ෂාවට තර්ජනයක් වශයෙන් සැලකීමය' කියා සිටියේය. තවදුරටත් ඔහු මේසේ ද කියා සිටියේය."යම්කිසි තැනැත්තෙක් අත්අඩංගුවට ගත් වහාම

පවත්වන විරෝධතා එකී තැනැත්තා පිළිබඳ විමර්ශන කටයුතු අඩාල කිරීමට පමණක් නොව ආණ්ඩුවේ ස්ථාවරභාවයට ද තර්ජනයක් වෙයි." "එපමණක් නොව යම්කිසි තැනැත්තෙක් අත්අඩංගුවට ගැනීම හා ප්‍රශ්න කිරීම නීතිය ක්‍රියාත්මක කරන ආයතනයන් හි සාමාන්‍ය ක්‍රියාපටිපාටිය බවත් ඊට විරුද්ධ වීම ඍජුව හෝ වක්‍රව ජාතික ආරක්ෂාවට මැදිහත්වීමක් බවත් කියා සිටියේය.[73]

## සිංහල කොටි:

2007 පෙබරවාරි 05 දින දුම්රිය සේවා වෘත්තීය සමිති සංවිධානයේ නිල පුවත් පත වන ***අකුණ*** පුවත්පතෙහි සේවය කළ ලලිත් සෙනෙවිරත්න, සිසිර ප්‍රියංකර හා නිහාල් සේරසිංහ යන තිදෙනා ආගිය අතක් නොමැති බැව් වාර්තා විය. අතුරුගිරිය පොලිසියට පැමිණිල්ලක් කළ ලලිත් සෙනෙවිරත්න ගේ බිරිඳ තම සැමියා හෝකන්දර උතුරෙහි පිහිටි සිය නිවසට පැමිණි සිවිල් ඇඳුමෙන් සැරසුන කණ්ඩායමක් තමන් අපරාධ පරීක්ෂණ දෙපාර්තුමේන්තුවෙන් බව පවසා සිය සැමියා අත් අඩංගුවට ගත් බව ප්‍රකාශ කළාය.[74] ආරම්භයේ දී බලධාරීන් තමන් මේ කියන කිසිවෙක් අත්අඩංගුවට නොගත් බව තරයේම ප්‍රකාශ කර සිටියේය. මෙම වෘත්තීය සමිති නිලධාරීන් එල් ටී ටී ඊ සංවිධානයෙන් ආයුධ භාවිතය පිළිබඳ පුහුණුවක් ලබා ඇති බවත්, බෝම්බ ප්‍රහාර එල්ල කිරීමට සූදානමින් සිටි බවත් ආණ්ඩුව කියා සිටියේය. මෙම මාධ්‍යවේදීන් විසින් කරන ලද ප්‍රකාශයක් අඩංගු විඩියෝ පටියක් ආණ්ඩුව නිකුත් කළ අතර මෙම මාධ්‍යවේදීන් ත්‍රස්තවාදී කටයුතු කිරීමට සූදානම් සිටි බවට මාධ්‍ය මඟින් ඉතා පුළුල් ප්‍රචාරයක් ගෙන යන ලද.[75] 2007 පෙබරවාරි 13 දින මෙම සිද්ධිය සම්බන්ධයෙන් ආරක්ෂක අමාත්‍යාංශයේ නිල වෙබ් අඩවියෙහි පළ කළ ලිපියකින් ශ්‍රී ලංකාව ලේ විලක් කිරීමට තිබූ තැත ව්‍යර්ථ කළ බව කියා සිටියේය."[76]

අත්අඩංගුවට පත් මෙම වෘත්තීය සමිති නිලධාරීන් යුද්ධයට විරුද්ධව ප්‍රබල හඬක් නගමින් සිටි අතර යුද්ධ විරෝධී විරෝධතා ව්‍යාපාර වලට සහභාගි වූ කණ්ඩායමක් ද විය. යුද්ධ හමුදාව මෙම පිරිස් ආයුධ සන්නද්ධ විප්ලවකාරී පක්ෂයක් ගොඩ නැගීමට කටයුතු කළ බව වාර්තා කළේය. රාජ්‍ය මාධ්‍යයන් විසින් මෙම පුද්ගලයින් සිංහල කොටි වශයෙන් හංවඩු ගසන ලදී.[77] තවද මෙම කණ්ඩායම විසින් එල් ටී ටී ඊ සංවිධානය සමඟ සම්බන්ධකම් පවත්වන සිංහල හා ද්‍රවිඩ පුද්ගලයින් ගේ නාම ලේඛනයක් තමන් වෙත ලබා දී තිබෙන බවත් ඒ අනුව තවදුරටත් පරීක්ෂණ කටයුතු පවත්වන බවත් ආරක්ෂක අමාත්‍යාංශය ප්‍රකාශ කළේය.[78]

එල් ටී ටී ඊ සංවිධානයත් සමඟ අත්වැල් බැඳගෙන රජය පෙරලා දැමීමට කුමන්ත්‍රණය කළේය යන චෝදනාව මත සිංහල මාධ්‍යවේදීන් වෘත්තීය සමිති නිලධාරීන් හා දුම්රිය දෙපාර්තුමේන්තුවේ සේවකයින් 25 දෙනෙකුට ආසන්න සංඛ්‍යාවක් ත්‍රස්ත විමර්ශන ඒකකය විසින් අත්අඩංගුවට ගන්නා ලදී. දුම්රිය ඒකාබද්ධ සේවක සංගමයේ හා දුම්රිය වෘත්තීය සමිති සම්මේලනයේ සභාපති සරත් කුමාර ප්‍රනාන්දු ද අත් අඩංගුවට ගත් අතර ඔහු පොලිසිය භාරයට පත් කොට කිසිදු චෝදනවකින් තොරව අවුරුදු දෙකකට ආසන්න කාලයක් අත් අඩංගුවේ තබා ගන්නා ලදී. 2009 පෙබරවාරි මස බී බී සී සිංහල සේවයට ප්‍රකාශයක් කළ සරත් කුමාර ප්‍රනාන්දු තමන්ව අත්අඩංගුවට ගන්නා ලද්දේ මූලික වශයෙන්ම දුම්රිය කර්මාන්තයේ සේවක අයිතීන් රැක ගැනීමට තමන් හා තම වෘත්තීය සමිති සහෝදර වරුන් ගෙන ගිය අරගලය මැඩ පැවැත්වීමට බව කියා සිටියේය.[79] 2009 පෙබරවාරි මස 9 දින අත් අඩංගුවට ගත් 25 දෙනා ගෙන් 10 කිසිදු චෝදනාවකින් තොරව නිදහස් කරන ලදී.[80] 2009 මාර්තු මාසයේ දී ශ්‍රේෂ්ඨාධිකරණය ඉතිරි සැකකරුවන්ට එක්කෝ චෝදනා ඉදිරිපත් කරන ලෙසට හෝ නැතිනම් නිදහස් කරන ලෙසට නියෝග කරන ලදී. 2007 අගෝස්තු මාසයේ දී ප්‍රනාන්දු ඇතුළු තවත් දෙනෙක් නිදහස් කරනු ලැබූ අතර ප්‍රනාන්දු තමා අත්අඩංගුවේ පසු වූ කාලය තුළ වධ හිංසා වලට භාජනය වූ බව ප්‍රකාශ කළේය. ලලිත් සෙනෙවිරත්න, සිසිර ප්‍රියංකර හා නිහාල් සේරසිංහට විරුද්ධව අධි චෝදනා යාපනය හා කොළඹ උපරිමාධිකරණ වලදී ඉදිරිපත් කරන ලදී. සෙනෙවිරත්න හා සේරසිංහ 2013 මාර්තු මාසය වන විටත් වැලිකඩ බන්ධනාගාරයේ රඳවා සිටි අතර ප්‍රියංකර නිදහස් කරනු ලැබින.

කම්කරු අයිතිවාසිකම් පිළිබඳ ක්‍රියාධරයන්ට අනුව ලලිත් සෙනෙවිරත්න නිහාල් සේරසිංහ හා සිසිර ප්‍රියංකර යන තිදෙනා අත් අඩංගුවට ගැනීමෙන් පසු 2007 මාර්තු මාසයේ දී ද්‍රවිඩ තරුණයින් සිය

ගණනක් අත් අඩංගුවට ගනු ලැබින. මින් බොහෝ දෙනෙක් වතුකරයේ තරුණ තරුණියන් වූ අතර සියයකට අධික සංඛ්‍යාවක් බූස්සේ රැඳවුම් කඳවුරෙහි රඳවා සිටිනු ලැබේ.[81] මෙලෙස අත් අඩංගුවට ගනු ලැබූ ඇතැමෙක් අත් අඩංගුවට ගෙන ඇත්තේ ඉහළ කොත්මලේ ජල විදුලි බලාගාරයට එරෙහි ව පැවති මහජන උද්ඝෝෂණයට සහභාගි වූවන් වශයෙනි.[82]

## ජාත්‍යයන්තර විවේචන පිළිබඳ වර්ධනය වන ප්‍රතිවිරෝධතාඃ

2007 ජූනි මාස කොටුව දුම්රිය ස්ථානයේ මඩකලපුව බලා යාමට සිය සගයින් සමඟ පැමිණි ලංකා රතු කුරුස සංවිධානයේ සේවය කරන ද්‍රවිඩ තරුණයින් දෙදෙනෙක් අපරාධ පරීක්ෂණ දෙපාර්තුමේන්තුවේ යැයි හඳුන්වා ගත් පොලිස් නිලධාරීන් දෙදෙනෙක් විසින් අත් අඩංගුවට ගන්නා ලදී. පසුව ඔවුන් ගේ මළ කඳන් කොළඹින් කිලෝමීටර් 65 පමණ උතුරින් පිහිටි රත්නපුරයේ තිබී හමු විය. ඇම්නස්ටි ඉන්ටර්නැෂනල් සංවිධානය විසින් ලබා ගත් රහස්‍ය ප්‍රකාශ වලට අනුව මෙම තරුණයින් දෙදෙනා එල් ටි ටි ඊ සංවිධානය සමඟ සම්බන්ධකම් ඇතැයි අනුමාන කොට ආරක්ෂක හමුදාව විසින් අත්අඩංගුවට ගෙන පසුව ඝාතනය කරන ලද්දේය. ඊට පසු දින ශ්‍රී ලංකික හා අන්තර් ජාතික මානවීය සහන සේවකයින් ඇතුළු 200ක පමණ සංඛ්‍යාවක් කොටුව දුම්රිය පොළ ඉදිරිපිට මෙම ඝාතනයට විරෝධතාව පළ කළෝය.

මෙම සිද්ධිය අන්තර් ජාතික මානවීය සහන සේවකයින් හා ශ්‍රී ලංකික ආණ්ඩුව අතර සම්බන්ධතාවන් හි හැරවුම් ලක්ෂයක් විය. ශ්‍රී ලංකා රජය ඉහත කී විරෝධතාවයට සහභාගි වූ එක්සත් ජාතීන් ගේ සංවිධානයේ කාර්ය මණ්ඩල සේවකයින් සතර දෙනා රටින් පිට කරන මෙන් එක්සත් ජාතීන් ගෙන් ඉල්ලා සිටියේය.[83] යුද්ධය ඇවිලි යත්ම එල් ටි ටි ඊ සංවිධානයට හිතවාදී යැයි සැක කරන ලද අන්තර් ජාතික සංවිධාන පිළිබඳව රජය දැඩි ස්ථාවරයකට පැමිණියේය. රජය ගත් එක් පියවරක් වූයේ රාජ්‍ය නොවන සංවිධානයන් හි සේවය කළ විදේශිකයින් ගේ වීසා බලපත්‍ර අහෝසි කිරීමයි. මෙලෙස 2007-2009 අතර රාජ්‍ය නොවන සංවිධාන සාමාජිකයින් 40 ක ගේ පමණ වීසා බලපත්‍ර අවලංගු කරන කළේය.[84] රජයට පක්ෂපාති මාධ්‍යයන් විසින් මෙම රාජ්‍ය නොවන සංවිධාන රජයට එරෙහිව ජාත්‍යයන්තර කුමන්ත්‍රණයක්[85] දියත් කරන බව කියා සිටියෝය.[86]

ශ්‍රී ලංකාවේ ආරක්ෂක හමුදා විසින් මානව හා මානවීය නීතිය උල්ලංඝණය ත්‍රීව් වෙත්ම අන්තර් ජාතික රාජ්‍ය නොවන සංවිධාන හා රජය අතර ඇති වූ ප්‍රතිවිරෝධතාවයන් තවත් උග්‍ර විය. මේ පිළිබඳ නිදර්ශනයක් එක්සත් ජාතීන් ගේ මහ ලේකම් වරයා විසින් පත් කළ විද්වත් කමිටුව විසින් ගෙන හැර දක්වා තිබේ.

2009 ජූනි මස 13 වන දින වවුනියාවේ දී එක්සත් ජාතීන් ගේ කාර්ය මණ්ඩලයට අයත් ශ්‍රී ලංකික සේවකයින් දෙදෙනෙක් සිවිල් ඇඳුමෙන් සැරසුන කණ්ඩායමක් විසින් අත් අඩංගුවට ගන්නා ලදී. අත් අඩංගුවට ගත් තැනැත්තන් වෑන් රියක නංවා ගත් ඔවුහු වවුනියාව අවට පිහිටා ඇති ඔක්ස්ෆාම්, සේව් ද චිල්ඩ්‍රන්, ඩැනිෂ් රිෆියුජි කවුන්සිල්, නොර්විජියන් රිෆියුජි කවුන්සිල්, යූන්. එන්. එච්. සි. ආර්. ෆෝරුට් හා වර්ල්ඩ් විෂන් වැනි අන්තර් ජාතික මානවීය සහන සේවා ආයතන වෙත ගොස් එම ආයතනයන් හි එල් ටි ටි ඊ සංවිධානයට සහයෝගය දක්වන තැනැත්තන් සිටි දැයි විමසා බැලීය. එක් නිලධාරියෙක් ගිනි අවියක් පෙන්වා අත් අඩංගුවට ගත් තැනැත්තෙක් මරා දමන බවට තර්ජනය කරන ලදී. එදින කොළඹට රැගෙන ආ මෙම දෙදෙනා යම්කිසි පොලිස් ස්ථානයක පසු පස කාමරයක දින කිහිපයක් රඳවා තැබූ අතර නොකඩවා විවිධ වධහිංසා හා අඩන්තේට්ටම් කරන ලද්දේය. මේ අතර එක්සත් ජාතීන් ගේ සංවිධානය විසින් තම කාර්ය මණ්ඩලයෙන් ආ ගිය අතක් නැති මෙම තරුණ ද්‍රවිඩ සේවකයින් දෙදෙනා පිළිබඳව පොලිසියටත් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවටත් පැමිණිලි කළේය. මෙම පැහැර ගැනීමෙන් දින හතකට පසු ප්‍රකාශයක් නිකුත් කළ එක්සත් ජාතීන් ගේ සංවිධානය තම කාර්ය මණ්ඩල සාමාජිකයින් දෙදෙනකු අත් අඩංගුවට ගෙන ඇති බවත්, පසු ගිය දින 7 තුළම ඔවුහු ආගිය අතක් සොයා ගැනීමට නොහැකි වූ බවත් කියා සිටි අතර තමන් ආරක්ෂක ආමාත්‍යාංශයෙන් මේ පිළිබඳ අවධානය යොමු කොට ඇති බවත් කියා සිටියේය.”

මෙම සිද්ධියෙන් දින 12කට පසු එනම් ජූනි 25 දින අයි සි ආර් සි සංවිධානය විසින් මෙම තරුණයින් දෙදෙනා රඳවා තබා ඇති පොලිස් ස්ථානය සොයා ගැනීමට සමත් වූ අතර එහි ප්‍රතිඵලයක් වශයෙන් ඔවුන් ගේ ඥාතීන්ට, නීතිඥයින්ට මෙම තරුණයින් දෙදෙනා මුණ ගැසීමට අවස්ථාව එළඹින. ඔවුන් රඳවා සිටි පොලිස් ස්ථානයට ගිය කණ්ඩායමට දක්නට ලැබුනේ හිසෙහි හා පාදයන් හි ප්‍රතිකාර නොකළ තුවාල සමඟ සිටි තරුණයන් දෙදෙනෙකී. ජූනි 26 දින මෙම

තරුණයින් දෙදෙනාට සිංහල භාෂාවෙන් පිළියෙළ කරන ලද පාපෝච්චාරණයකට අත්සන් කිරීමට බල කළ අතර සිංහල භාෂාව නොදත් ඔවුහු බලකිරීම නිසාම ඊට අත්සන් තබන ලදී. එක්සත් ජාතීන් ගේ සංවිධානයේ නීති අංශය විසින් මෙම තරුණයින් දෙදෙනා පිළිබඳ අධිකරණ අමාත්‍යාංශයට දැනුම් දෙමින් එම තරුණයින් දෙදෙනා ද තානාපති වරප්‍රසාද භුක්ති විඳින බව පෙන්වා දී තිබුනි. සැප්තැම්බර් මාසයේ දී මෙම තරුණයින් රිමාන්ඩ් බන්ධනාගාරයට මාරු කර යවන ලදී. සැප්තැම්බර් මස 15 දින එක්සත් ජාතීන් ගේ මහලේකම් වරයා ජනාධිපතිවරයාට ලිපියක් ලියමින් මෙම තරුණයින් දෙදෙනා පිළිබඳ ජනාධිපතිවරයා ගේ අවධානය යොමු කළේය. මෙම ලිපිය ලිවීමෙන් මාස තුනකට පසුව හා ඔවුන් අත් අඩංගුවට ගෙන වර්ෂයකට පසු මෙම තරුණයින් දෙදෙනා නිදොස් කොට නිදහස් කරන ලදී."[87]

එක්සත් ජාතීන් ගේ සංවිධාන වාර්තාව විසින් 2007 දී තම සංවිධානයේ කාර්ය මණ්ඩල සාමාජිකයින්ට හිරිහැර කිරීම් හා තර්ජනය කිරීම් පිළිබඳ පැමිණිලි 43 ක් හා අත්අඩංගුවට ගැනීම් 14 වාර්තා වු  බව ප්‍රකාශ කරයි.[88] එක්සත් ජාතීන් ගේ මානවීය සම්බන්ධතා පිළිබඳ සහකාර ලේකම් ජොන් හෝල්මස් 2007 අගෝස්තු මාසයේ දී ප්‍රකාශයක් කරමින් " ශ්‍රී ලංකාව මානවීය සේවකයින් ගේ ආරක්ෂාව පිළිබඳ ඉතාමත් අයහපත් වාතාවරණයක් ඇති රටක්" වශයෙන් හඳුන්වන ලදී. මෙම ප්‍රකාශයට ප්‍රතිචාර දැක් වු ආණ්ඩුව කියා සිටියේ "යම්කිසි තැනැත්තෙක් හෝ සංවිධානයක් ත්‍රස්තවාදීන්ට අනුග්‍රහය දක්වන්නේ නම් ඔවුන් ද ත්‍රස්තවාදීන් වන බවයි. මේ නිසා ශ්‍රී ලංකාවේ කිර්ති නාමයට හානි කරන හොලම්ස් ද ත්‍රස්තවාදියෙක් ලෙස පිළි ගත යුතු යැයි" කියා සිටියේය.[89] ළමා අයිතීන් පිළිබඳ එක්සත් ජාතීන් ගේ ආයතනය වන යුනිසෙෆ් ආයතනයේ ප්‍රකාශක ජේම්ස් එල්ඩර් 2009 දි ශ්‍රී ලංකාවෙන් පිටව යන ලෙසට රජය නියෝග කරන ලද්දේය. මීට හේතු වුයේ සටන් කලාපය තුල කොටු වි සිටි ළමුන් ගේ තත්වය පිළිබඳ ඔහු විසින් කරන ලද  ප්‍රකාශයකී. මෙලෙසම එක්සත් ජාතීන් ගේ සංවිධානයේ ප්‍රකාශක ගෝර්ඩන් වයිස් ගේ විසා බලපත්‍රය දීර්ඝ නොකරන ලද්දේ ඔහු විසින් 2009 දී මුලතිව් ලේ විලක් බවට පත් වි ඇතැයි කළ ප්‍රකාශය නිසාය[90]. පසුව එක්සත් ජාතීන් ගේ සංවිධානයෙන් ඉල්ලා අස් වු ඔහු මාධ්‍යවේදියෙකු මෙසේ කියා සිටියේය. " ශ්‍රී ලංකා ආණ්ඩුව තොරතුරු පාලනය කිරීම හා බන්ධනය කිරීම සම්බන්ධයෙන් විශේෂ ප්‍රාගුණයක් දක්වයි. අප යම්කිසි තොරතුරක් ඉදිරිපත් කළ විට රජය ප්‍රථමයෙන්ම එය අසත්‍යයක් යැයි ප්‍රකාශ කරයි. අනතුරුව විදේශ අමාත්‍යාංශයට කැඳවා තර්ජනය කරන අතර රටින් පිටුවහල් කරන බව කියා සිටියි. මේ ආකාරයේ දෛනික පිඩනයක් සමඟ තම සේවය ඉටු කිරීම අතිශය දුෂ්කර කාර්යකී.[91]

එක්සත් ජාතීන් ගේ කාර්ය මණ්ඩලයේ පිටර් මැක්කේ මුලතිව් හා කොටු වි සිටියදී, කාලතුවක්කු ප්‍රහාර නිසා සිවිල් වැසියන් ගේ ජිවිත හානි සිදු වු ආකාරය පිළිබඳ අත් දැකිම් ලැබුවෙකී. සිවිල් වැසියන් ට සිදුවන හානි පිළිබඳව දත්ත හා තොරතුරු රැස් කළ ඔහු, යුද්ධය අවසානයේ සිවිල් වැසියන්ට සිදු වු හානි පිළිබඳව තමා ගේ ඇස්තමේන්තු, රජයේ ඇස්තමේන්තු වලට වඩා වැඩි බව කියා සිටියේය.[92] 2009 ජුලි මාසයේ දී ඔහුට ශ්‍රී ලංකාවෙන් පිට විමට සිදු විය.

2010 ජුලි මාසයේ දී ශ්‍රී ලංකා ආණ්ඩුව මානවය හිමිකම් ආරක්ෂකයින් ගේ ආරක්ෂාව සම්බන්ධයෙන් ක්‍රියා කළ, නොන් වයර්ලන්ට් පිස් ෆෝස්  නම් වු අන්තර් ජාතික රාජ්‍ය නොවන සංවිධානයේ විදේශිය කාර්ය මණ්ඩල සාමාජිකයින් ගේ වීසා බලපත්‍ර අහෝසි කරන ලදී.

මීට සමගාමිව යුද්ධයට පෙර හා පසුවත් ශ්‍රී ලංකා ආණ්ඩුව විදේශීය මාධ්‍යවේදීන් හට මෙරටට ඇතුල් විමට අවසර නොදෙන ප්‍රතිපත්තියක් අනුගමනය කළේය. 2009 අප්‍රියෙල් මාසයේ දී එක්සත් රාජධානියේ පළ කරන පුවත් පතක් වු "යුකේ ටයිම්ස් " පුවත් පතෙහි දකුණු ආසියානු වාර්තාකරු වු ජෙරමි පේජ්ට ශ්‍රී ලංකාව පැමිණි අවස්ථාවේ දී ආගමන හා විගමන දෙපාර්තුමේන්තුව විසින් ඔහු ගුවන් තොටුපලෙහි එක් රැයක් රඳවා ගෙන සිටි පසුව පිටුවහල් කරන ලදි. කිහිප අවස්ථාවකදීම මාධ්‍යකරුවෙක් ලෙසට ශ්‍රී ලංකාවට ඇතුල් විමට උත්සාහ කළ ජෙරමි පේජ් අවසානයේ දී සංචාරකයෙක් වශයෙන් ශ්‍රී ලංකාවට ඇතුල් විමට ප්‍රයත්න දැරීය. ඔහු තමා ගේ නම ආගමන දොරටු පරිඝණකයෙහි දිස් වු අවස්ථාවේදි තමා රඳවා තබා ගත් බව කියා සිටියේය.[93] එම අවස්ථාවේ ආගමන හා විගමන පාලකව සිටි පි බන්දුල අබේකෝන් මහතා මේ සම්බන්ධයෙන් ද අයිලන්ඩ් පුවත් පත විසින් කරන ලද විමසීමකට  ප්‍රතිචාර දක්වමින් මෙසේ කියා සිටියේය. " අපි කිසිම මාධ්‍යවේදියෙකුට ශ්‍රී ලංකාවට ඇතුල් වි මෙරට සුජාත ජනවාර්ගික සංයුතිය අවුල් කිරීමට ඉඩ නොදෙන්නෙමු. ආගමන හා විගමන දෙපාර්තුමේන්තුවට මෙරටට ඇතුළ් විම තහනම් කළ මාධ්‍යවේදීන් ගේ නාම ලේඛන විදේශීය අමාත්‍යාංශය ආරක්ෂක අමාත්‍යාංශය හා ජනමාධ්‍ය යන අමාත්‍යාංශ වලින් ලබා දි ඇති බවත් ඔහු තවදුරටත් කියා සිටියේය.[94]

ශ්‍රී ලංකාවේ අවතැන් කඳවුරු වල පවතින අයහපත් තත්වය හා ලිංගික අපචාර පිළිබඳ වාර්තා කළ චැනල් 4 රූපවාහිනි නාලිකාවේ මාධ්‍යවේදීන් තිදෙනෙකුට ශ්‍රී ලංකාවට ඇතුල් විමට 2009 මැයි මාසයේ දී අවසර නොදෙන ලදී.[95] මෙම සිද්ධිය සම්බන්ධයෙන් ප්‍රකාශයක් කළ  නික් පැටන් වොලස් තමාට ආරක්ෂක ලේකම් ගෝඨාභය රාජපක්ෂ මහතා " චැනල් 4 නාලිකාවද? තමුසෙලා ගේ චැනල්

එකෙන් මගේ සොල්දදුවන්ට ස්ත්‍රී දූෂකයින් කියලා චෝදනා කළා. තමුසේලාට මේ රට පිළිබඳව ඕනෑම දෙයක් වාර්තා කරන්න පුළුවන්. හැබැයි මේ රටේ ඉඳලා නෙමෙයි. වෙන රටකට ගිහිල්ලා." ප්‍රකාශ කළ බව කියා සිටියේය.[96]

2012 ජූනි මාසයේ දී නැවත වරක් චැනල් 4 රූපවාහිනී නාලිකාවේ ජ්‍යෙෂ්ඨ මාධ්‍යවේදියෙක් හා ඔහුගේ බිරිඳට ශ්‍රී ලංකාවට ඇතුල් වීමට ඉඩ නොදුන්නේය. මේ සිද්ධිය සම්බන්ධයෙන් බී බී සි පුවත් සේවය කළ විමසීමකට පිළිතුරු ආගමන හා විගමන දෙපාර්තුමේන්තුවේ නිලධාරීන් " ඔවුන් චැනල් 4 රූපවාහිනී නාලිකාවේ කට්ටියක්. කිසිම හේතුවක් නොමැතිව ඔවුන් ශ්‍රී ලංකාවේ නමට හානි කරනවා." කියා සිටියේය.[97]

ශ්‍රී ලංකා ආණ්ඩුව එක්සත් ජාතීන් ගේ මානව හිමිකම් කවුන්සිලය ඉදිරියේ අඳිනු ලබන චිත්‍රයෙන් අන්තර් ජාතික මාධ්‍යවේදීන් සම්බන්ධයෙන් පෙන්වන ආකල්පය මීට හාත්පසින්ම වෙනස්ය. 2012 ඔක්තෝබර් මාසයේ දී එක්සත් ජාතීන් ගේ මානව හිමිකම් කවුන්සිලයට මෙලෙස වාර්තා කරන ලදී." භාෂණයේ නිදහස ආරක්ෂා කිරීම පිණිසත් පුවත් පත් කලාවේදීන් ගේ හා මාධ්‍යවේදීන් ගේ අයිතීන් ආරක්ෂා කිරීම පිණිසත් ජන මාධ්‍ය හා තොරතුරු අමාත්‍යාංශය ප්‍රවෘත්ති දෙපාර්තුමේන්තුව හරහා පියවරයන් කිහිපයක් ම ගනු ලැබීය. දෙපාර්තුමේන්තුව දේශීය මෙන්ම විදේශීය මාධ්‍යවේදීන් සියළු දෙනාටම හැඳුනුම්පතක් නිකුත් කර ඇති අතර ඒ අනුව හැඳුනුම්පතක් සහිත සෑම මාධ්‍යවේදියෙකුටම තමන් ගේ පාඨකයින්ට හා ග්‍රහාහකයින්ට ප්‍රවෘත්ති වටිනාකමක් ඇතැයි සිතන ඕනෑම සිද්ධියක් පිළිබඳව වාර්තා කළ හැකිය. මෙම හැඳුනුම් පත ඇති ඕනෑම මාධ්‍යවේදියෙකුට ශ්‍රී ලංකාවේ ඕනෑම ස්ථානයකට යාමට හා ඊමට නිදහස තිබෙන බවත්" කියා සිටියේය.[98]

## අවසාන අදියරඃ

2008 සැප්තැම්බර් මස ශ්‍රී ලංකා යුද්ධ හමුදාව එල් ටී ටී ඊ සංවිධානයට එරෙහිව අවසාන ප්‍රහාරයකට සූදානම් වූ අතර ආරක්ෂක අමාත්‍යාංශය විසින් සියළුම රාජ්‍ය නොවන සංවිධාන හා එක්සත් ජාතීන් ගේ කාර්ය මණ්ඩල සාමාජිකයින්ට යුද්ධ කලාපයෙන් පිටතට යන මෙන් නියෝග කරන ලද අතර ස්වාධීන මාධ්‍යවේදීන්ට එම කලාපයට ඇතුල් වීම තහනම් කරන ලදි. ඇත්ත වශයෙන්ම එමගින් සිදුවූයේ යුද්ධ කලාපයේ සත්‍ය සිදුවීම් පිටතට වාර්තා වීම වැළැක්වීමයි. එක්සත් ජාතීන් සිය කාර්ය මණ්ඩල එල් ටී ටී ඊ පාලනය යටතේ තිබූ කිලිනොච්චියෙන් ඉවත් කොට ගෙන ආණ්ඩුවේ පාලනය යටතේ ඇති වවුනියාවට ගෙන ගියේය. යුද්ධ කලාපය තුල ද්‍රවිඩ වැසියන් 300,000 කට ආසන්න පිරිසක් අවතැන්ව සිටි අතර දෙපාර්ශවයෙන්ම එල්ල වූ ෂෙල් වෙඩි ප්‍රහාර හේතු කොට ගෙන ඔවුන්ට රැඳී සිටින්නට තිබුනේ ආණ්ඩුව විසින් යුද්ධ මුක්ත කලාපය වශයෙන් හඳුන්වන ලද ඉදිරි මාස 8 තුළ ක්‍රමයෙන් කුඩා වී ගිය භූමි භාගයක් තුළය.[99] ඇම්නස්ටි ඉන්ටර්නැෂනල් සංවිධානයට ලැබුන පිළිගත හැකි සාක්ෂි අනුව මෙම යුද්ධ මුක්ත කලාප ඉලක්ක කොට ගෙන දෙපාර්ශය විසින් ෂෙල් වෙඩි ප්‍රහාර එල්ල කරන ලද්දේය. මෙම ෂෙල් ප්‍රහාර රෝහල් වලට එල්ල කරන ලද අතර රෝහල් කාර්ය මණ්ඩල පමණක් නොව රෝගීන් පවා තුවාල ලැබීය.[100]

2009 මැයි 18 දින එල් ටී ටී ඊ නායකයින් සියල්ල සටන් භූමියේ දී ඝාතනය වූ බව, රජය තමන් ගේ විජයග්‍රහණය ප්‍රකාශයට පත් කරමින් කියා සිටියේය. එල් ටී ටී ඊ නායකයින් යටත් වීමට සූදානම්ව ඉදිරියට පැමිණි අවස්ථාවේ ශ්‍රී ලංකා යුද්ධ හමුදාව විසින් ඔවුහු ඝාතනය කළ බවත් පසුව හෙළිදරව් විය.[101] යුද්ධයේ අවසාන අදියරේ සිදු වූ දෑ සියැසින් දුටු තැනැත්තන් යුද්ධ හමුදාව විසින් පවත්වා ගෙන ගිය අවතැන් කඳවුරු වල රඳවනු ලැබීන. මෙලෙස රඳවන ලද සංඛ්‍යාව 300,000 ඉක්ම වීය. කාලය ඉකුත් වත්ම යුද්ධයේ අවසාන අදියරේ සිදු වූ දෑ පිළිබඳව වඩාත් නිවරදි තොරතුරු හෙළිදරව් වන්නට වීය. ඒ අනුව දහස් ගණනක් මිය ගිය බවත් ඒ හා සමාන සංඛ්‍යාවක් තුවාල ලැබූ බවත් සනාථ වූයේය. මෙම සංසිද්ධිය මූලික වශයෙන් දෙපාර්ශවය විසින්ම අන්තර් ජාතික මානවීය නීතිය හා මානව හිමිකම් උල්ලංඝණය කිරීමක් ලෙස විශේෂයෙන්ම අන්තර් ජාතික ප්‍රජාව අතර පිළි ගැනීමට ලක් විය.

2009 මැයි මස මුලතිව් රෝහලේ සේවය කළ වෛද්‍යවරුන් පස් දෙනෙක් සිවිල් වැසියන් සමඟ පලා එද්දී අපරාධ පරීක්ෂණ දෙපාර්තුමේන්තුව විසින් අත් අඩංගුවට ගෙන වැඩිදුර විමර්ශනය පිණිස පොලිසියට භාර දෙන ලදී. මෙම වෛද්‍යවරුන් දෙදෙනා මුලතිව් රෝහලේ සේවය කළ අවස්ථාවේ දී අන්තර් ජාතික ප්‍රජාවට හා ස්වාධීන මාධ්‍යවේදීන්ට තහනම් කලාපයක්ව තිබූ යුද්ධ කලාපයේ සත්‍ය සිදුවීම් පිළිබඳ යථාර්ථවාදී චිත්‍රයක් බාහිර ලෝකයාට ලබා දීමට සමත් වූවෝය. අත් අඩංගුවට ගනු ලැබූ වෛද්‍යවරුන්ට, රජයේ වෛද්‍යවරුන් වශයෙන් සිටිමින් එල් ටී ටී ඊ සංවිධානයට පක්ෂපාතීව කටයුතු කළ බවටත් යුද්ධ කලාපයේ සිදු වූ සිදුවීම් පිළිබඳ වැරදි තොරතුරු ප්‍රකාශයට පත් කළ බවටත් චෝදනා කරනු ලැබීන. ඔවුන් අත් අඩංගුවේ සිටියදීම 2009 ජූලි මාසයේ දී, ආණ්ඩුව විසින් සංවිධානය කරන ලද මාධ්‍ය සාකච්ඡාවකට පෙනී සිටි ඔවුන්, තමන් විසින් කලින්

කරන ලද ප්‍රකාශ එල් ටී ටී ඊ සංවිධානයේ බලපෑම නිසා කළ වැරදි ප්‍රකාශ බව කියා සිටියේය. මෙම වෛද්‍යවරුන් පස් දෙනා ඉන් මාස කිහිපයකට පසු නිදහස් කළ අතර තවදුරටත් රාජ්‍ය සේවයේ නිරත වීමට ඉඩ දෙන ලදී. එතැන් පටන් මේ දක්වාම මුලතිව් හි ජංගම රෝහල් පිහිටුවා ගෙන යුද්ධයෙන් පීඩාවට පත් තැනැත්තන්ට වෛද්‍ය පහසුකම් සපයමින් යථාර්ථය ඇසින් දුටු ඔවුහු අද දක්වාම (2013 මැයි) නිහඬ සිටිති.

2011 මාර්තු මස ප්‍රකාශයට පත් කළ එක්සත් ජාතීන්ගේ විද්වත් කමිටුව සිය වාර්තාවෙන් " ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් ඉදිරිපත් වන පිළිගත හැකි චෝදනා ඔප්පු කළහොත් එරට අන්තර් ජාතික මානවීය නීතිය හා අන්තර් ජාතික මානව හිමිකම් නීතිය ශ්‍රී ලංකා ආරක්ෂක හමුදාව මෙන්ම එල් ටී ටී ඊ සංවිධානය ද බරපතළ ලෙස උල්ලංඝණය වී ඇති බව සනාථ වෙයි.[102] ඇම්නස්ටි ඉන්ටර්නැෂනල් සංවිධානය විසින් වින්දිතයින් ගෙන් ලබා ගත් පාපෝච්චාරණ මත ශ්‍රී ලංකාවේ යුද්ධ අපරාධ පිළිබඳ එළඹී නිගමනයන් රාශියක් එක්සත් ජාතීන් ගේ විද්වත් කමිටුව විසින් යළි සනාථ කොට තිබේ.[103]

එක්සත් ජාතීන් ගේ සංවිධානයේ මහලේකම් විසින් පත් කළ විද්වත් කමිටුව "ශ්‍රී ලංකා ආණ්ඩුව වහාම යුද්ධයේ අවසාන අදියරේ දී සිදු වූයේ යැයි කියනු ලබන අන්තර් ජාතික මානවීය හා මානව හිමිකම් නීතිය උල්ලංඝණය කිරීම් පිළිබඳ චෝදනා වහාම විභාග කළ යුතු බවට නිර්දේශ කරමින්, මෙම සංසිද්ධීන් හා සම්බන්ධ තොරතුරු අනාගත ප්‍රයෝජනය පිණිස සංරක්ෂණය කළ යුතු බවද කියා සිටියේය."[104]

යුද්ධ විජයග්‍රහණය ප්‍රකාශයට පත් කිරීම පිණිස පාර්ලිමේන්තුව අමතා පවත්වන ලද දේශනයේ දී ජනාධිපති රාජපක්ෂ දේශපාලන බලය ඒක රාශී කිරීමේ සිය අභිලාෂය ප්‍රකාශයට පත් කළේය. ශ්‍රී ලංකාවේ තවදුරටත් සුළු ජාතීන් කියා කොටසක් නොමැති බව ප්‍රකාශ කළ ඔහු, මෙරට සිටින්නේ මිනිසුන් දෙවර්ගයක් යැයි කියා සිටියේය." එක් කොටසක් රටට ආදරය කරයි. අනික් කණ්ඩායම තමන් උපන් රටට ආදරයක් නැති සුළුතරයයි"[105] මහින්ද රාජපක්ෂ ගේ "අප සමඟ" එසේ නැත්නම් " අපට එරෙහිව" යන ප්‍රවේශය නැවත නැවතත් සිය දේශපාලන කථා වලදී අවධාරණය කළ අතර එමගින් සිය දේශපාලන විරුද්ධවාදීන්, මාධ්‍යවේදීන් හා මානව හිමිකම් ආරක්ෂකයින් "උපන් රටට ආදරයක් නැති පිරිසක් වශයෙන්" හංවඩු ගසන ලදී.

## 3 යුද්ධයෙන් පසු ශ්‍රී ලංකාව: බලය සංකේන්ද්‍රනය වීම ( 2009 සිට වර්තමානය දක්වා)

2009 යුද්ධය නිමා වීමත් සමගම, බලධාරීන් විසින් තමන්ට එල්ල වන දේශපාලන අභියෝග වලට මුහුණ දීම පිණිස, ශ්‍රී ලංකාව පුරාම දේශපාලන බලය සංකේන්ද්‍රනය කර ගැනීමට පියවර ගත් අතර, අළුතින් අල්ලා ගත් ප්‍රදේශ පීරමින් විසම්මුතිකවාදීන් හා ද්‍රෝහීන් හඹා යෑම ආරම්භ කළේය. ආණ්ඩුවේ ප්‍රතිපත්ති හා මානව හිමිකම් වගවීම පිළිබඳ විවේචනය කරන සිවිල් සමාජ සාමාජිකයින් හා අන්තර් ජාතකි රාජ්‍ය නොවන සංවිධාන එල් ටී ටී ඊ යට පක්ෂපාත ඩයිසපෝරාව සමඟ සම්බන්ධකම් ඇති ශ්‍රී ලංකාව හෙළා දකින කණ්ඩායමක් ලෙස හඳුන්වන්නට පසුබට නොවීය.[106]

යුද්ධයෙන් පසු මහින්ද රාජපක්ෂ ගේ බලයට ප්‍රථම අභියෝගය එල්ල කරන ලද්දේ 2010 ජනාධිපතිවරණයට ඉදිරිපත් වූ හිටපු යුද්ධ හමුදා ආඥාපති සරත් ෆෝන්සේකා විසිනී. 2009 මැයි මාසයේ යුද්ධය නිල වශයෙන් අවසාන වීමත් සමගම යුද්ධ හමුදා සේවයෙන් ඉවත් වූ සරත් ෆෝන්සේකා 2010 ජනාධිපතිවරණයට අපේක්ෂකයෙක් වශයෙන් ඉදිරිපත් විය. මේ අතර 2009 දෙසැම්බර් මස සන්ඩේ ලීඩර් පුවත් පතට සම්මුඛ සාකච්ඡාවක් ලබා දෙමින් සරත් ෆෝන්සේකා, ආරක්ෂක ලේකම් ගෝඨාභය රාජපක්ෂ විසින් යුද්ධ හමුදාවට භාර වීමට පැමිණි එල් ටී ටී ඊ සාමාජිකයින් කිසිදු වගවිභාගයකින් තොරව වෙඩි තබා ඝාතනය කිරීමට නියෝග කළ බවට ප්‍රකාශයක් කළේය.[107] මෙම ලිපිය පළ වීමෙන් පසු යුද්ධය සම්බන්ධයෙන් ශ්‍රී ලංකාව තුළත් ඉන් පිටතත් විශාල ආන්දෝලනයක් හට ගත්තේය. ජනාධිපතිවරණයෙන් සරත් ෆෝන්සේකා පරාජයට පත් වූ අතර මැතිවරණය නිමා වී ටික දිනකදී සරත් ෆෝන්සේකා ඔහු ගේ ආධාරකරුවන් පිරිසක් සමඟ රාජ්‍ය විරෝධී කුමන්ත්‍රණයක නිරත වීයැයි යන චෝදනාය මත අත්අඩංගුවට ගත්තේය.[108]

සරත් ෆොන්සේකා ගේ දේශපාලන පදනම අඩපණ කිරීම පිණිස ආණ්ඩුව සිය විරුද්ධවාදීන් ප්‍රබල ලෙස මර්දනය කිරීම දියත් කළේය. ආරක්ෂක හමුදා සාමාජිකයින්, මාධ්‍ය හා අනෙක් වෘත්තීන් හි නියැලි තැනැත්තන් හඹා යන්නට ගත් ආණ්ඩුව ස්ථාන මාරු, සේවයෙන් පහ කිරීම්, තර්ජනය කිරීම්, අත් අඩංගුවට ගැනීම හා පහර දීම් ඊට ඇතුළත් වූ ප්‍රධාන උපාය මාර්ග වූයේය[109]. මෙම පීඩනය නොඉවසූ බොහෝ දෙනෙක් රට හැර පළා ගියෝය.

2010 ජුලි මාසයේ දී බි බි සී රූපවාහිනී සේවයේ හාඩ් ටෝක් නම් වූ වැඩ සටහනට සහභාගි වූ ආරක්ෂක අමාත්‍යංශයේ ලේකම් ගෝඨාභය රාජපක්ෂ මහතා රජයට භාර වීමට පැමිණි එල් ටි ටි ඊ සාමාජිකයින් යුද්ධ හමුදාව විසින් ඝාතනය කළේ යැයි ප්‍රකාශ කිරීම මගින් රට පාවා දෙන්නේ යැයි කියා සිටියේය. සම්මුඛ සාකච්ඡාකරු " සරත් ෆොන්සේකා යුද්ධයේ දී සිදු වූ මානව හිමිකම් උල්ලංඝණයන් පිළිබඳ ස්වාධීන විමර්ශනයක දී තමා සාක්ෂි දීමට සූදානම් යැයි" ප්‍රකාශ කොට ඇති බව ගෝඨාභය රාජපක්ෂ මහතා ගේ අවධානයට ලක් කළ විට ඉතා තදින් කෝප වූ ඔහු " ඒක ජාති ද්‍රෝහි වැඩක්. එයා ඒක කළොත් මං එයාව එල්ලනවා" යනුවෙන් ප්‍රකාශ කළේය.[110]

2010 අගෝස්තු මාසයේ දී අප්‍රසිද්ධ යුද්ධ හමුදා අධිකරණයක් ඉදිරියේ පවත්වන ලද නඩු විභාගයකදී තවදුරටත් හමුදා සේවයේ සිටිය දී දේශපාලන කටයුතු වල නිරත වීම යන චෝදනාව යටතේ කෝට් මාර්ෂල් කරන ලද අතර සියළුම හමුදා නිලතල ඔහු ගෙන් ආපසු ගන්නා ලදී. පවත්වන ලද තවත් මිල්ටරි නඩු විභාගයකදී ආයුධ ගෙන්වීම සම්බන්ධයෙන් සිදු කළ චෝදනාවන්ට වරදකරු කොට මාස 30 ක සිර දඬුවමකට යටත් කළේය.

සරත් ෆොන්සේකා මහතා තමා විසින් සන්ඩේ ලීඩර් පුවත් පතට කරන ලද ප්‍රකාශය ඉල්ලා අස් කර ගන්නා ලද නමුත් එම ප්‍රකාශය පදනම් කොට ගෙන ඔහුට විරුද්ධව කොළඹ උපරිමාධිකරණයෙහි පනවන ලද විභාගය ඉදිරියට ගෙන ලදී. නඩු තීන්දුව 2011 නොවැම්බර් මස ප්‍රකාශයට පත් කළ අතර අධිරකණය සරත් ෆොන්සේකා තුන් අවුරුදු සිර දඬුවමකට යටත් කොට තිබුනි. 2012 මැයි මාසයේ දී සරත් ෆොන්සේකාට ජනාධිපති සමාව ලැබුන නමුත් මේවන තෙක් තමාට සමාව දෙන ලද්දේ කුමන කොන්දේසි යටතේ දැයි තමා නොදන්නා බව ඔහු ප්‍රකාශ කළේය.[111]

## විධායක බලය ප්‍රසාරණය කිරීමඃ

ද්‍රවිඩ ජනතාව ගේ ඉල්ලීම් වලට කන් දීමක් හා ජනතාවට බිම් මට්ටමින් වගකියන දේශපාලන ව්‍යුහයක් සඳහා දේශපාලන බලය විමධ්‍යගත කිරීම පිණිස තිබූ ප්‍රවණතාවය ආපස්සට කරකවමින්, යුද්ධය නිමා වීම හා ඊට සමගාමීව විසම්මුතිකවාදීන් මෙල්ල කිරීමත් සමගම නැවත දේශපාලන බලය මධ්‍යගත කිරීම් ප්‍රවණතාවයක් දක්නට ලැබේ. මෙම ප්‍රවණතාවයේ ප්‍රථම ගොදුර බවට පත් වූයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථානුකූලව පිහිටුවා තිබූ ස්වාධීන කොමිෂන් සභාය.

නමුත් 1972 ව්‍යවස්ථාවේ සිටම බලයට පත් වූ ශ්‍රී ලංකික දේශපාලන නායකයින් මහජනයා අතර මතභේදයට තුඩු දෙන එසේත් නැත්තනම් මානව අයිතීන් සීමා කරන පනත් "ජාතියේ හිත සුව පිණිස වහා අවශ්‍ය වන්නා වූ පනත් කෙටුම් පනත් " වශයෙන් සලකා කඩිනමින් සම්මත කර ගැනීමේ සම්ප්‍රදායක් ගොඩ නඟා ගෙන තිබුනි.[112] මීට අමතරව ත්‍රස්තවාදය වැළැක්වීමේ පණත හා අවලංගු කරන තෙක් හදිසි නීති රෙගුලාසි ද භාෂණයේ නිදහස සහ ප්‍රකාශනය ඇතුළු අදහස් පළ කිරීමේ නිදහස සාමකාමීව රැස්වීමේ නිදහස හා සමාගමයේ නිදහස අහිමි කරමින් අත් අඩංගුවට ගනු ලබන තැනැත්තන් විවිධ වධහිංසා හෝ කෲර අමානුෂික හෝ අවමන් සහගත සැලකිලිවලට නැතහොත් දඬුවමකට යටත් කිරිම වැනි දැඩි දඬුවම් දෙන නීති සම්මත කර ගැනීමට පාවිච්චි කරන ලදී. එහෙත් යුද්ධයෙන් පසු රාජ්‍ය බලය සංකේන්ද්‍රනය කරන නීති රීති සම්පාදනය සම්බන්ධයෙන් මහජනතාව සිය විරෝධය පළ කිරීමට පසුබට නොවූ අතර මේ සම්බන්ධයෙන් කැපී පෙනුනේ මෙරට නීති ක්ෂේත්‍රයෙහි නියුක්ත විවිධ වෘත්තිකයන්ය.[113]

ශ්‍රී ලංකාවේ මානව හිමිකම් නීතිවේදීන්ට අනුව මෙබඳු නීති රීති විධායක බලය සංවරණය හා තුලනය කිරිම පිණිස තිබෙන ඉඩකඩ අහුරන අතර යෝජිත පනත් කෙටුම්පත් සම්බන්ධයෙන් මහජනයාට සිය අදහස් දැක්වීමට තිබෙන අවස්ථා ද අහිමි කරයි.[114]

2010 සැප්තැම්බර් 8 වන එබඳු ජාතික වැදගත්කමකින් යුත් පණතක් ලෙස ඉදිරිපත් කරන ලද 18 වන ව්‍යවස්ථා සංශෝධනය මගින්, 2001 සම්මත කරන ලද 17 වන ව්‍යවස්ථා සංශෝධනය යටතේ පිහිටු වන ලද උසස් තනතුරු වලට පුද්ගලයින් පත් කිරීමේ දී එම කාර්ය ස්වාධීන ව ඉටු කිරීම පිණිස පාර්ලිමේන්තුවේ සියළු පක්ෂ නියෝජනය වන පරිදි සකස් කොට තිබූ ව්‍යවස්ථාදායක සභාව, අහෝසි කරමින් එම බලය ජනාධිපතිවරයා වෙතට පවරා ගන්නා ලද්දේය. ඒ යටතේ පහත දැක්වෙන කොමිෂන් සභාවලට සාමාජිකයින් පත් කිරීමේ බලය ජනාධිපතිවරයා සතු විය.

- **මානව හිමිකම් කොමිෂන් සභාව**: ශ්‍රී ලංකිකයින් ගේ ව්‍යවස්ථානුකූල අයිතීන් නියාමනය කිරීම හා උල්ලංඝණය වන අවස්ථාවන්හි විමර්ශණය කිරීම පිළිබඳ වගකීම හා මානව හිමිකම් ප්‍රවර්ධනය කිරීමේ හා ආරක්ෂා කිරීමේ වගකීම මෙම ආයතනය සතුය.

- **ජාතික පොලිස් කොමිෂන් සභාව**: පොලිස් කොමිෂන් සභාව සතු තිබූ පත් කිරීම් උසස් කිරීම්

මාරු කිරීම් විනය පරික්ෂණ හා සේවයෙන් පහ කිරීමේ බලතල 18 වන ව්‍යවස්ථා සංශෝධනයෙන් ජනාධිපතිවරයා විසින් පත් කරන පොලිස්පතිවරයා වෙත පවරන ලදී. මේ අනුව වර්තමාන පොලිස් කොමිෂන් සභාවට ඉතිරි වී ඇත්තේ පොලිස් නිලධාරීන්ට එරෙහිව මහජනයා විසින් කරනු ලබන පැමිණිලි විභාග කිරීම පමණි.[115]

- **අධිකරණ සේවා කොමිෂන් සභාව:** අධිකරණ සේවයේ පත් කිරීම් හා මානව සම්පත් කළමනාකරණය පිළිබඳ වගකීම දරන කොමිෂන් සභාව.

"18 වන සංශෝධනයෙන් ඉදිරිපත් කරන ලද (අධිකරණ සේවයට) පත් කිරීමේ ක්‍රියාපටිපාටිය අධිකරණයේ ස්වාධීනත්වයට විශේෂ තර්ජනයක් ගෙන එයි. ජනාධිපතිවරයා සිය ව්‍යවස්ථානුකූල පත් කිරීමේ බලය, අග විනිසුරු අභියාචනා අධිරණයේ සභාපති ඇතුළු සාමාජිකයින් අධිකරණ සේවා කොමිෂන් සභාවේ සාමාජිකයින් හා සභාපති නීතිපතිවරයා හා පාර්ලිමේන්තුවේ මහලේකම්වරයා පත් කිරීම දක්වා විහිදුවයි. මීට අමතරව ජනාධිපතිවරයා 18වන ව්‍යවස්ථා සංශෝධනය මගින් පාර්ලිමේන්තු ස්වාධිපත්‍ය යටපත් කරමින් සිය ආධිපත්‍ය පාර්ලිමේන්තුවටත් දිගු කරයි. තමාට අභිමත අවස්ථාවක පාර්ලිමේන්තුව ඇමතීමට තිබෙන බලය නිසා පාර්ලිමේන්තු වරප්‍රසාදවල රැකවරණය ඔහුලැබෙන අතර ව්‍යාවස්ථාදයකට බලපෑමට ඉඩකඩ ලබා ගනිමින් විධායකයත් ව්‍යවස්ථාදයකයත් අතර තිබූ බල බෙදීම අහෝසි කරයි" විශ්‍රාමලත් ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු සි වි විග්නේෂ්වරන් විසින් අධිකරණ සේවා සංගමයේ වාර්ෂික සම්මේලනය අමතා කළ දේශනය 2012 දෙසැම්බර් 22

18 වන ව්‍යවස්ථා සංශෝධනය මගින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ තිබූ "දෙවරක් ජනාධිපති ධුරයට තෝරා පත් කර ගනු ලැබූ කිසිම තැනැත්තෙක් ඉන් පසුව එම ධුරයට පත් කර ගනු ලැබීමට සුදුස්සෙක් නොවන්නේය යන වගන්තිය සංශෝධනය කරමින් ජනතාව විසින් නැවත පත් කරනු ලබන්නේ නම් ජනාධිපතිවරයා එම ධුරයට හිමිකම් කියන බවට සංශෝධනය කරන ලදී."

## අධිකරණයේ ස්වාධීනත්වය උදුරා ගැනීම:

2013 ජනවාරි මාසයේ අගවිනිසුරුවරියට එරෙහිව ඉදිරිපත් කරන ලද දෝෂාභියෝගය[116], කලක පටන් විධායකයත් අධිකරණයත් අතර පැවති බල අරගලය පුපුරා යාමක් වශයෙන් හැඳින්විය හැකියි.

මේ සම්බන්ධයෙන් එක්සත් ජාතීන් ගේ සිවිල් හා දේශපාලන අයිතිවාසිකකම් පිළිබඳ අන්තර් ජාතික සම්මුතිය ඉතා පැහැදිලිව අධිකරණයන් ඉදිරියේ කවර අයිතිවාසිකම් භුක්ති විඳින්නේ දැයි දක්වා ඇත.'සියලු දෙනාම අධිරණය සහ විනිශ්චයාධිකණ ඉදිරියේ එක සමාන වන්නාහ. සෑම කෙනෙකුටම තමාට විරුද්ධව නගා ඇති ඕනෑම සාපරාධි චෝදනාවක් සම්බන්ධව නීතිය විසින් ප්‍රතිෂ්ඨාපිත ප්‍රවීණ ස්වාධීන සහ අපක්ෂපාත විනිශ්චයාධිකරණයක් විසින් කරනු ලබන සාධාරණ හා ප්‍රසිද්ධ නඩු විභාගයකට හිමිකම් ඇත්තේය.'[117]

2012 ජුලි මාසයේ දී මන්නාරම මහේස්ත්‍රාත්වරයා විසින් තමාට කැබිනට් අමාත්‍යවරයෙකු වන රිෂාඩ් බදුර්දීන් මහතා, මුස්ලිම් හා ද්‍රවිඩ ධීවරයින් දෙපිරිසක් අතර ඇති වූ ගැටුමකට අදාළව තමා විසින් විභාග කරන නඩුවක තීන්දුව වෙනස් කරන මෙන් ඉල්ලා තර්ජනය කළ බව අධිකරණ සේවා කොමිෂන් සභාවට පැමිණිලි කොට සිටියේය.[118] මන්නාරම ප්‍රදේශයේ ක්‍රියාකාරී මානව හිමිකම් ආරක්ෂකයින් ගෙන් ඇම්නස්ටි ඉන්ටර්නැෂනල් සංවිධානයට ලැබුන තොරතුරු අනුව අමාත්‍යවරයා ගේ පළමු දුර කථනයෙන් පසුව එනම් ජුලි 18 වන දින මහේස්ත්‍රාත්වරයා ගේ තීන්දුවට විරෝධය පළ කරමින් කණ්ඩායමක් මන්නාරම මහේස්ත්‍රාත් අධිකරණය වට කරන ලදී. මෙම කණ්ඩායම මෙහෙයවන ලද්දේ ඉහත කී අමාත්‍යවරයා විසින් යැයි චෝදනා එල්ල විය. කළහකාරී ලෙස හැසුරුන කණ්ඩායම

අධිකරණ පරිශ්‍රයට ගල් මුල් ප්‍රහාරයක් එල්ල කළ අතර පොලීසිය විසින් කණ්ඩායම විසුරුවා හැරීමට කඳුළු ගෑස් ප්‍රහාරයක් එල්ල කරන ලද්දේය. මේ අතර අමාත්‍යවරයා අධිකරණ සේවා කොමිෂන් සභාව දුර කථනයෙන් අමතා මන්නාරම මහේස්ත්‍රාත්වරයා වහාම ස්ථාන මාරු කරන මෙන් යෝජනා කරන තිබුනි. මෙම යෝජනාව අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් ප්‍රතික්ෂේප කරන ලද්දේය. අමාත්‍යවරයා ගේ ක්‍රියාව විනිසුරුවන් හා නීතිවේදීන් ගේ ද දැඩි විවේචනයට ලක් වු අතර ඔවුහු ශ්‍රී ලංකාව පුරාම එක් දිනක අධිකරණ කටයුතු වර්ජනය කරමින් මහේස්ත්‍රාත්වරයාට තර්ජනය කිරීම හා ප්‍රචණ්ඩ ක්‍රියා කිරීම සම්බන්ධයෙන් අමාත්‍යවරයා වහාම අත්අඩංගුවට ගන්නා මෙන් ඉල්ලා සිටියෝය.[119] මේ අතර ජනාධිපතිවරයා ස්වාධීන පුවත් පතක් වන " සන්ඩේ ටයිම්ස්" පුවත් පතෙහි දේශපාලන ලියුම්කරු සමග කරන ලද සම්මුඛ සාකච්ඡාවකදී, අධිකරණ සේවා කොමිෂන් සභාවට අමාත්‍යවරයා ගේ මැදිහත්වීම ආරක්ෂා කරමින් මෙසේ ප්‍රකාශ කොට තිබුනි." ඒකේ කිසිම වැරැද්දක් නැහ. මිනිස්සු මන්ත්‍රී කෙනෙක් ළඟට නොයා කා ළඟට යන්නද?. පැමිණිලි කරපු කට්ටිය අතරේ නීතිඥවරයෙකුත් සිටියා."[120] ශ්‍රී ලංකාවේ අධිකරණ සේවයේ නියුතු ජ්‍යෙෂ්ඨ නීතිවේදීන් විසින් අමාත්‍ය රිෂාඩ් බදුර්දීන් මන්නාරම මහේස්ත්‍රාත් ඇන්ටනි ජුඩ්ෂන් මහතාට 2012 ජුලි 17 හා 18 වන දිනයන් හි දුරකථනයෙන් තර්ජනය කරමින් අධිකරණයේ කටයුතු වලට මැදිහත්වීම, මහේස්ත්‍රාත්වරයා මාරු කිරීමට යෝජනා කිරීම හා අධිකරණ සේවා කොමිෂන් සභාවේ ලේකම්ට තර්ජනය කිරීම සම්බන්ධයෙන් අධිකරණයට අපහාස කිරීම යටතේ නඩු පවරනු ලැබූ අතර එම නඩුව නැවත විභාග කිරීම 2013 ජුනි 24 දිනට නියම කොට ඇත.[121]

මේ අතර ඉහත කී සිද්ධිය සම්බන්ධයෙන් විස්තරාත්මතක තොරතුරු පළ ශ්‍රී ලංකා මීරර් වෙබ් අඩවි කාර්යාලය අපරාධ පරීක්ෂණ දෙපාර්තුමේන්තුව විසින් මුද තබන ලදී[122]. ඒ සම්බන්ධයෙන් ඉදිරිපත් කළ මූලික අයිතිවාසිකම් පෙත්සම විභාග කිරීමට අධිකරණය අවසර දෙන ලද්දේය.[123] මෙම සිද්ධිය සම්බන්ධයෙන් මහත් ආන්දෝලනයක් හට ගත් අතර[124] සිවිල් සමාජ ක්‍රියාකාරීන් අධිකරණයේ ස්වාධීනත්වයට හානියක් වේ යැයි බිය සැක පළ කරන්නට පටන් ගත්තෝය.[125]

2012 සැප්තැම්බර් 18 වන දින ජනාධිපතිවරයා විසින් ජාතික හදිසි වැදගත් කමක් ඇති පණත් කෙටුම්පතක් වශයෙන් හඳුන්වන ලද "දිවි නැගුම" පණත් කෙටුම්පනත පිළිබඳ සිය තීරණය ප්‍රකාශ කරමින් ශ්‍රේෂ්ඨාධිකරණය එම පණත් කෙටුම්පත පාර්ලිමේන්තුවෙන් හා සියළුම පළාත් සභා වලින්ද නීතියක් බවට පත් විමට පෙර සම්මත විය යුතු යැයි කියා සිටියේය.

මෙම පනත හඳුන්වන ලද්දේ 1995 අංක 30 දරන පනත මගින් පිහිටුවන ලද ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරිය, 1996 අංක 18 දරන පනත මගින් පිහිටුවන ලද ශ්‍රී ලංකා දක්ෂිණ සංවර්ධන අධිකාරිය සහ 2005 අංක 26 දරන පනත මගින් පිහිටුවන ලද ශ්‍රී ලංකා උඩරට සංවර්ධන අධිකාරිය යන අධිකාරීන් ඒකාබද්ධ කිරීම මගින් දිවි නැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව යනුවෙන් හඳුන්වනු ලබන සහ සඳහන් කරනු ලබන දෙපාර්තමේන්තුවක් පිහිටුවීම සඳහා ද; ග්‍රාමීය මට්ටමින් දිවි නැගුම ප්‍රජාමූල සංවිධාන පිහිටුවීම සහ දිස්ත්‍රික් මට්ටමින් සහ ජාතික මට්ටමින් සම්බන්ධීකරණ ජාලයක් සඳහා විධිවිධාන සැලැස්වීම සඳහා ද; දිවි නැගුම ප්‍රජාමූල බැංකු සහ දිවි නැගුම ප්‍රජාමූල බැංකු සමිති පිහිටුවීම සඳහා ද; 1995 අංක 30 දරන ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරිය පනත, 1996 අංක 18 දරන ශ්‍රී ලංකා දක්ෂිණ සංවර්ධන අධිකාරිය පනත සහ 2005 අංක 26 දරන ශ්‍රී ලංකා උඩරට සංවර්ධන අධිකාරිය පනත ඉවත් කිරීම සඳහා ද; ඒ හා සම්බන්ධ හෝ ඊට ආනුෂංගික කරුණු සම්බන්ධයෙන් විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනතක් වශයෙනී. යෝජිත දිවිනැගුම සංවර්ධන දෙපාර්තුමේන්තුව ජනාධිපති සොහොයුරු බැසිල් රාජපක්ෂ විසින් අමාත්‍යධුරය දරන ආර්ථික සංවර්ධන අමාත්‍යංශය යටතට පත් කර තිබුනී. ආණ්ඩුව අධිකරණයේ තීරණය පිළිබඳ සතුටට පත් නොවු අතර බැසිල් රාජපක්ෂ අමාත්‍යවරයා ද සහභාගි වු ආණ්ඩුව විසින් ම සංවිධානය කරන ලද ජනරැළි පාර්ලිමේන්තුව අවට පත් වමින් ඊට ජනතාව ගේ පූර්ණ සහයෝගය ඇති බව පෙන්වීමට උත්සාහ දරන ලදි.[126]

අධිකරණයේ ස්වෛරීභාවය ප්‍රදර්ශනය කළ මෙම සිදුවීමට සමාන්තරව සිදු වූ වැදගත් සිදුවීමක් නම් දිවි නැගුම පණත සම්මත කළ දිනම අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් පුවත් පත් නිවේදනයක් නිකුත් කරමින් " අධිරකණයට හා අධිකරණ සේවා කොමිෂන් සභාවට මුද්‍රිත හා විද්‍යුත් මාධ්‍යයන් විසින් කරනු ලබන පදනම් විරහිත විවේ චන පිළිබඳව" චෝදනා කළ අතර "එය අධිකරණයත් හා අධිකරණ සේවා කොමිෂන් සභාවත් පහත් කොට සැලකීමේ කුමන්ත්‍රණයක්" බවත් එහි අවසාන අරමුණ අධිකරණයේ හා අධිකරණ කොමිෂන් සභාවේ ස්වාධීනත්වය හා නීතියේ ආධිපත්‍ය විනාශ කිරීම බවත්" ප්‍රකාශ කළේය.[127] අධිකරණ සේවා කොමිෂන් සභාවේ ලේකම් මංජුල තිලකරත්න මහතා විසින් නිකුත් කළ ප්‍රකාශයෙහි තවදුරටත් මෙසේ ද සඳහන් විය." අධිකරණ සේවා කොමිෂන් සභාව විවිධ තරාතිරමේ පුද්ගලයින් ගේ තර්ජන හා අවහිර කිරීම් වලට භාජනය වෙයි". 2012 සැප්තැම්බර් මස අවසාන භාගයේ දී මාධ්‍ය සාකච්ඡාවකදී " අධිකරණ සේවා කොමිෂන් සභාව වෙනුවෙන් තමා නිකුත් කළ නිවේදනයේ සඳහන් කරුණු වලට අමතරව යමක් තමාට කිව නොහැකි නමුත් එම ප්‍රකාශය නිකුත් කිරීමෙන් පසු තමාට පුද්ගලික අවදානමක් ඇතැයි හැඟෙන බව" කියා සිටියේය.[128]

2012 සැප්තැම්බර් 21 දින, සියළුම විනිසකරුවන් ගෙන් සමන්විත අධිකරණ සේවා සංගමය ප්‍රකාශයක් නිකුත් කරමින් " අධිකරණ සේවා කොමිෂන් සභාවේ ලේකම් විසින් 2012 සැප්තැම්බර් මස 8 වන දින නිකුත් කරන ලද නිවේදනය කොමිෂන් සභාවේ නිල කටයුතු සම්බන්ධයෙන් විවිධ පාර්ශවයන් ගෙන් කෙරෙන මැදිහත් වීම් පිළිබඳ සිය අසතුට ප්‍රකාශ කරන අතරම අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් නීතියේ ආධිපත්‍ය හා අධිකරණයේ ස්වාධීනත්වය ආරක්ෂා කිරීම පිණිස ගන්නා උත්සාහය අගය කරන බව ද සඳහන් කළේය. මෙම කාර්යන් සම්බන්ධයෙන් අධිකරණ සේවා කොමිෂන් සභාව ගන්නා ලබන කවර පියවරක් සම්බන්ධයෙන් වුවද සිය සංගමයේ උපරිම සහයෝගය ලැබෙන බවද එම ප්‍රකාශයේ තවදුරටත් සඳහන් වුයේය."[129]

## අධිකරණ සේවා කොමිෂන් සභාවේ ලේකම් මංජුල තිලකරත්න මහතාට පහර දීම:

2012 ඔක්තෝබර් මස 7 දින එනම් අධිකරණ සේවා කොමිෂන් සභාවේ ලේකම්වරයා වශයෙන් මංජුල තිලකරත්න මහතා සිය ප්‍රකාශය නිකුත් කොට සති තුනක් ඉක්ම යාමටත් පෙර ඔහුට පිස්තෝලයක් පෙන්වා ඔහු වාඩිවී සිටී මෝටර් රථයෙන් එළියට ගෙන පහර දීමට තැත් කර තිබුනී. ඔක්තෝබර් 8 වන දිවයින් පුරා සියළුම විනිසුරුවන් හා නීතිවේදීන් උසාවි කටයුතු වලින් වැළැකී මෙම සිද්ධියට සිය විරෝධය පළ කරන ලදී. කොළඹ මහාධිකරණ සංකීර්ණය ඉදිරිපිට පැවති විරෝධතාවයට සිය ගණනක් නීතිවේදීන් සහභාගි වූ අතර, ඔවුහු සංකේතාත්මකව මිනී පෙට්ටියක අනුරුවක් අධිකරණ භූමියෙහි පුළුස්න ලැබුවෝය[130].

## අගවිනිසුරු ශ්‍රීයානී බණ්ඩාරනායක මහත්මීයට එරෙහි දෝෂාභියෝගයः

2013 ජනවාරි මාසයේ දී අගවිනිසුරුවරිය ගේ පෞද්ගලික හා වෘත්තීය විෂමාචාර පැවැත්ම පදනම් කොට ගෙන පාර්ලිමේන්තුව විසින් ඇයට විරුද්ධව සම්මත කරන ලද දෝෂාභියෝග යෝජනාව විධායකය විසින් නව ව්‍යවස්ථා අර්බුදයක් නිර්මාණය කිරීමක් වශයෙන් සලකනු ලැබින.2012 නොවැම්බර් 1 වන දින එක්සත් ජනතා නිදහස් සන්ධානයේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරු 117 දෙනෙකු විසින් අත්සන් කරන ලැබූ අගවිනිසුරුවරියට එරෙහි දෝෂාභියෝග යෝජනාව පාර්ලිමේන්තුවේ කථානායකවරයාට බාර දෙන 2012 නොවැම්බර් 7 වන දින කථානායකවරයා අගවිනිසුරුවරියට එරෙහිව චෝදනා 14 ක් සහිත දෝෂාභියෝගයක් තමා වෙත බාර දී ඇතැයි පාර්ලිමේන්තුවට ප්‍රකාශ කළේය. ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුන් 7 දෙනෙකු

ගෙන් හා විරුද්ධ පක්ෂ මන්ත්‍රීන් 4 දෙනෙකු ගෙන් සංයුක්ත සාමාජිකියින් 11 දෙනෙකු ගෙන් සමන්විත පාර්ලිමේන්තු තේරීම් කාරක සභාව නොවැම්බර් මාසයේ දී නම් කරන ලදී. අගවිනිසුරුවරියට එරෙහිව ඇති චෝදනා විභාගය නොවැම්බර් මස 23, දෙසැම්බර් 4 හා 6 වන දිනයන් හි විභාග කළ අතර, තේරීම් කාරක සභාවේ ක්‍රියාපටිපාටියට විරෝධය පළ කරමින් අගවිනිසුරුවරිය තේරීම් කාරක සභාවේ කටයුතු වලින් දෙසැම්බර් 6 වන දින ඉවත් වුවාය. දෙසැම්බර් 7 වන දින විරුද්ධ පක්ෂ සාමාජිකයින් 4 දෙනා ද කාරක සභාවේ වැඩ කටයුතු වලින් ඉවත් වීය. තේරීම් කාරක සභාවේ වාර්තාව 2012 දෙසැම්බර් 8 වන දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී. අගවිනිසුරුවරියට එරෙහිව නගා තිබූ චෝදනා 14න් 5ක් පමණක් තේරීම් කාරක සභාව සැලකිල්ලට ගෙන තිබූ අතර ඇය සිය ධූරයෙන් ඉවත් කිරීමට එම චෝදනා ප්‍රමාණවත් බව තේරීම් කමිටුවේ මතය විය.

2013 ජනවාරි 01 දින ශ්‍රේෂ්ඨාධිකරණය විසින් අගවිනිසුරුවරියට එරෙහිව චෝදනා විභාග කිරීමට පාර්ලිමේන්තු කාරක සභාවට බලයක් නැති බවත් දෝෂාභියෝගය ව්‍යවස්ථානුකූල නොවන බවටත් තීන්දු කළේය. අගවිනිසුරුවරිය විසින් පාර්ලිමේන්තු කාරක සභාවේ තීරණයට විරුද්ධව අභියාචනා අධිකරණය වෙත ඉල්ලීමක් කළ අතර 2013 ජනවාරි 7 දින අභියාචනාධිකරණය දෝෂාභියෝගය ප්‍රතික්ෂේප කළේය.

අගවිනිසුරුවරියට එරෙහි දෝෂාභියෝගය 2013 ජනවාරි 10 හා 11 වන දිනයන් හි පාර්ලිමේන්තුවේ විවාදයට භාජනය කොට සම්මත කරන ලදී. ජනවාරි 13 දින ජනාධිපතිවරයා අගවිනිසුරුවරිය ධූරයෙන් ඉවත් කිරීමේ පාර්ලිමේන්තු යෝජනාවට සිය අනුමැතිය දෙන ලද්දේය[131] [132] ᵖ අගවිනිසුරුවරිය ඉවත් කිරීමේ ක්‍රියාවලියේ දී ඇයට සිය කරුණු ඉදිරිපත් කිරීමට ප්‍රමාණවත් අවස්ථාවක් ලබා නොදුන් බැවින් ඉහත කී තීරණ පක්ෂපාතී මෙන්ම අධිකරණයේ ස්වාධීනත්වයට හානි කර බැවින් වර්තමාන අගවිනිසුරුවරිය වෙනුවට පත් කරන අනුප්‍රාප්තික විනිසුරුවරයා වර්ජනය කිරීමට 2012 දෙසැම්බර් 15 දින රැස්වූ ශ්‍රී ලංකා නීතිඥ සංගමය විසින් තීරණය කළේය. නමුත් පසුව සිය සේවාදයකයින් ගේ හා අධිකරණ කටයුතු වල අඛණ්ඩතාවය ආරක්ෂා කිරීම පිණිස ශ්‍රී ලංකා නීතිඥ සංගමය සිය තීරණය වෙනස් කරමින් අධිකරණ කටයුතු වලට සහභාගි වීමට තීරණය කළේය.[133]

ඉහත කී සංසිද්ධීන් සම්බන්ධයෙන් ෆරයිඩේ ෆෝරම් වෙනුවෙන් ප්‍රකාශයක් නිකුත් කළ ජයන්ත ධනපාල හා සූරියා වික්‍රමසිංහ මෙසේ සඳහන් කළේය.

"දේශපාලනික අභිලාෂයන් විසින් මෙහෙයවනු ලැබූ දෝෂාභියෝගය විසින් අගවිනිසුරුවරියට ස්වභාවික නීතියේ පිළිසරණ ලැබෙන බවට සහතිකයක් නොවූ අතර ඇයට ඉතාමත් රළු ලෙස පාර්ලිමේන්තු තේරීම් කාරක සභා සැසි වාර වලදී සළකනු ලැබුවාය. එමඟින් පාර්ලිමේන්තුව විසින් ශ්‍රේෂ්ඨාධිකරණය සතු බලතල හැල්ලුවකට ලක් කළේය. ස්වාධීනව පැන නැගුන විරෝධතා ව්‍යාපාරයන්ට පොලීසිය බලා සිටියදීම ආණ්ඩු පක්ෂයේ දේශපාලන මැරවරයන් පහර දෙන ලදී. මේ සියල්ලකම මෙරට පුරවැසිභාවයට පාලක පක්ෂය විසින් එල්ල කරන ලද සැලසුම් සහගත ප්‍රහාරයක් පිළිබඳ ආදර්ශයක් වෙයි. බල බේදීමේ මූල ධර්මයෙහි එක් අංගයක් පාර්ලිමේන්තු ස්වාධිපත්‍යයෙහි රැඳී තිබෙන අතර මෙම දෝෂාභියෝගය පාර්ලිමේන්තු වනාහි අන් කිසිවක් නොව විධායකයේ වලිගයක් බව සනාථ කරයි"[134] එක්සත් ජාතීන් ගේ සංවිධානයේ මානව හිමිකම් කොමසාරිස්වරිය ගේ ප්‍රකාශකයා වන රූපට් කෝල්විල් 2013 ජනවාරි 18 වන දින ප්‍රකාශයක් කරමින් මෙසේ කිවේය. " විධායක බලය අයුතු ලෙස භාවිතා කිරීම පිළිබඳ දීර්ඝ ඉතිහාසයක් තිබෙන රටකි ශ්‍රී ලංකාව. ස්වාධීන සංවරණ හා තුලන ක්‍රමයක මූලිකාංගය වන අධිකරණ බලතල ඩැහ ගැනීම පිණිස තබන ලද මෙම පියවර සියළුම ශ්‍රී ලාංකිකයින් ගේ අවධානයට යොමුවිය යුතු කාරනයකි."[135]

## අභියාචනාධිකරණයේ විනිසුරුවන් වන එස් ස්කන්ධරාජා හා අනිල් ගුණරත්න යන විනිසුරුවන්ට එරෙහි තර්ජනඃ

දෝෂාභියෝගයට එරෙහිව ක්‍රියාකළ නීතිවේදීන්ට අනුව දෝෂාභියෝගය පිළිබඳ අභියාචන අධිකරණයේ තීන්දුව ප්‍රකාශයට පත් කිරීමට පෙර දින සවස නිර්නාමික දුරකථන ඇමතුමකින් අභියාචන අධිකරණයේ සභාපති විනිසුරු එස් ස්කන්ධරාජා ඇමතූ පුද්ගලයෙක් ඔහුට පසු දින අධිකරණයට නොපැමිණෙන ලෙස කියා සිටියේය. මෙබඳුම දුරකථන ඇමතුමක් අභියාචනා විනිසුරු අනිල් ගුණරත්න වෙතට ලැබී තිබුන බව වාර්තා විය. මෙම විනිසුරුවන් දෙපොලම මෙම සිද්ධිය පිළිබඳව පොලිසියට පැමිණිලි කොට තිබුනි.[136]

මෙම දෝෂාභියෝගය නැවත වරක් ආණ්ඩුව අධිකරණයේ ස්වාධීනත්වය ආරක්ෂා කර ගැනීම පිණිස විනිසුරුවන් මෙන්ම නීතිවේදීන් ද මහහඟට කැඳවන ලදී. 2013 ජනවාරි 13 දින දෝෂාභියෝගයට එරෙහිව ශ්‍රී ලංකා නීතිඥ සංගමය විසින් සංවිධානය කළ විරෝධතා පෙළපාලියකට පොලු හා මුගුරු රැගත් කණ්ඩායමක් විසින් පහර දෙන ලද බව වාර්තා විය[137].

ආණ්ඩුවේ මාධ්‍යයන් විසින් ද දෝෂාභියෝගය විවේචනය කළ තැනැත්තන්ට දැඩි විවේචන එල්ල කරන ලදී.[138] ආණ්ඩුව සතු ඩේලි නිව්ස් පුවත්පත ජනවාරි 17 දින පළ කළ වාර්තාවක් මගින් ස්වාධීන නීතිවේදීන් යැයි කියනු ලැබූ කණ්ඩායමක් කනිෂ්ඨ නීතිවේදීන් ගෙන් ඉල්ලීමක් කරමින් ( අධිකරණයේ ස්වාධීනත්වය පිණිස වන) නීතිඥ සාමූහිකය නම් ඊනියා සංවිධානය සමග ගණුදෙනු කොට සිය වෘත්තීය ගෞරවයට හානි කර නොගන්නා මෙන් ඉල්ලා සිටින ලදී." එම ලිපිය විසින් නීතිඥ සාමූහිකය නම් සංවිධානය විවිධ රාජ්‍ය නොවන සංවිධාන විසින් අරමුදල් සපයන හා බංකොලොත් දේශපාලනඥයින් මෙහෙයවන සංවිධානයකි"

2013 ජනවාරි 13 දින හිටපු නීතිපති හා ජනාධිපති උපදේශක මෝහාන් පීරිස් මහතා 43 වන අගවිනිසුරුවරයා වශයෙන් දිවුරුම් දෙන ලදී. මොහාන් පීරස් මහතා මෙම තනතුරුට පත් කිරීම සම්බන්ධයෙන් ඇම්නස්ටි ඉන්ටර්නැෂනල් සංවිධානය සිය කණස්සල්ල පළ කරන අතර ඔහු කොපමණ දුරට විශේෂයෙන්ම මානව හිමිකම් සම්බන්ධයෙන් ස්වාධීනව කටයුතු කිරීමට හැකියාවක් ඇත්තෙක් දැයි එම සංවිධානය ප්‍රශ්න කරයි. නීතිපතිවරයා වශයෙන් මෙන්ම ජනාධිපති උපදේශකවරයා වශයෙන් ද ඔහු කිහිප අවස්ථාවක්ම ජිනිවා හි මානව හිමිකම් කවුන්සිලය ඉදිරියේ රජය නියෝජනය කරමින් ආණ්ඩුවට එරෙහිව එල්ලවන මානව හිමිකම් උල්ලංඝණයන් හා යුද්ධ අපරාධ පිළිබඳ චෝදනා වලින් ආණ්ඩුව ගලවා ගැනීම පිණිස අප්‍රතිහත ධෛර්‍යකින් කටයුතු කළේය. එපමණක් නොව ඔහු වධහිංසා වලට එරෙහි එක්සත් ජාතීන් ගේ කමිටුව ඉදිරියේ සාක්ෂි දෙමින් එක් අවස්ථාවක දී අතුරුදහන් වූ මාධ්‍යවේදී ප්‍රදීප් එක්නැලිගොඩ යුරෝපයේ ජීවත් වන්නේ යැයි අසත්‍ය ප්‍රකාශයක් කළේය.[139]

## (සිවිල් සමාජය) කැබලි කිරීම විවිධාංගීකරණය කෙරෙයිඃ

## අතුරුදහන් වූ මාධ්‍යවේදියා ප්‍රගීත් එක්නැලිගොඩ

කාටුන් ශිල්පියෙක්, දේශපාලන විචාරකයෙක් හා පුවත්පත් කලාවේදියෙක් වූ ප්‍රගීත් එක්නැලිගොඩ 2010 ජනාධිපතිවරණයට දින දෙකකට පෙර අතුරුදහන් වුයේය. මෙම සිද්ධියට දින දෙකකට පෙර ඔහු විසින් ජනාධිපති අපේක්ෂකයින් දෙදෙනා වන මහින්ද රාජපක්ෂ හා සරත් ෆෝන්සේකා සංසන්සන්දනය කරමින් ලිපියක් පළ කළ අතර එහි නිගමන සරත් ෆෝන්සේකාට වාසිදයක අන්දමින් ඉදිරිපත් කොට තිබුනි. ඇම්නස්ටි ඉන්ටර්නැෂනල් සංවිධානය ඔහු බලහත්කාර අතුරුදහන් කිරීමකට ගොදුරුවන්නට ඇතැයි සැක කරයි. ප්‍රගීත් අතුරුදහන් වුයේ 2010 ජනවාරි 24 වන දින ඔහු සේවය කළ ලංකා ඊ නිව්ස් කාර්යාලයේ සේවය නිම කොට හෝමාගම පිහිටි සිය නිවසට ගමන් කරමින් සිටින අතරවාරයේදීය.

ජනවාරි 25 දින ඔහුගේ බිරිඳ සන්ධ්‍යා එක්නැළිගොඩ විසින් හෝමාගම පොලිස් ස්ථානයට පැමිණිලි කළ අතර සිය සැමියා බලහත්කාරයෙන් අතුරුදහන් කරන ලද්දේ ඔහු ආණ්ඩුව විවේචනය කළ නිසායැයි විශ්වාස කරයි. ඇය තවදුරටත් සිය සැමියා ගේ අතුරුදහන්විම හා ඔහු විසින් ශ්‍රී ලංකා යුද්ධ හමුදව විසින් 2008 දී රසායනික අවි භාවිතා කළ බව සනාථ කරන සාක්ෂි ගවේෂණ කිරීමත් අතර සම්බන්ධයක් ඇතැයි ද විශ්වාස කරයි.[140]

ප්‍රගීත් අතුරුදහන් විමට දින කිහිපයකට පෙර ඔහු තමාගේ මිතුරන්ට තමා පිටු පස ඔත්තුකරුවන් සැරිසරන බව දැනි ගොස් තිබේ යැයි ප්‍රකාශ කොට තිබුනි. ඔහු ගේ අසල්වැසියන් විසින් ද ඔහු ගේ නිවස අසල අංක තහඩු නොමැති සුදු වෑන් රියක් ගැවසෙමින් තිබු බව දන්වා තිබුනි. ප්‍රගීත් මීට කලින් වතාවක් ද සුදු වෑන් රියකින් පැමිණි කණ්ඩායමක් ඔහු පැහැර ගෙන ගිය අතර පසුව මුද හැර තිබුනි.[141]

සන්ධ්‍යා එක්නැළිගොඩ විසින් හෝමාගම මහේස්ත්‍රාත් අධිකරණයේ හබයාස් කොෆුස් පෙත්සමක් ගොනු කරමින් අතුරුදහන් සිය සැමියා පිළිබඳ තොරතුරු රජයෙන් ඉල්ලා සිටියේය. මේ අතර 43වන අග විනිසුරු වශයෙන් පත් කළ හිටපු නීතිපතිවරයා හා ජනාධිපති උපදේශක මොහාන් පීරිස් මහතා එක්සත් ජාතීන් ගේ සංවිධානයේ වධහිංසා වලට එරෙහි කමිටුව ඉදිරියේ 2011 නොවැම්බර් මස ලංකා රජය වෙනුවෙන් කරුණු දක්වමින් ප්‍රගීත් ශ්‍රී ලංකාවෙන් පිටමංව විදේශීය රටක ජිවත් වන බවත් ඔහු ගේ අතුරුදහන් විම "බේගලයක්" බවත් කියා සිටියේය. 2012 ජනවාරි මාසයේ දී හෝමාගම මහේස්ත්‍රාත්වරයා මොහාන් පීරිස් මහතාට අධිකරණය ඉදිරියේ පෙනී සිටින්නට සිතාසි නිකුත් කළ අතර නීතිපතිවරයාගේ දෙපාර්තුමේන්තුව විසින් එම නියෝගය නීතියානුකුල නොවන බව කියා සිටි නමුත් අභියාචන අධිකරණය හෝමාගම මහේස්ත්‍රාත්වරයාට එබඳු නියෝගයක් නිකුත් කිරීමට බලය තිබෙන බවට තීන්දු කරනු ලැබීය. ඊට ප්‍රතිචාරයක් වශයෙන් අධිකරණය ඉදිරියේ පෙනී සිටි මොහාන් පීරිස් මහතා මෙසේ කියා සිටියේය." ඔහු ජීවතුන් අතර ඉන්නවාද නැද්ද යන්න මා දන්නේ නෑ. ඔහු පිළිබඳව මට ලැබුන තොරතුරු සත්‍යයදැයි දන්නේ දෙවියන් වහන්සේ පමණි. මම හිතන්නේ නැහ ආන්ඩුව වත් ඔහු ඉන්නා තැනක් දන්නා බව". ප්‍රගීත් රට හැර ගිය බව තමාට කීවේ කවුරු විසින් කොතනදී දැයි තමාට මතක නැති බවත් ඔහු තවදුරටත් කියා සිටියේය.[142]

ප්‍රගීත් එක්නැළිගොඩ සේවය කළ ඊ නිව්ස් වෙබ් අඩවි කාර්යාලය 2011 පෙබරවාරි 11 දින නාඳුනන කණ්ඩායමක් විසින් ගිනිබත් කරන ලදී. මෙම ප්‍රහාරයේ දී එම මාධ්‍ය කාර්යාලය සතුව පැවති බොහෝ තොරතුරු විනාශ විය. ඊ නිව්ස් හි ජ්‍යෙෂ්ඨ මාධ්‍යවේදියකු වු බෙනට් රූපසිංහ, ඉහත කී සිද්ධියට සැක පිට අත්අඩංගුවට ගත් තැනැත්තෙකුට තර්ජනය කිරීමේ චෝදනාව මත 2011 මාර්තු මස අත්අඩංගුවට ගෙන පසුව නිදහස් කළේය.

## සන්ඩේ ලිඩර් පුවත්පතේ ප්‍රධාන කර්තෘ ෆ්‍රෙඩ්රිකා ජැන්ස් :

එවකට සන්ඩේ ලිඩර් පුවත්පතෙහි කර්තෘවරිය වශයෙන් සිටි ෆ්‍රෙඩ්රිකා ජැන්ස් විසින් 2009 දෙසැම්බර් මස ජනරාල් සරත් ෆොන්සේකා සමග කළ සම්මුඛ සාකච්ඡාවක් "ගෝඨා උන්ට වෙඩි තියන්න කිව්වා" ජනරාල් සරත් ෆෝන්සේකා යන මැයෙන් පළ කළේය.[143] මෙම සම්මුඛ සාකච්ඡාව සරත් ෆෝන්සේකාට තුන් අවුරුදු සිර දඬුවමක් නියම කිරීමට පදනම් වු කර ගත්තේය. පෙඩ්රිකා ජැන්ස් ට අවස්ථා කිහිපයක දීම අධිකරණයට අපහාස කිරීමේ චෝදනාව මත නඩු පවරනු ලැබු අතර ඉන් එක් නඩුවක් පවරා තිබුනේ ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම් ගෝඨාභය රාජපක්ෂ විසිනි.

2012 ජුලි මාසයේ දී සන්ඩේ ලීඩර් පුවත්පත "ගෝඨා යකා නටයි" මැයෙන් පුවතක් පළ කරන ලදී. එම පුවතට අඩංගු වුයේ පෙඩ්රිකා ජැන්ස් හා ගෝඨාභය රාජපක්ෂ අතර සිදුවු දුරකථන සංවාදයක මුද්‍රිත සටහන්ය. එම සටහන් වලට අනුව ගෝඨාභය රාජපක්ෂ පෙඩ්රිකා ජැන්ස් ට ඉතාමත්

අශෝභන හා අසභ්‍ය භාෂාවකින් බැන වැදී ඇත. එම සංවාදය මෙසේය.

"මම උඹව හිරේ දනවා. උඹ මේ රට බෙදන්නට දඟලන පට්ට ......... පත්තරකාරියක්. බොරුවට නියම බෞද්ධයෝ වගේ පෙනී සිටිනවා. ඇමෙරිකන් තානාපති, එන් ජී ඕ කාරයෝ විතරක් නෙමෙයි පාක්‍යසෝතිත් උඹට ගෙවනවා. උඹ ගු  කන ඊරියක්. හු......... පත්තරකාරියක්. උඹට මිනිස්සු ගහලා මරනවා. උඹට හෙන ගහණවා."**ආරක්ෂක ලේකම් ගෝඨාභය රාජපක්ෂ හා මාධ්‍යවේදිනී ෆ්‍රෙඩ්රිකා ජැන්ස් අතර දුරකථන සංවාදය** [144]

මාධ්‍යවේදිනියක් වශයෙන් නොයෙකුත් අඩන්තේට්ටම් වලට භාජනය වූ ඇය සන්ඩේ ලීඩර් පුවත්  පතෙහි අයිතිය රාජපක්ෂ පවුලට හිතවත් ව්‍යවසායකයෙකු අතට පත් වීමෙන්  පසුව සේවයෙන් පහ කරන ලද්දේ 2009 දී ඇය ශ්‍රී ලංකාව හැර ගියාය. අනතුරුව සන්ඩේ ලීඩර්  පුවත් පතෙහි නව පාලනය විසින් ආරක්ෂ ලේකම් ගෝඨාභය රාජපක්ෂ ගෙන් ඉහත කී ලිපිය පළ කිරීම සම්බන්ධයෙන් සමාව ඉල්ලා දැන්වීමක් පළ කරන ලද්දේය.

නිතරම සංවේදී පුවත් පළ කිරීම සම්බන්ධයෙන් මහත් ප්‍රසිද්ධියක් ඉසිලූ ඇය සන්ඩේ ලීඩර් පුවත් පතින් ඉවත් වූ පසු අවස්ථා දෙකකදීම මෝටර් බයිසිකලයකින් තමා හඹා පැමිණි බවත් තර්ජනාත්මක දුරකථන ඇමතුම් ලැබුන බවත් කියා සිටියාය. තමාගේ ගමන් බලපත්‍රය තහනම් කොට අත්අඩංගුවට ගැනීමට සූදානම් වන බව දැන ගත් වහාම ඇය ශ්‍රී ලංකාව හැර යන්නට තීරණය කළාය. 2013 ජනවාරි මාසයේ දී අල් ජසීරා මාධ්‍ය ජාලය සමඟ පැවත්වූ සම්මුඛ සාකච්ඡාවකදී ඇය මෙසේ කීවාය. " 2009 මැයි මාසයේ යුද්ධය අවසාන වීමෙන් පසු  පැහැදිලිවම ශ්‍රී ලංකාවේ මාධ්‍ය රාජ්‍ය පාලනයට නතු වීමේ ප්‍රවණතාවයක් පවතී.යම්කිසි මාධ්‍ය ආයතනයක් රජයේ විය හැකියි. එසේත් නැත්නම් පෞද්ගලික අංශයේ විය හැකියි. නමුත් ඒ සියල්ලම රාජ්‍ය පාලනයට යටත්ය.[145] ශ්‍රී ලංකාවේ අනාගතය පිළිබඳ ඇයගේ තක්සේරුවට අනුව ඉතාමත් අඳුරුය.[146]

## අතුරුදහන් වුවන් ගේ පවුල් එකතුව:

යුද්ධය අවසාන වීමෙන් අනතුරුව හා විශේෂයෙන්ම ශ්‍රී ලංකාවේ උගත් පාඩම් හා සංහිඳියා කොමිෂන් සභාවේ[147] වැඩ කටයුතු ආරම්භ වීමෙන් පසු යුද්ධය නිසා අතුරුදහන් වුවන් ගේ පවුල් වල සාමාජික සාමාජිකාවන් විවිධ මාදිලියේ විරෝධතා ඔස්සේ සංවිධානය වන්නට පටන් ගෙන තිබුනී. අවුරුදු 26ක් තිස්සේ පැවති යුද්ධය නිසා ශ්‍රී ලංකාවේ සෑම පළාතකම පාහේ විශේෂයෙන්ම උතුරු හා නැගෙනහිර පළාත් වල දහස් ගණනක් අතුරුදහන් වූ බවට එම පවුල් වල ආසන්නම ඥාතීන් ගෙන් පැමිණිලි ලැබී තිබේ. බොහෝ දෙනෙක් යුද්ධයේ දී මිය යන්නට ඇති අතර තවත් දහස් ගණනක් ආරක්ෂක හමුදා විසින් අත් අඩංගුවට ගත් අතර නැවත කිසි දිනෙක දක්නට නොලැබීන. අතුරුදහන් වුවන් ගේ ඥාතීන් විසින් කරනු ලබන විමසීම් වලට ප්‍රතිචාර දැක්වීමට බලධාරීන් අසමත් වූ අතර ඔවුන් අත් අඩංගුවට ගනු ලැබුවේ ද හා රඳවා තබා ඇත්නම් ඒ කවර ස්ථානයක දැයි කීමට ඔවුහු අසමත් වුවෝය. අතුරුදහන් වුවන් ගේ පවුල් වල ඥාතීන් දහසකට ආසන්නන සංඛ්‍යාවක් උගත් පාඩම් හා සංහිඳියා කොමිෂම වෙත පිළිසරණක් සොයා  පැමිනි අතර මන්නාරම වවුනියාව හා කොළඹ පවත්වන ලද විරෝධතාවන්ට සහභාගි වෙමින් සංවිධානය වන්නට උත්සාහ දරන ලදී.[148]

ශ්‍රී ලංකාවේ මානව හිමිකම් ආරක්ෂකයෙක් වන රුකී ප්‍රනාන්දු ප්‍රකාශ කරන ආකාරයට අතුරුදහන් වුවන් ගේ පවුල් වල සාමාජික සාමාජිකාවන් නිරන්තරයෙන්ම පීඩනයට මැදි වෙයි. "අතුරුදහන් වුවන් ගේ පවුල් වල ඥාතීන් නිතරම අපහසුතාවයට හා අවමානයට ලක් කරයි. මෙම තත්වයට සත්‍ය හා යුක්තිය වෙනුවෙන් මෙම කණ්ඩායම් වලට සහයෝග දුන් මානව හිමකම් ආරක්ෂකයින් පුවත් පත් කලාවේදීන් දේශපාලනඥයින් ආගමික නායකයින් හා නීතිවේදීන් ද මුහුණ දෙයි. මේ ගණයට වැටෙන බොහෝ දෙනෙක් ජාති ද්‍රෝහීන් එසේත් නැත්නම් ත්‍රස්තවාදීන් වශයෙන් ලේබල් කරයි. අතුරුදහන් වුවන් අනුස්මරණය කිරීම හා උද්ඝෝෂණ ව්‍යාපාර

එක්කෝ කඩාකප්පල් කිරීම එසේත් නැත්නම් ජාතික ආරක්ෂාව නමින් තහනම් කරනු ලබයි. මේබඳු වැඩ සටහන් සංවිධායකයින් පමණක් නොව සහභාගිකයින් පවා තර්ජන වලට හා අත් අඩංගුවට ගැනීම් වලට ලක් වෙයි.[149]

2012 දෙසැම්බර් 10 වන දින මන්නාරම අවට පදිංචි 300 කට ආසන්න පිරිසක් මානව හිමිකම් දිනය නිමිති කොට ගෙන අතුරුදහන් වුවන් ගේ පවුල් එකතුවක් ගොඩ නැගීම අරමුණු කොට ගෙන රැස්වීමක් හා පා ගමනක් සංවිධානය කරන ලදි. මෙම රැස්වීමට පූජක පක්ෂය දේශපාලනඥයින් හා සිවිල් සමාජ ක්‍රියාකාරින් සහභාගි වුවෝය. රැස්වීම පැවැත්වීමට බලධාරින් අවසර දුන් නමුත් අනවසරයෙන් රැස්වීමට ඇතුල් වූ බුද්ධි අංශ නිලධාරීන් රැස්වීමේ සහභාගිකයින් වීඩියෝ පටි ගත කරන ලදී. මෙය රැස්වීම් සවිධායකයින් ගේ විරෝධය මධ්‍යයේ කරන ලද්දේ සංවිධායකයින් හා සහභාගිකයන් බිය ගැන්වීම පිණිස බව ඉතාමත් පැහැදිලි විය.

## රාමසාමි ප්‍රභාහරන් අතුරුදහන්වීම:

2012 පෙබරවාරි 11 වන දින රාමසාමි ප්‍රභාහරන් තමා ගේ මූලික ව්‍යවස්ථානුකූල අයිතීන් උල්ලංඝණය වීම පිළිබඳ ශ්‍රේෂ්ඨාධිකරණ නඩු විභාගයට දින දෙකකට පෙර කොළඹ සිය නිවස ඉදිරිපිට දී නාඳුනන ආයුධ සන්නද්ධ කණ්ඩායමක් විසින් පැහැර ගන්නා ලදී. ඔහු මේ දක්වාම අතුරුදහන් ව ඇත. එල් ටි ටි ඊ සැකකරුවෙක් වශයෙන් ප්‍රභාහරන් ප්‍රථම වතාවට අත්අඩංගුවට ගන්නා ලද්දේ 2009 මැයි මාසයේ දීය. ඒ අවස්ථාවේදී තමා ජ්‍යෙෂ්ඨ පොලිස් නිලධාරීන් විසින් විවිධ වධහිංසා වලට භාජනය කරන ලද බවට පැමිණිලි කරන ලදී. ඔහුට විරුද්ධ චෝදනා කිසිවක් ඉදිරිපත් කිරීමට පොලිසිය අසමත් වූ බැවින් 2011 සැප්තැම්බර් මස නිදහස් කෙරින. ප්‍රභාහරන් තමා අත්තනෝමතික ලෙස අත් අඩංගුවට ගැනීම රඳවා තබා ගැනීම වධහිංසා පැමිණවීම යනාදි කාරණා මුල් කොට ගෙන ශ්‍රේෂ්ඨාධිකරණයේ මූලික අයිතිවාසිකම් පෙත්සමක් ගොනු කළ අතර ඒ දක්වා මුද තබා ඇති සිය ව්‍යාපාරික ස්ථානය නිදහස් කරන මෙන් ඉල්ලා සිටියේය.[150]

## ඉඩම් අයිතිය ඉල්ලා සිටි කාන්තාවන්ට අවහිර කිරීම:

නැගෙනහිර පළාතේ අම්පාර දිස්ත්‍රික්කයේ පිහිටි අස්රෆ් නගර් නම් ගම්මානයේ කාන්තාවන් කණ්ඩායමක් යුද්ධ හමුදාව සිය ඉඩම් බලහත්කාරයෙන් අල්ලා සිටීමට එරෙහිව ශ්‍රේෂ්ඨාධිකරණයෙහි මූලික අයිතිවාසිකම් පෙත්සමක් ඉදිරිපත් කළ විට යුද්ධ හමුද හටයින් විසින් එම කාන්තාවන්ට හිරිහැර කළ බව වාර්තා විය. ශ්‍රී ලංකාවේ කාන්තා සංවිධානයක් වන විමෙන්ස් ඇක්ෂන් නෙට් වර්ක් නම් සංවිධානයට අනුව " මෙම මූලික අයිතිවාසකම් පෙත්සම ඉදිරිපත් කිරීමෙන් පසු යුද්ධ හමුදාව විසින් එම කාන්තාවන් ගේ ජල පහසුකම් නතර කළා පමණක් නොව නිවෙස් වට කොට ගසා තිබූ කම්බි වැටවල් වලට විදුලිය කාන්දු කිරීම ද කරන ලදි. එක් පෙත්සම්කාරියක ගේ නිවසක් අසල දින දෙකක් නොකඩවා දිවා රාත්‍රී ශබ්ද විකාශන යන්ත්‍රයක් සවි කොට පිරිත් දේශනාවක් විසුරුවා හැර තිබුනි. මෙම කාන්තාවන් ගමන් ගන්නා මාර්ගයට විදුරු බෝතල කටු කුඩු කොට විසුරුවා හරින ලදි. විමෙන්ස් ඇක්ෂන් නෙට් වර්කස් සංවිධානය ප්‍රකාශ කරන පරිදි යුද්ධ හමුදාවට එරෙහි නඩුව ජයග්‍රහණය කළ නමුත් යුද්ධ හමුදාව අධිකරණ තීන්දුවට පිටු පා එකී ඉඩම් වල දිගටම පදිංචි සිටි අතර අවසානයේ දී එකී සියළුම ඉඩම් ආවරණය වන පරිදි අධි ආරක්ෂිත කලාපයක් ප්‍රකාශයට පත් කොට සියළුම පදිංචිකරුවන් ඔවුන් ගේ මුල් ඉඩම් වලින් ඉවත් කොට ඇත.[151]

## දේශපාලන ක්‍රියාකාරීන්ට පහර දීම:

ආණ්ඩුවේ ප්‍රහාරයට ලක් වන තවත් දේශපාලන ප්‍රවණතාවයක් වූයේ වර්ගවාදී හා ආගම්වාදී දේශපාලන සීමා අතික්‍රමණය කරන නව දේශපාලන පෙළ ගැසීම්ය. යුද්ධය අවසන් වීමත් සමගම සම්ප්‍රදායික වාර්ගික හා ආගමික සීමාවන් ඉක්මවා යමින් නව දේශපාලන ක්‍රියාකාරීන් සිය දේශපාලන ඉසව් පුළුල් කර ගැනීම, ආණ්ඩුවේ බලයට තර්ජනයක් මෙන් සලකන ලදී.

## ප්‍රේමකුමාර ගුණරත්නම් හා දිමුතු ආටිගල

2012 අප්‍රියෙල් 07 වන දින පෙරටුගාමී සමාජවාදී පක්ෂයේ නායකයින් වන ප්‍රේම්කුමාර ගුණරත්නම් හා දිමුතු ආටිගල, එම පක්ෂයේ දොරට වැඩීමේ උත්සවයට දින දෙකකට පෙර, ස්ථාන දෙකකදී පැහැර ගෙන යන ලදී. මෙම දෙදෙනා අප්‍රියෙල් මස 10 වන දින නිදහස් කළේය. ප්‍රේම් ගුණරත්නම් ප්‍රකාශයක් කරමින් තමා පැහැර ගෙන යන ලද්දේ ආරක්ෂ අංශ සාමාජිකයින් විසින් බවත් තමා අත්අඩංගුවේ සිටියදී තමාට ලිංගික වශයෙන් පවා වධහිංසා පමුණුවන ලද බව කියා සිටියේය. තමා නිදහස් වූයේ ඕස්ට්‍රේලියානු තානාපති කාර්යාලයේ ක්ෂණික මැදිහත් වීම නිසා බව ප්‍රේම්කුමාර ගේ ප්‍රකාශයෙහි සඳහන් වීය.[152]

## ලලිත් වීරගුරු හා කුගන් මුරුගනාදන්

උතුරේ නව ක්‍රියාකාරී මූව්මන්ට් ෆෝ පීපල්ස් ස්ට්‍රගල් නම් සංවිධානය ජනතා විමුක්ති පෙරමුණින් බිඳී, පෙරටුගාමී පක්ෂය සමග අත්වැල් බැඳ උතුරේ තරුණ වර්ධනය වෙමින් පවතින දේශපාලන ව්‍යාපාරයක් වීය. මෙම සංවිධානට සම්බන්ධ ලලිත් වීරගුරු හා කුගන් මුරුගනාදන් යන තරුණ දේශපාලන ක්‍රියාකාරීන් දෙදෙනා 2011 දෙසැම්බර් 10 වන දින එනම් අන්තර් ජාතික මානව හිමිකම් දිනයේ වීය.

එදිනම රාත්‍රී 11 ට පමණ කොළඹ වාසය කරන ලලිත් ගේ පියා ගේ ජංගම දුරකථනයට ලැබුන දුරකථන ඇමතුමකින් ඔහුට තම පුතා යාපනයෙන් ඉවත් කර ගන්නා මෙන් තර්ජනය කළ අතර එසේ නොමැති නම් තමන්ට එය කළ හැකි බව වැඩිදුරටත් කියා සිටියේය[153]. ලලිත් වීරරාජු ගේ පියා මුරුගන් රාජු ඊට පසු දින දෙසැම්බර් 11 වන දින කොස්ගම පොලීසියට මේ සම්බන්ධයෙන් පැමිණිල්ලක් කරන ලදී.

කුගන් ගේ බිරිඳ ගේ ප්‍රකාශයට අනුව ලලිත් හා කුගන් දෙසැම්බර් 10 වන දින සවස 5 ට පමණ යාපනයේ පිහිටි සිය නිවසින් ලලිත් යාපනය නගරයට ඇරලීම පිණිස කුගන් ගේ මෝටර් බයිසිකලයෙන් පිටත් වි ගිය අතර කුගන් ආපසු නිවස කරා නොපැමිණියේය. කුගන් ගේ බිරිඳ රාත්‍රී කිහිප වතාවක් ම කුගන් ගේ හා ලලිත් ගේ ජංගම දුරකථනයන් ඇමතීමට උත්සාහ කළ නමුත් එම ප්‍රයත්නයන් අසාර්ථක විය. පසුද හිමිදිරි පාන්දර 5ට පමණ නැවත දුර කථන ඇමතුම් ගත් නමුත් දෙදෙනාගේම දුරකථන විසන්ධි කොට තිබුනී. " දෙසැම්බර් 10 වන දිනට පසු කුගන් හෝ ලලිත් තමා නොදුටු බව ඇය කියා සිටියාය.[154]

ඊට පසුදින කුගන් ගේ බිරිඳ යාපනය නගරයට ගොස් සිය සැමියා පිළිබඳව සොයා බැලූ නමුත් කිසිදු තොරතුරක් ලබා ගැනීමට නොහැකි වූ බැවින් ඇය අච්චුවෙලි පොලිස් ස්ථානයට ගොස් සිය සැමියා අතුරුදහන් වි ඇති බවට පැමිණිල්ලක් කළාය. ඇය එම පැමිණිල්ල කිරීමෙන් පසු අවස්ථා තුනක දීම අච්චුවෙලි පොලීසියෙන් සිය නිවසට පැමිණ තම සැමියා පිළිබඳ තොරතුරු ඇත්දැයි විමසා සිටි බව ඇය තවදුරටත් කියා සිටියාය.

දෙසැම්බර් 13 වන දින කුගන් ගේ බිරිඳට තම සැමියා සහ ලලිත් සිය නිවසට කිලෝමීටර් 5 ක් පමණ නුදුරින් පිහිටි පොයින්ට් පේද්‍රු අසල නීර්වේලි නම් ස්ථානයේ දී සුදු වෑන් රථයකින් බලහත්කාරයෙන් පැහැර

ගෙන යනු දුටු බවඅසල් වැසියන් විසින් පවසන්නට යෙදුනි.

අසල් වැසියන් ප්‍රකාශ කළ පරිදි මෙම පැහැර ගැනීම තීර්වේලි ග්‍රාම නිලධාරී ඇතුළු මහ මග ගමන් කරමින් සිටි තැනැත්තන් විසින් දකින ලදී. ඒ අනුව මගේ සැමියා හා ලලිත් ගමන් කරමින් සිටි මෝටර් සයිකලය තවත් මෝටර් සයිකලයක් හරස් කොට නිර්වේලි හි පිහිටි පැරණි විදුරු කර්මාන්ත ශාලාව අසල නතර කරන ලද්දේය. කුගන් හා ලලිත් ඒ අසල නවතා තිබූ සුදු පැහැති වෑන් රියකට බලහත්කාරයෙන් පටවා ගත් අතර ඔවුන් ගමන් ගත් බයිසිකලය මහ මග අත හැර දමා තිබුනේය. මෙම සිද්ධිය දුටු ග්‍රාම සේවක හා ගම්වාසීන් ඒ පිළිබඳව කෝපායි පොලීස් ස්ථානයට පැමිණිලි කළේය. කෝපායි පොලීසියට සිද්ධිය වු ස්ථානයට රාත්‍රී 9ට පමණ පැමිණ අත් හැර දමා ගොස් තිබූ මෝටර් බයිසිකලය පොලීසිට ගෙන ගියෝය." නමුත් සිය සැමියා ගේ බයිසිකලය පොලිසියට ලැබුන බව ඇයට දැනුම් නොදුන් අතර ඒ බව ඇය දැන ගත්තේ තමා කළ ප්‍රකාශයේ පිටපතක් ලබා ගැනීම පිණිස දෙසැම්බර් 14 වන දින පොලීසියට ගිය අවස්ථාවේ බව කුගන් ගේ බිරිඳ ප්‍රකාශ කළේය.

ඇය තවදුරටත් මෙසේ ද කීවාය. " අච්චුවෙලී පොලිසිය කියන පරිදි කෝපායි පොලීසියට මෙම සිය සැමියා ගේ මෝටර් බයිසිකලය සම්භ වී ඇත්තේ තම නිවසට කිලෝ මීටර් 9 පමණ ඈතින් උරුම්බරායි හි පිහිටි ශිවන් කෝවිල අසල තිබියදීය. මේ පිළිබඳ වැඩි විස්තර සොයන්නට තමා තවදුරටත් පොලීස් ස්ථානයට නොගිය අතර අසල් වැසියෙකුට ග්‍රාම සේවක නිලධාරි හමු වි විස්තර විමසන ලෙස ඉල්ලා සිටියත් එම අසල් වැසියාගේ පිළිතුර වුයේ ග්‍රාම සේවක තවදුරටත් මේ පිළිබඳව කථා කිරීමට මැලිකමක් දක්වන බවයි."[155]

## මහජන මන්ත්‍රී සිවඥානම් ශ්‍රීධරන්:

යාපනය කේන්ද්‍ර කොට ගත් උතුරෙහි ආධිපත්‍ය සඳහා දේශපාලන කණ්ඩායම් හා යුද්ධ හමුදාව එකිනෙකා තරඟ වාතාවරණයක විසම්මුතිය පාගා දැමීම අහඹු සිදුවීමක් නොවේ. 1995 දී යුද්ධ හමුදාව යාපනය නගරය එල් ටි ටි ඊ සංවිධානයෙන් මුදා ගන්නා තෙක් එල් ටි ටි ඊ ය විසින් පාලනය කළ අතර එම වකවානුවේදී එල් ටි ටි ඊ සංවිධානය විසින් තමන්ට අවනත නොවන ද්‍රවිඩ ජාතික සැකකරුවන් ඝාතනය කිරීම හා තර්ජනය කිරීම නොකඩවා සිදුවුයේය. ඉන් අනතුරුව විශේෂයෙන්ම 2006 න් පසු යුද්ධ හමුදාව, පොලීසිය හා ආණ්ඩුව සම්බන්ධ දේශපාලන පක්ෂ යාපනය 'පාලනය' කරයි. මෙවර යාපනය අවට අමානුෂික අවමන් සහගත හා තර්ජනයන්ට ඉලක්ක වී ඇත්තේ විසම්මුතික මතධාරීන්ය.

2013 ජනවාරි මාසයේ දී කිලිනොච්චියේ පිහිටි ටි එන් ඒ පාර්ලිමේන්තු මන්ත්‍රී සිවඥානම් ශ්‍රීධරන් ගේ දේශපාලන කාර්යාලය ත්‍රස්ත විමර්ශන ඒකකය විසින් පරීක්ෂා කරන ලදී. ජනවාරි 12 වන දින ත්‍රස්ත විමර්ශන ඒකකයේ නිළධාරීන් එම කාර්යාලයේ තිබී පුපුරණ ද්‍රව්‍ය රාශියක් සොයා ගත් බව කීයා සිටි අතර මහජන මන්ත්‍රී ශ්‍රීධරන් ගේ ප්‍රකාශය වුයේ 'එය ආරක්ෂ අංශ විසින්ම තමා බිය ගැන්වීම පිණිස අටවන ලද උගුලක්'බවයි.

2013 ජනවාරි 22 වන දින නැවතත් ශ්‍රීධරන් මන්ත්‍රීවරයාගේ කාර්යාලය ත්‍රස්ත විමර්ශන ඒකකය විසින් මන්ත්‍රීවරයා ගේ ලැප් ටොප් පරිඝණකය සෝදිසි කළ අතර යුද්ධ හමුදාවට ද්‍රවිඩ කාන්තාවන් බඳවා ගැනීමට විරුද්ධව අත්පත්‍රිකාව බෙදීම සම්බන්ධයෙන් ප්‍රශ්න කරන ලදී.

ශ්‍රීධරන් මන්ත්‍රීවරයා 2013 මාර්තු මාසයේදී පාර්ලිමේන්තු සැසිවාරයකට සහභාගීවීම පිණිස යමින් සිටියදී ඔහු ගමන් කළ වාහනයට අනුරාධපුරයේ දී අත්බෝම්බයක් දමා ගසමින් පිස්තෝලයකින් වෙඩි තබා තිබුනී. නමුත් මන්ත්‍රීවරයා ගේ ආරක්ෂ නිලධාරීන් විසින් පෙරළා පහර වෙඩි තැබීමෙන් පසු ආයුධ සන්නද්ධ පිරිස පළා ගියේය.

2013 මාර්තු මාසයේ දී ඇම්නස්ටි ඉන්ටර්නැෂනල් සංවිධානයට ප්‍රකාශයක්

කළ ශ්‍රීධරන් මන්ත්‍රීවරයා තමාගේ පෞද්ගලික ලේකම්වරයා හා තවත් තැනැත්තෙක් ත්‍රස්ත විමර්ශන ඒකකය විසින් අත්අඩංගුවට ගෙන අත්තනෝමතික ලෙස රඳවා සිටින බව කියා සිටියේය.

ටී එන් ඒ පක්ෂය විසින් 2013 මාර්තු මාසයේදී නිකුත් කළ පුවත් පත් ප්‍රකාශයකින් තම පක්ෂය විසින් කිලිනොච්චි කාර්යාලයේ සංවිධානය කරන ලද රැස්වීමකට ගල් මුල් ප්‍රහාරයක් එල්ල කරන ලද අතර ඉන් 13 දෙනෙක් තුවාල ලැබූ අතර ඔවුන් රෝහල් ගත කිරීමට සිදුවීය. මෙම සිදුවීම සිදුවන අවස්ථාවේ පොලීසිය එම ස්ථානයේ රාජකාරි කටයුතු වල නියැළී සිටි නමුත් කිසිවෙක් අත් අඩංගුවට නොගත්තේය. නමුත් රැස්වීමට සහභාගී වූවන් විසින් කිහිප දෙනෙකු අල්ලා ගත් අතර ඔවුන් අපරාධ පරීක්ෂණ දෙපාර්තුමේන්තුවේ නිලධාරීන් වශයෙන් හඳුනා ගන්නා ලද අතර ඔවුන් කිලිනොච්චි පොලීසියට බාර දුන් නමුත් පසුව නිදහස් කොට යවන ලද බව ආරංචි වුයේය.[156]

## මාධ්‍යවේදී ශාන්ත විජේසූරියඃ

ශ්‍රී ලංකා එක්ස් නිව්ස් වෙබ් අඩවියේ මාධ්‍යවේදීයෙකු හා ශ්‍රීලංකා වෘත්තීය මාධ්‍යවේදීන් ගේ සංගමයේ කමිටු සාමාජිකයෙක් වන ශාන්ත විජේසූරිය 2012 ජුලි මාසයේ දී නුගේගොඩ මංසන්දියේ දී බලහත්කාර ලෙස පැහැර ගැනීමට තැත් කළ අතර ඔවුන් සමඟ පොර බඳ ගැලවෙන්නට ඔහුට පුළුවන් කම ලැබුනී.[157] පොලිස්පතී එම් කේ ඉලංගකෝන් මහතාට ලිපියක් ලියමින් ශාන්ත විජේසූරිය තමා පැහැර ගන්නට තැත් කළ තැනැත්තන් ගෙන් එක් අයෙක් තමාට එරෙහි නඩු විභාගයක් පැවැත්වෙන අවස්ථාවේ එම අධිකරණ භූමියෙහි හා තමා සහභාගි වු දේශපාලන රැස්වීම් කිහිපයක ම දක්නට සිටි රාජ්‍ය ආරක්ෂ අංශ සාමාජිකයෙක් බව පෙන්වා දුන්නේය.[158] එපමණක් නොව 2011 ඔක්තෝබර් මාසයේ දී තමා එකළ සේවය කරමින් සිටි මව්බිම කාර්යාලයට අපරාධ පරීක්ෂණ දෙපාර්තුමේන්තුවේ නිලධාරීන් පැමිණියේ ද මෙම අංක දරන සුදු වෑන් රථයෙන් බව කියා සිටියේය.

ශාන්ත විජේසූරිය මීට පෙර ලංකා ඊ නිව්ස් හා මව්බිම පුවත් පත් වල සේවය කළ අතර එහිදීද ඔහු විසින් පළ කරන ලද විමර්ශනාත්මක ලිපි නිසා විවිධ තර්ජන වලට භාජනය වුවෙකී.

මීට පෙර 2012 අප්‍රියෙල් මාසයේ දී ශාන්ත විජේසූරිය ලංකා ඊ නිව්ස් හි පළ කළ ප්‍රවෘත්තීයක් මඟින් අධිකරණයට අපහා කරන ලද්දේ යැයි යන චෝදනාව සම්බන්ධයෙන් අත්අඩංගුවට ගත්තේය. මෙම සිද්ධියට අදළ ප්‍රවෘත්තිය පළ කිරීම සම්බන්ධයෙන් ලංකා ඊ නිව්ස් වෙබ් අඩවිය ප්‍රකාශයක් පළ කරමින් අධිකරණයෙන් සමාව ඉල්ලා සිටි අතර සිද්ධිය සම්බන්ධයෙන් කණගාටුව ද පළ කළේය. නීතීපතිවරයා ඔහු නිදහස් කිරීමට උපදේස් දූන් අතර එම උපදේස් නොසළකා මහේස්ත්‍රාත්වරයා ඔහු තවදුරටත් රිමාන්ඩ් භාරයේ රඳවා ගෙන සිටියේය. මානව හිමිකම් ආරක්ෂකයින් හා ඊ නිව්ස් වෙබ් අඩවිය වාර්තා කළ පරිදි ශාන්ත විජේසූරිය 2012 මැයි මාසයේ මහර රිමාන්ඩ් බන්ධනාගාරයේ රඳවා ගෙන ඔහුට බන්ධනාගාර නිලධාරීන් ලවා පහර දෙන ලද්දේය.[159] 2011 සැප්තැම්බර් මස ශාන්ත විජේසූරිය ප්‍රකාශයක් කරමින් තම පවුලේ සාමාජිකයන් මුණ ගැසීමට අපරාධ පරික්ෂණ දෙපාර්තුමේන්තුවේ නිලධාරීන් නිතර පැමිණෙන බවත් නාඳුනන පුද්ගලයන් තමා පිළිබඳව අසල් වැසියන් ගෙන් විමසන බවත් කියා සිටියේය. මානව හිමිකම් ආරක්ෂකයින් පිළිබඳ තොරතුරු පළකරන ෆ්‍රන්ට්ලයින් වෙබ් අඩවියේ පළ වු තොරතුරු වලට අනුව අපරාධ පරීක්ෂණ දෙපාර්තුමේන්තුව ශාන්ත විජේසූරියට ඔහු සොල්දදූ උන්නැහේ යන අන්වර්ථ නාමයෙන් ලංකා ඊ නිව්ස් වෙබ් අඩවියට ලිපි සපයන බවත් එය වහාම නතර කරන ලෙසට තර්ජනය කරමින් මේ පිළිබඳව පොලීසියට පැමිණිලි නොකරන ලෙසට ත්‍රජනය කරන ලදී. තවත් එක් අවස්ථාවකදී තමාට මව්බිම පුවත්පතට ලිවීම නතර කර ඒ වෙනුවට රජයේ පුවත් පතක් තෝරා ගන්නා මෙන් අපරාධ පරීක්ෂණ දෙපාර්තුමේන්තු නිලධාරීන් කියා

සිටි බවත් ප්‍රකාශ කරයි.[160]

## යාපනයඃ උදයන් පුවත් පත

යුද්ධය පැවති අවස්ථාවේ සිට මේ දක්වා අඛණ්ඩව යාපනයේ පළ වන උදයන් පුවත් පත වසර ගණනාවක සිටම නිරන්තරයෙන්ම ප්‍රහාරයන්ට හා තර්ජනයන්ට ලක් වන පුවත් පතකී.[161] 2009 දී ආණ්ඩුවේ බලධාරීන් විසින් දිගින් දිගටම උදයන් පුවත් පතෙහි කර්තෘවරයා ගෙන් වන්නියෙහි සිදුවන සිවිල් හානි පිළිබඳව පුවත් පළ කිරීමෙන් වළකින ලෙස ඉල්ලා සිටි නමුත් ඊට කන් නොදීම නිසා කාර්යාලයට අත් බෝම්බ ප්‍රහාරයක් එල්ල කර තිබුනී.

යුද්ධය පවතින වකවානුවේ ශ්‍රී ලංකා ආණ්ඩුවෙන් මෙන්ම එල් ටි ටි ඊ සංවිධානයෙන් ද තමාට තිබෙන තර්ජන නිසා උදයන් පුවත් පත් කාර්යාලයේම ජීවත් වූ ඥානසුන්දරම් කුගනාදන් නැමති මාධ්‍යවේදියාට 2011 ජුලි මාසයේ දී නාඳුනන පිරිසක් විසින් යකඩ පොල්ලකින් පහර දුන්නේය. මෙම ප්‍රහාරයෙන් පසු ඔහු ශ්‍රී ලංකාවෙන් පළා ගියේය.

උදයන් පුවත් පතෙහි කර්තෘ ටි ප්‍රේමනාත් 2012 දෙසැම්බර් මාසයේ යාපන සරසවියේ පැවති රැස්වීමක් ආවරණය කරමින් සිටිය දී ආරක්ෂක හමුද සාමාජිකයින් පිරිසක් විසින් පහර දෙන ලැබ ඉතා බරපතළ ලෙස තුවාල ලැබීය.

2013 ජනවාරි 10 වන දින උදයන් පුවත් පත බෙද හරිමින් සිටි කාර්ය මණ්ඩල සාමාජිකයෙකුට මග රැක සිටි පිරිසක් විසින් යකඩ පොල්ලකින් පහර දෙන ලද අතර එහි ඔහු ගේ අතක් බිඳී ගියේය. ප්‍රහාරකයින් විසින් ඔහු රැගෙන යමින් සිටි මුද්‍රිත පුවත් පත් දහසකට ආසන්න ප්‍රමාණයක් ගිනි තැබූ අතර එම ගින්නෙන් පුවත් පත් මෙන්ම බයිසිකලයද ගිනි බත් විය.[162]

කිලිනොච්චියෙහි පිහිටි උදයන් පුවත් පත බෙද හැරීමේ කාර්යාලයට 2013 අප්‍රියෙල් 3 වන දින ආයුධ සන්නද්ධ කණ්ඩායමක් කඩා වැදී බෙද හැරීමට සුදානම් කොට තිබූ පුවත්පත් තොගයකට හා වාහන කිහිපයකට බරපතළ හානි සිදු කරන ලද්දේය.[163]

ඊට දින දහයකට පසු නැවතත් යාපනයේ පිහිටි උදයන් පුවත් පත් කාර්යාලයට කඩා වැදුන ආයුධ සන්නද්ධ කණ්ඩායමක් එම ස්ථානයේ පිහිටුවා තිබූ මුද්‍රණ යන්ත්‍රය ගිනි බත් කළේය. මෙම පුවත් පතෙහි අයිතිකරු වන ටි එන් ඒ පක්ෂයේ ඊ සරවනාපවන් මාධ්‍යයට ප්‍රකාශයක් කරමින් " මෙම පහර දීම යුද්ධ හමුදව විසින් කරන ලද්දක් බවට තමා සැක කරන බවත් මෙම පුවත් පත 2013 පැවැත්වීමට නියමිත උතුරු පළාත් සභා මැතිවරණයට පෙර නතර කිරීම පිණිස රජය කටයුතු කරන බවත් " කියා සිටියේය.[164]යුද්ධ හමුදව විසින් එම ප්‍රකාශය හෙළා දකින ලදී. ජාතික ආරක්ෂාව පිළිබඳ මාධ්‍ය මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂක ලක්ෂමන් හුළුගල්ල ප්‍රකාශයක් කරමින්[165] "ශ්‍රී ලංකාව හා ආණ්ඩුව අපහසුතාවයට පත් කිරීමට උදයන් පුවත් පත් අයිතිකරුවන් විසින් ම සිදු කළ හානියකැයි "කියා සිටියේය.[166]

ආණ්ඩුවට හිතවත් දේශපාලන පක්ෂ හා ආණ්ඩුවේ නිලධාරීන් උදයන් පුවත් පතට එරෙහි ව අලාභ ඉල්ලා අධිකරණය වෙත යාම එම පුවත් පත්ට හිරිහැර කිරීමේ තවත් උපාය මාර්ගයකී.[167] 2012 ජනවාරිව මස ඊලාම් ජනතා ප්‍රජාතාන්ත්‍රවාදී පක්ෂයේ නායක හා සම්ප්‍රදායික කර්මාන්ත හා කුඩා ව්‍යවසායක සංවර්ධන අමාත්‍ය ඩග්ලස් දේවානන්ද රුපියල් බිලියනයක අලාභයක් ඉල්ලා නඩුවක් පවරන ලද්දේය. ඔහු සිය පැමිණිල්ලෙන් කියා සිටියේ උදයන් පුවත් පත විකි ලීක්ස් මගින් හෙළිදරව් කරන ලද තොරතුරක දවිඩ පරිවර්තනය උදයන් පුවත් පතේ පළ කිරීම මගින් තමා ගේ කිර්තී නාමයට හානියක් කළ බවයි. එහි සඳහන් වූයේ "බැසිල් රාජපක්ෂ ඇමෙරිකානු තානාපති සමඟ කළ සාකච්ඡාවක දී 2006 උදයන් පුවත් පතට කරන ලද පහර දීම මෙහෙයවන ලද්දේ ඩග්ලස් දේවානන්ද හා

නාවික හමුදාව විසින් බවයි.[168] යුද්ධ හමුදාවේ අණ දෙන නිලධාරී ලුතිනන් ජනරාල් ජගත් ජයසූරිය විසින්, තමාගේ කීර්ති නාමයට කරන ලද හානිය නිසා උදයන් පුවත් පතට විරුද්ධව පනවන ලද නඩුවකින්[169] රුපියල් මිලියන 100ක අලාභයක් ඉල්ලා සිටියේය.

## සන්ඩේ ලීඩර් පුවත් පතෙහි මාධ්‍යවේදී ෆරේස සකුර්අලි:

2012 පෙබරවාරි 15 දින සන්ඩේ ලීඩර් පුවත් පතෙහි මාධ්‍යවේදී ෆරේස් සකුර්අලි[170] ගේ ගල්කිස්සෙහි පිහිටි නිවසට පැමිණි ආයුධ සන්නද්ධ තිදෙනෙකු ගෙන් යුත් කණ්ඩායමක් කළ පහර දීමේ ප්‍රතිඵලයක් වශයෙන් රෝහල් ගත කොට දැඩි සත්කාර ඒකකයෙහි ප්‍රතිකාර ලබන්නට සිදුවීය. එක්සත් ජාතීන් ගේ මානව හිමිකම් කොමසාරිස් නවාවි පිල්ලේ බ්‍රිතාන්‍යයේ චැනල් 4 රූපවාහිනී නාලිකාවට ප්‍රකාශයක් කරමින් " ආණ්ඩුව පිළිබඳ විවේචනාත්මක පුවත් පතක මාධ්‍යවේදියකු වන මෙම මාධ්‍යවේදියාට වෙඩි තැබීම නිසා තමා දැඩි කම්පනයට පත් වූ බව" කියා සිටියේය. කියා මාර්තු 10 වන දින සන්ඩේ ලීඩර් පුවත් පත වාර්තා කළ පරිදි පොලීසිය මෙම සිද්ධිය සම්බන්ධයෙන් කිහිප දෙනෙකු ගෙන්ම ප්‍රකාශ සටහන් කර ගත් නමුත් ඒ වන විට කිසිවෙක් අත් අඩංගුවට ගැනීමට අපොහොසත් වූ බව මාර්තු 10 වන සන්ඩේ ලීඩර් පුවත් පත වාර්තා කොට සිටියේය.[171]

## බි බි සි මාධ්‍ය කණ්ඩායමට තර්ජනය කිරීම හා සංදේශය වැඩ සටහන අවහිර කිරීම:

බි බි සි මාධ්‍ය ජාලයේ චාල්ස් හැවිලන්ඩ්ට අනුව තමා 2013 පෙබරවාරි මස බෞද්ධ දැඩි මතධාරී කණ්ඩායමක් විසින් හලාල් ලේබලය පාවිච්චි කිරීමට විරුද්ධව පවත්වන ලද විරෝධතා රැළියක් ආවරණය කරමින් සිටියදී තර්ජනය කළ බව කියා සිටියේය. කළහකාරී ලෙස හැසුරුන 20 දෙනෙකු ගෙන් පමණ යුක්ත කණ්ඩයාම තමාට ජාති ද්‍රෝහියා හා විදේශීය කුමන්ත්‍රණකරු යනුවෙන් තර්ජනය කරද්දී පොලිසිය නිහඬව බලා සිටි බව කියා සිටියේය.[172]

බි බි සි මාධ්‍ය ආයතනය 2013 මාර්තු 26 වන දින ප්‍රකාශයක් කරමින් ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව සිය දමිළ බසින් විකාශනය වන වැඩ සටහනට සංවිධානාත්මකව නොකඩවා බාධා කිරීම නිසා එම වැඩ සටහන නතර කිරීමට තීරණය කළ බව ප්‍රකාශ කළේය.

ශ්‍රී ලංකාව පිළිබඳ එක්සත් ජාතීන් ගේ යෝජනාව ජිනීවා හි සාකච්ඡා වන අවස්ථාවේදී එනම් 2013 මාර්තු 21 වන ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවේ සිංහල සවදේශීය සේවය බි බි සි සිංහල අංශය විසින් විකාශනය කරන ලද වැඩ සටහනට දිගින් දිගටම බාධා කරන ලද අතර අනෙකුත් මාධ්‍ය ජාලයන් විසින් ආණ්ඩුවට වාසිදයක ලෙස ප්‍රචාරය කළ වැඩ සටහන් උත්තරාරෝපණය කරන ලදී. මේ සම්බන්ධයෙන් ප්‍රකාශයක් කළ බි බි සී ලෝක සේවය "මේ තත්වය තමන්ට පිළිගත හැකි එකක් නොවන බවත් සිය අසන්නන් නොමඟ යැවීමක් බවත් " කියා සිටියේය.[173]

## දැවැන්ත මහජන විරෝධතා යලි හිස එසවීම:

ශ්‍රී ලංකා ආණ්ඩුව සිය දේශපාලන බලය මධ්‍යගත කිරීමට අප්‍රතිහත ධෛර්යකින් කටයුතු කරද්දී, දේශපාලන, සමාජ හා ආර්ථික සිදුවීම් කෙරෙහි අවධානය යොමු කරන මහජනතාව සිය අතෘප්තිය හා කළකිරීම ප්‍රකාශ කරනු පිණිස මහජන වීරෝධතා රැළි වලට විශාල ලෙස සහභාගි වන්නට පටන් ගෙන තිබේ. රජය මීට දක්වන ප්‍රතිචාරය ඉතාමත් රළුය. නීති ක්‍රියාත්මක කිරීමේ අන්තර් ජාතික ප්‍රමිතීන් උල්ලංඝණය කරමින් රජය විසින් අනවශ්‍ය ලෙස උපරිම බලය යොදවා පෙළපාළිකරුවන්ට මර්දනය කරයි. එම ප්‍රමිතීන්ට අනුව නිලධාරීන් බලය පාවිච්චි කළ යුත්තේ අත්‍යවශ්‍ය වුවහොත් පමණක් වන අතර ගිනි අවි පාවිච්චි කළ යුත්තේ සිය ජීවිතයට

යම් හානියක් සිදුවන බවට ඒත්තු ගියහොත් පමණි.[174]

2011 ජූනි මාසයේ දී ආණ්ඩුව අර්ථ සාධක අරමුදල විශ්‍රාම වැටුපක් බවට පරිවර්තනය කිරීමට යෝජනාවක් ඉදිරිපත් කළ අතර, ඊට පෞද්ගලික අංශයේ සේවක සේවිකාවන් ගෙන් දැඩි විරෝධයක් එල්ල වීය.[175] 2012 දිවයින පුරාම 300,000[176] කට ආසන්න ධීවර කාර්මිකයින් සංඛ්‍යාවක් ඉන්ධන මිල ඉහළ දැමීමට එරෙහිව විරෝධතාවයක් පැවැත්වීය. ඉහත කී අවස්ථා දෙකේ දීම විරෝධතාකරුවන්ට එරෙහිව රජය ඉතා විශාල බලයක් පාවිච්චි කළ අතර එහි ප්‍රතිඵලයක් වශයෙන් ජීවිත කිහිපයක් නැතී වූ අතර බොහෝ දෙනෙක් තුවාළ ලැබීය.[177]

විශ්ව විද්‍යාල 14ක හාරදහසකට ආසන්න විශ්ව විද්‍යාල ආචාර්යවරුන් සංඛ්‍යාවක් 2012 ජූලි 4 වන දින වැඩ වර්ජනයක් දියත් කරමින් සිය වැටුප් වැඩි කර ගැනීම, අධ්‍යාපනය සඳහා ජාතික වියදමින් වැය කරන ප්‍රතිශතය ඉහළ දමා ගැනීම හා සරසවි තුළ දේශපාලන හා යුද්ධ හමුදා මැදිහත් වීම් නතර කරන ලෙස ඉල්ලා වැඩ වර්ජනයක් දියත් කරන ලදී.[178] සරසවි ආචාර්‍යවරුන් ගේ වැඩ වර්ජනය මාස තුනකට ආසන්න කාලයක් පැවති අතර ශිෂ්‍ය සංගම්, වෙනත් වෘත්තීය සමිති, ආගමික නායකයින් හා සිවිල් සමාජයේ සහයෝගය දිනා ගැනීමට සමත් වුයේය. විශ්ව විද්‍යාල ආචාර්යවරුන් වැඩ වර්ජනය ඔක්තෝබර් මාසයේ දී නිමාවට පත් වූ අතර එහි නායකත්වය ගෙන කටයුතු කළ තැනැත්තන්ට ජීවිත තර්ජන එල්ල වන බවට පැමිණිලි ලැබී තිබුනී.[179]

ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ හා ශ්‍රී ලංකා වෛද්‍ය නිලධාරීන් ගේ සංගමයේ සාමාජිකයෙකු හා ප්‍රවීණෝපදේශකයෙකු වන වෛද්‍ය ලලන්ත රණසිංහ ගේ ගෙමිදුලෙහි අත් බෝම්බයක් තිබී හමු වීම නිමිති කොට ගෙන වෛද්‍යවරුන් 16,000 කට ආසන්න සංඛ්‍යාවක් වැඩ වරණ ලදී. මෙම වැඩ වර්ජනයේ ඉල්ලීම් අතර මීට පෙර අවස්ථාව වලදී ශ්‍රී ලංකා වෛද්‍ය සංගමයේ සාමාජිකයින් හට කරන ලද පහර දීම් හා තර්ජන සම්බන්ධයෙන් පරීක්ෂණ පවත්වා සැකකරුවන් අත් අඩංගුවට ගත යුතුය යන ඉල්ලීම ද ඇතුළත් වීය. පසුව වෛද්‍ය රණසිංහ සිය පැමිණිල්ල ඉල්ලා අස්කර ගත් අතර ඔක්තෝබර් මාසයේ දී ඔහුගේ රියදුරුට පහර දී මෝටර් රථය පැහැර ගැනීමට උත්සහා දරන ලද්දේය.

2011 දී ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ ලේඛකාධිකාරී වෛද්‍ය එන් ජේ නෝනිස් තමා ගේ නිවසේ ගේට්ටුව අසල රැක සිටි මැරවරයන් කණ්ඩායමක් විසින් පහර දී තිබුනී. මෙම  පහර දීම වෛද්‍ය ප්‍රජාව විසින් සලකන ලද්දේ පෞද්ගලික වෛද්‍ය විශ්ව විද්‍යාල විවෘත කිරීමට විරුද්ධ වීමට හා ඉන්දීයාවෙන් වෘත්තීය සුදුසුකම් නොසපුරන ලද වෛද්‍යවරුන් ශ්‍රී ලංකාවේ පෞද්ගලික රෝහල් වල සේවයේ යෙදවීමට ප්‍රතිචාරයක් වශයෙන් වශයෙනී.

එම වසරේ අගෝස්තු මාසයේ දී පෙරටුගාමී සමාජවාදී පක්ෂය පෞද්ගලික වෛද්‍ය විද්‍යාල වලට එරෙහි වෛද්‍යවරුන් ගේ එකතුවේ” වෛද්‍ය ඉදුනිල් විජේනායකට  පහර දීම පිටුපස රජය සිටින බවට චෝදනා කළේය.[180]

2012 සැප්තැම්බර් මාසයත් 2013 ජනවාරි මාසයත් ඇතුළත සිය ගණනක් නීතිඥ වෘතිකයන්  අගවිනිසුරු ශිරාණි බණ්ඩාරනායකට එරෙහිව ගෙන එන ලද දෝෂාභියෝගය මගින් අධිකරණයේ ස්වාධීනත්වය කෙළසන බවට චෝදනා කරමින් අවස්ථා ගණනාවකදී විරෝධතා රැළි සංවිධානය කළෝය.[181]

## විශ්ව විද්‍යාල ආචාර්යවරුන් ගේ සමිති සම්මේලනයේ ආචාර්ය

## නිර්මාල් රංජිත් දේවසිරිඃ

2012 වර්ෂයේ මාස හතරකට ආසන්න කාලයක් පැවති සරසවි ආචාර්යවරුන් ගේ සංගමයේ වැඩ වර්ජනය පවතින අතරතුර එම සංගමයේ ප්‍රධානියා වු ආචාර්ය නිර්මාල් රංජිත දේවසිරිට අවස්ථා කිහිපයකදීම ජිවිත තර්ජන එල්ල වු බවට පැමිණිලි කළේය. එක් අවස්ථාවකදී ආචාර්ය නිර්මාල් තමාට ආරක්ෂක අමාත්‍යංශය වෙනුවෙන් පෙනී සිටි තැනැත්තෙක් දුරකථන ඇමතුමක් දී වැඩ වර්ජනය අවසාන නොකළහොත් ඔහුගේ බිරිදට හා දරුවන්ට හිරහැර විය හැකි බවට තර්ජනය කළ බව ප්‍රකාශ කළ බව දේශීය පුවත් පතකට කියා සිටියේය. මේ අතර ආරක්ෂක අමාත්‍යංශයෙන් පැමිණි බවට හඳුන්වා දුන් පුද්ගලයින් සිය අසල්වැසියන් ගෙන් තමා හා තම බිරිඳ ගේ ගමන් බිමන් පිළිබඳ තොරතුරු විමසු බව ද කියා සිටියේය.[182] මෙම සිද්ධිය සම්බන්ධයෙන් ආචාර්ය නිර්මාල් ශ්‍රී ලංකා පොලීසියට පැමිණිලි කළ අතර සරසවි ආචාර්යවරුන් ගේ සංගමය මෙම සිද්ධිය සම්බන්ධයෙන් ප්‍රසිද්ධියේ රජයට චෝදනා කරන ලදී.[183] මේ සිද්ධිය සම්බන්ධයෙන් ආචාර්යවරුන් ගේ සංගමය විසින් මාධ්‍ය සාකච්ඡාවක් පවත්වන ලද අතර එය අවසානයේ ආරක්ෂක අමාත්‍යංශයේ ලේකම් ගෝඨාභය රාජපක්ෂ විසින් ආචාර්ය නිර්මාල් ට දුරකථන ඇමතුමක් දී " පවත්වන ලද පුවත් පත් සාකච්ඡාව නිසා ආරක්ෂක අමාත්‍යංශයේ කිර්තීනාමයට ඉතා බරපතළ හානියක් සිදු වු බවත් එම සිද්ධිය සම්බන්ධයෙන් යම්කිසි සැකකරුවෙක් වෙත්ම පොලීසිට බාර දෙන මෙන් ඉල්ලා සිටි බව" ආචාර්ය නිර්මාල් විසින් මාධ්‍යයට ප්‍රකාශ කරන ලදී.[184]

සරසවි ආචාර්යවරුන් ගේ වැඩ වර්ජනය පවතින අතරතුර එම වැඩ වර්ජනයට සහයෝගය දක්වමින් විශාල සමිති සංවිධාන පෙළපාලි පැවැත්වු අතර මෙසේ පෙළපාලි පැවැත් වු එක් සංවිධානයක් වුයේ අන්තර් විශ්ව විද්‍යාල ශිෂ්‍ය සංගමයයි. 2012 සැප්තැම්බර් මස 27 දින එම සංගමය විසින් පවත්වන ලද රැළියකට කඩා වැදුන මෝටර් රථයක් එම රැළියට සහභාගි වෙමින් සිටි සිසුන් දෙදෙනකුට මරු කැඳවීය. පොලීසිය මෙය නොවැළැක්විය හැකි අනතුරක් ලෙසට හැඳින්වු අතර ශිෂ්‍ය සම්මේලනය කියා සිටියේ මෙය හිතාමතා කළ දෙයක් බවයි.[185]

මේ සම්බන්ධයෙන් ප්‍රකාශයක් කළ ආචාර්ය ජයදේව උයන්ගොඩ මේසේ කියා සිටියේය.

ආණ්ඩුවට එරෙහි වෘත්තීය සමිති අරගල ආණ්ඩු විරෝධී කුමන්ත්‍රණ ලෙසට හැඳින්වීම අළුත් දෙයක් නොවේ. මෙය 1950 ගණන්වල සිට මෙරට බලයට පත් වු සියළුම ආණ්ඩු විසින් අනුගමනය කරන ලද උපායකී. මෙය 1970 දශකයේ දී වඩාත් නරක අතට හැරී තිබුනී. නමුත් එද සහ අද අතර ඉතා විශාල වෙනසක් තිබේ. ආණ්ඩුවේ ප්‍රබල පුද්ගලයින් විසින් යම් කිසි සංවිධානයක් හෝ පුද්ගලයෙක් 'කුමන්ත්‍රණකරුවෙක් ' ලෙසට නම් කළ විට එම සංවිධානයේ හෝ පුද්ගලයා ගේ ආරක්ෂාව සම්බන්ධයෙන් බරපතළ අනතුරක් ඉඟි කරයි. අද අපි ජීවත් වන්නේ තවදුරටත් නීතියේ සාධාරණ රැකවරණය සිය පුරවැසියන්ට නොලැබෙන රටක බව සිහි තබා ගත යුතුය"ආචාර්ය ජයදේව උයන්ගොඩ කොළඹ සරසවිය කලා අංශය[186]

## යාපනය සරසවියඃ ශිෂ්‍ය විරෝධතා මර්දනය

2009 මැයි මාසයේ යුද්ධය නිම වු පසු විශේෂයෙන්ම උතුරු හා නැගෙනහිර පළාත් වල කිසිම ආකාරයකින් ද්‍රවිඩ රණවිරුවන් හා යුද්ධයෙන් විපතට පත් වුවන් අනුස්මරණය කිරිමට අවකාශයක් නොදෙන ප්‍රතිපත්තියක් එම පළාත් වල සිවිල් පාලනය මෙහෙය වන යුද්ධ හමුදාව අනුගමනය කරයි. විශේෂයෙන්ම එල් ටි ටි ඊ පාලනය පැවති සමයේ ඉතාමත් උත්කර්ෂවත් අන්දමින් අනුස්මරණය කළ ප්‍රභාකරන් ගේ උපන් දිනය වු නොවැම්බර් 27 වන දිනට යොද ගෙන තිබු රණවිරු දිනය අනුස්මරණයට කිරිමට හෝ එම දිනය කේන්ද්‍ර කොට ගෙන යුද්ධයෙන් විපතට පත් තැනැත්තන් අනුස්මණය කිරිමට හෝ කිසි දු අවසරයක්

නොදෙයි. 2012 නොවැම්බර් 27 දින ද්‍රවිඩ රණවිරු දිනය මෙන්ම අහම්බෙන් පහන් දැල්වීමේ උත්සවය හෙවත් කාතිකායි දීපම් නැමති උත්සවය ද යෙදී තිබුන අතර මෙවර ඒ දිනයේ පහන් දැල්වීමේ උත්සවය නිමිත්තෙන් වත් පහනක් දැල්වීමට උතුරු හා නැගෙනහිර පළාත් වැසියන්ට යුද්ධ හමුදාව අවසර නොදුන්නේය.

2012 නොවැම්බර් මාසයේ දී යාපනය මානව හිමිකම් කොමිෂන් සභා කාර්යාලයට යාපනය හා කිලිනොච්චිය අවට පදිංචි සරසවි සිසුන් 47 දෙනෙකු ත්‍රස්ත විමර්ශන ඒකකය විසින් අත් අඩංගුවට ගත් බවට පැමිණිලි ලැබී තිබුනී. මෙම පිරිසෙන් 44 දෙනෙකු එල් ටී ටී ඊ සැකකරුවන් වශයෙන් සලකා වහාම බූස්සේ පිහිටි ත්‍රස්තවාදී සැකකරුවන් රඳවා තබන කඳවුරට යවන ලද්දේය.[187]

මේ ආකාරයටම 2012 දෙසැම්බර් මස යාපනය සරසවියේ ශිෂ්‍ය නායකයින් දෙදෙනකු වන ෂන්මුගම් සොල්මන් යන සරසවි සිසුවාත්, යාපනය සරසවි ශිෂ්‍ය සංගමයේ ලේකම් පි තරාෂ්නාතන් ද, ඇතුළු 4 දෙනෙකු අත් අඩංගුවට ගත්තේය. ප්‍රථමයෙන් ඔවුන් වවුනියාව පොලිසියේ රඳවා ගෙන ප්‍රශ්න කළ අතර, ඉන් තිදෙනකු වැලිකඩ ත්‍රස්තවාදී සැකකරුවන් පුනරුත්ථාපන මධ්‍යස්ථානයට මාරු කොට යැවීය. ඔවුන් කිසිදු චෝදනාවකින් තොරව පුනරුත්ථාපනය පිණිස යැයි කියමින් වැලිකඩ බන්ධනාගාරයේ රඳවා තබා ගනු ලැබීය.[188] ඉන් දෙදෙනකු 2013 පෙබරවාරි මස නිදහස් කළේය. ඇම්නස්ටි ඉන්ටර්නැෂනල් සංවිධානය මෙම ශිෂ්‍යයන් නිදහස් කර මෙන් ඉල්ලා ප්‍රකාශයක් නිකුත් කළු අතර පෙබරවාරි 13 ජනාධිපතිවරයා ගේ යාපනයේ සංචාරයේ දී මෙම සිසුන් ගේ දෙමාපියන් කළ ඉල්ලීමකට කන් දීමක් වශයෙන් ඔවුන් නිදහස් කරන ලදී.[189]

ශ්‍රී ලංකා ජන මාධ්‍ය වාර්තා වලට අනුව මෙම ශිෂ්‍යයන් අත් අඩංගුවට ගැනීමෙන් පසු ඔවුන් ගෙන් යාපනයේ දේශපාලන කාර්යාලකට අත් බෝම්බයක් විසි කිරීමේ සිද්ධිය හා ශිෂ්‍ය විරෝධතා ව්‍යාපාර පිළිබඳව ප්‍රශන කරන ලද්දේය. නමුත් යාපනය සරසවියේ විද්‍යා පීඨ ආචාර්ය මණ්ඩලය දෙසැම්බර් 7 වන දින ජනාධිපතිවරයා අමතා නිකුත් කළ ලිපියක් මගින් අත් බෝම්බ සිද්ධිය මෙම සිසුන් අත් අඩංගුවට ගැනීමට පූර්ව සූදානමින් කරන ලද මිස එම සිද්ධියට මොවුන් කිසිසේත්ම සම්බන්ධ නොමැති බව කියා සිටියේය.[190] එම ලිපියෙන් තවදුරටත් පෙන්වා දුන් කාරණයක් වූයේ අවිහිංසාවාදී දේශපාලන විරෝධතා ව්‍යාපාරයක් වැළැක්වීමට ත්‍රස්තවාදය වැළැක්වීමේ පණත යටතේ ක්‍රියා කිරීම මෙම සිසුන් ගේ විරෝධතාවයට හේතුව වූ බවයි.[191]

මෙම සිද්ධියට අදාළව තවත් සිසුන් කිහිප දෙනෙකු ද අත් අඩංගුවට ගන්නා ලදී. දෙසැම්බර් 6 වන දින ත්‍රස්තවාදී විමර්ශන ඒකකයෙන් පැමිණි නිලධාරියෙක් සිසුන් 10 දෙනෙකු ගේ නම් ලැයිස්තුවක් ඉදිරිපත් කරමින් ඔවුන් යාපනය පොලිසියට බාර දෙන මෙන් ඉල්ලා සිටියේය. වෛද්‍ය පීඨයේ පීඨාධිපතිවරයා සිසුන් පස් දෙනෙකු යාපනය පොලීසියට බාර දෙන ලදී.තවත් එක් සිසුවෙක් සිය පියා සමග පැමිණ බාර වුයේය. ඉතිරි සිසුන් ආරක්ෂාව පතා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත පැමිණි අතර ඔවුන් ද පසුව පොලීසිය බාරයට ගෙන ප්‍රශ්න කිරිමෙන් පසු නිදහස් කළේය.

## ජේ. සී. වැලිඅමුණ; ජයම්පති වික්‍රමරත්න; එම්. ඒ. සුමතිරන් ;රොමේෂ්. ඩී. සිල්වා ඇතුළු නීතිවේදීන්ට එරෙහිව එල්ල වන තර්ජනඃ

2013 කළේය ජනවාරි 17 දින ලංකා ඊ නිව්ස් වෙබ් අඩවියෙහි (මෙම වෙබ් අඩවිය ශ්‍රී ලංකාව තුළ කියවීමට නොහැක) පළ වූ වාර්තාවකට අනුව 'අධිකරණයේ ස්වාධීනත්වය සඳහා වන නීතිඥ එකතුවෙහි'ප්‍රමුඛ මෙන්ම නොබියව අදහස් පළ කරන නීතිඥ ජේ.සී.වැලිඅමුණ ඝාතනය කිරීමේ සැලැස්මක් පිළිබඳව වාර්තාවක් පළ කළේය. එම වාර්තාවට අනුව මෑතකදී බන්ධනාගාරයෙන් නිදහස් වූ 'කුලී අපරාධකරුවෙකු', ජනාධිපති ආරක්ෂක

අංශයේ හා විශේෂ කාර්ය බලකායේ තෝරා ගත් පිරිසක් ඇතුළු කණ්ඩායමක් ලවා ජේ සී වැලිඅමුණ ඝාතනය කිරීමේ සැලැස්මක් තිබින.[192] නීතිඥ ජේ සී වැලිඅමුණ මෙම වාර්තාව සම්බන්ධයෙන් ප්‍රතිචාර දක්වමින් තමා ඝාතනය කිරීම සම්බන්ධයෙන් ජනාධිපති ආරක්ෂක අංශයේ හා විශේෂ කාර්ය බලකායේ සම්බන්ධයක් ඇත්දැයි තමා නොදන්නා නමුත් තමා පසු පස දින කිහිපයක් ඔත්තු බැලූ තැනැත්තා නම ගිය අපරාධකරුවෙකු බව පොලිසිය සනාථ කළ බව කියා සිටියේය.

නීතිඥ සාමුහිකය ජනවාරි 23 දින ප්‍රකාශයක් නිකුත් කරමින්, අග විනිසුරු වරිය ගේ දෝෂාභියෝගය සම්බන්ධයෙන් මැදිහත් වූ තම සංවිධානයේ නීතිවේදීන්ට එල්ල වී තිබෙන වාචිත හා ලිඛිත 'තර්ජන හා බිය වැද්දීම්' පිළිබඳ දැඩි අවධානය යොමු කරන බව කියා සිටියේය. ජේ. සී වැලිඅමුණට අනුව, තමාට මෙන්ම තමා සමකාලින නීතිවේදීන් වන ජයම්පති වික්‍රමරත්න හා එම් ඒ සුමතිරන් ( ටි. එන්. ඒ. පාර්ලිමේන්තු මන්ත්‍රී) යන අයට ජනවාරි මාසයේ දී තර්ජනාත්මක ලිපි ලැබී තිබින. මීට සමාන ලිපියක් දෝෂාභියෝගයේ දී අගවිනිසුරු ශිරානී බණ්ඩාරනායක වෙනුවෙන් පෙනී සිටි ජනාධිපති නීතිඥ රොමේෂ් ඩී සිල්වා ට තමන්ට සමාන ලිපියක් ලැබී තිබෙන බව වැලිඅමුණ විසින් තවදුරටත් හෙළිදරව් කළේය. මේ සියළු දෙනාම තමන්ට එල්ල වී තිබෙන තර්ජන පිළිබඳ ආදළ පොලීස් ස්ථාන වලට පැමිණිලි කර තිබෙන නමුත් එම පැමිණිල විමර්ශනය කිරීම පිළිබඳ කිසිදු ප්‍රගතියක් නැතැයි ද ඔහු තවදුරටත් කියා සිටියේය.

නීතිඥ වැලිඅමුණ පිළිගත් මානව හිමිකම් ආරක්ෂයෙකු වන අතර ඔහුට මීට පෙර අවස්ථා කිහිපයකදීම සිය මෙහෙවර හේතු කොට ගෙන තර්ජන හා බිය වැද්දීම් වලට ගොදුරු වුවෙකී. 2008 සැප්තැම්බර් මස 27 දින රාත්‍රියේ ඔහු ගේ නිවසට අත් බෝම්බ දෙකක් දමා ගැසු අතර ඉන් එකක් පුපුරා ගිය නමුත් කිසිවෙකුටත් අනතුරක් නොවීය. 2010 දී මාධ්‍ය විසින් ඔහු එවකට අධ්‍යක්ෂක ධූරය දැරූ ට්‍රාන්ස්ෆේරන්සි ඉන්ටර්නැෂනල් නම් රාජ්‍ය නොවන සංවිධානයේ සිදු වි ඇතැයි කියන මුල්‍ය වංචාවන් පිළිබඳ නින්ද අපහාස කිරීමේ ප්‍රචාරක ව්‍යාපාරයක් දියත් කොට තිබුනි.[193] එහෙත් මේ කිසිදු සිද්ධියක් සම්බන්ධයෙන් පොලීසිය කිසිම එළදයි පියවරක් ගත බව වාර්තා නොවේ.

අගවිනිසුරුවරියට එරෙහි දෝෂාභියෝගයට විරුද්ධත්වය පළ කළ වෙනත් නීතිවේදීන්ට ද මේ හා සමාන පහර දීම් හා තර්ජන එල්ල වූ අතර ඊට හේතු ව තමන් දෝෂාභියෝගය සම්බන්ධයෙන් ගත් ස්ථාවරය බව ඔවුන් ගේ විශ්වාසයයි.

2012 දෙසැම්බර් 18 වන දින යුද්ධ හමුදවට සමාන ඇඳුමින් සැරසුන ආයුධ සන්නද්ධ සතර දෙනෙක් නීතිවේදී ගුණරත්න වන්නිනායක ගේ මෝටර් රථය හරස් කොට ඔහු එළියට ඇද ගැනීමට තැත් කරන ලද්දේය. තමා ගේ කෑ ගැසිම ඇසී අසල්වැසියන් සිද්ධිය වූ ස්ථානයට පැමිණිමත් සමඟම ඔවුහු පළා ගිය ගුණරත්න වන්නිනායක ප්‍රකාශ කළේය. මීට දින දෙකකට පසුව ශ්‍රී ලංකා නීතිඥ සංගමයේ එවකට සිටි සභාපති නීතිවේදී විජේදස රාජපක්ෂ ගේ නිවසට එළිවෙන යාමයේ දී වෙඩි තබන ලදී. තමාට තෙවරක් වෙඩි හඬ ඇසුන බවත් ඉන් අනතුරුව වාහනයක් තම නිවස අසලින් නික්ම යන හඬ ඇසුන බවත් ඔහු ප්‍රකාශයක් නිකුත් කරමින් කියා සිටියේය.[194] මෙම සිද්ධීන්ට අමතරව 2013 ජනවාරි මාසයේ දී දෝෂාභියෝග විරෝධී රැස්වීමක් අවසානයේ සිය නිවසට යමින් සිටි 'නීතිඥ සාමුහික' යේ සාමාජික නීතිවේදිනියක් මෝටර් බයිසිකලයක පැමිණි තරුණයන් දෙදෙනකු තමා ඇඳ ගෙන යාමට තැත් කළ බව කියා සිටියාය. [195]

2013 පෙබරවාරි මුල් සතියේ අන්තර් ජාතික නීතිඥ සංගමයේ මානව හිමිකම් කමිටුවේ සාමාජිකයින්, මෙරට අධිකරණයේ වර්තමාන තත්වය තක්සේරු කිරීම පිණිස, ශ්‍රී ලංකාවට පැමිණිමට නියමිතව තිබියදී, ඔවුන්ට නිකුත් කොට තිබු විසා බලපත්‍ර රජය විසින් අවලංගු කරන ලද්දේය. ශ්‍රී ලංකා රජය ප්‍රකාශයක් නිකුත් කරමින් කියා සිටියේ ඔවුන් සිය සංචාරය පිණිස ආදළ විසා බලපත්‍ර ඉල්ලුම් කොට නොතිබු නිසා නිකුත් කළ විසා

බලපත්‍ර අහෝසි කරන්නට සිදු වූ බවයි. නමුත් අන්තර් ජාතික නීතිඥ සංගමය මෙම ප්‍රකාශය ප්‍රතික්ෂේප කරමින් කියා සිටියේ, තම සංචාරයේ අරමුණ වූ ප්‍රවීණෝපදේශක සාකච්ඡා හා සම්මන්ත්‍රණ පැවැත්වීමට ආදාළ විසා බලපත්‍ර තමන් ඉල්ලුම් කළ බවයි.'[196]

## (සිවිල් සමාජයේ) ජාත්‍යයන්තර සම්බන්ධතා ප්‍රතිප්‍රහාරයට ලක් කිරීමඃ

ශ්‍රී ලංකා බලධාරීන්, විශේෂයෙන්ම සිය මානව හිමිකම් 'වාර්තාව' පිළිබඳව ජාත්‍යයන්තර ප්‍රජාව විසින් විවේචනය කිරීම කෙරෙහි සංවේදී බවත්, මානව හිමිකම් ජාත්‍යයන්තර රැස්වීම් වලට සහභාගි වන ශ්‍රී ලංකික මානව හිමිකම් ක්‍රියාකාරීන් හා ජාත්‍යයන්තර ප්‍රජාවට තොරතුරු සපයන්නේ යැයි සැක කරන මෙරට සිවිල් සමාජ ක්‍රියාකාරීන්ට පහර දීමට පසුබවට නොවන බවත් නොබියව ප්‍රදර්ශනය කරයි. මෙම පසුබිම තුළ විශේෂයෙන්ම උතුරු හා නැගෙනහිර පළාත් වල මානව හිමිකිම් ආරක්ෂකයින්ට වාර්තා කිරිම ඉතා දුෂ්කර කාර්යක් වි තිබේ. මෙම පළාත් වල ක්‍රියාකාරීන්ට තමන් මුහුණ දෙන අභියෝග වාර්තා කිරීම කොළඹ කේන්ද්‍ර කොට ගෙන ක්‍රියාකරන මානව හිමිකම් ක්‍රියාකාරීන්ට තරම් ආරක්ෂා සහිත නොවේ. ප

උතුරු හා නැගෙනහිර පළාත් වලින් ඉදිරිපත් කරන පහත සඳහන් නිදර්ශන පිළිබඳ සම්පුර්ණ වාර්තා ඇම්නස්ටි ඉන්ටර්නැෂනල් සංවිධානය සතුව තිබෙන අතර පහත දැක්වෙන්නේ එම සිද්ධීන් පිළිබඳ ඉතාමත් ලඝු සටහනක් වන අතර ඊට සම්බන්ධ තැනැත්තන් ගේ අනන්‍යතාවය සම්පුර්ණයෙන්ම වසන් කොට තිබේ.

## පීඩනයට ගොදුරු වූ කාන්තා සංවිධානඃ

2012 අප්‍රියෙල් මාසයේ එක්සත් ජාතීන් ගේ සංවිධානය විසින් 19/2 යෝජනාව සම්මත කිරීමෙන් පසු උතුරු හා නැගෙනහිර පළාත් වල ක්‍රියාකාරී කාන්තා සංවිධාන හතරකට අපරාධ පරීක්ෂණ දෙපාර්තුමේන්තුවේ යැයි හඳුන්වා ගත් කණ්ඩායමක් පැමිණ එම සංවිධානයන් හි ක්‍රියාකාරකම්, ආධාර සපයන සංවිධාන හා කාර්ය මණ්ඩලය පිළිබඳ සවිස්තරාත්මක තොරතුරු විමසන ලද්දේය. මෙම සිද්ධියෙන් පසු සිවිල් ඇඳුමින් සැරසුන නිලධාරීන් එම සංවිධානයන් හි අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් ගේ හා ඉහළ පෙළේ නිලධාරීන් ගේ නිවෙස් කරා ගොස් එම නිවැසියන් ගෙන් පමණක් නොව අසල් වැසියන් ගෙන් පවා තොරතුරු විමසීය.

මෙවැනිම සිද්ධීන් කිහිපයක් පිළිබඳ 2012 දෙසැම්බර් හා 2013 ජනවාරි මාස වල ඇම්නස්ටි ඉන්ටර්නැෂනල් සංවිධානයට වාර්තා වුයේය. එම අනුව අඩුම තරමින් පුද්ගලයින් සය දෙනෙකු ගෙන් වත් අපරාධ පරීක්ෂණ දෙපාර්තුමේන්තුව ඔවුන් ගේ සංවිධාන කටයුතු පිළිබඳව ප්‍රශ්න කළ අතර බලධාරීන් ගේ අභිප්‍රාය වි තිබුනේ ජාත්‍යයන්තර ප්‍රජාවට තොරතුරු සපයන්නන් නිහඬ විය යුතුය යන සංඥාව නිකුත් කිරිම බවයි.

## මානවීය සහන සේවකයෙකු අත්අඩංගුවට ගෙන වධ හිංසා පැමිණවීමඃ

2012 දී අපරාධ පරික්ෂණ දෙපාර්තුමේන්තුව විසින් මානවීය සහන සේවා කටයුතු වල නියැලි සේවකයෙකු අත් අඩංගුවට ගෙන ඔහු ගේ ජාත්‍යයන්තර සම්බන්ධතා පිළිබඳව ප්‍රශ්න කළ බවත් අවසානයේ දී තමා හා තම සගයින් එල් ටි ටි ඊ සංවිධානයට සේවය කළ බව පිළි ගන්නා පාපෝච්චාරණයකට අත්සන් කිරීමට බල කළ බවත් වාර්තා විය. ඇම්නස්ටි ඉන්ටර්නැෂනල් සංවිධානයට විස්තර කළ අන්දමට ඔහුට දිර්ඝ වේලාවක් ලද වධ හිංසා පමුණුවන ලද අතර ඔහු තමාගේ තුවාල සම්බන්ධයෙන් වෛද්‍ය ප්‍රතිකාර ලබා ගැනීමට හෝ පැමිණිලි කිරීමට තැත් කළහොත් සිය පවුලම ඝාතනය කරන බවට තර්ජනය ද කර තිබුනි.[197]

## අතුරුදහන් වුවන් ගේ පවුල් සාමාජිකයින් ගේ කොළඹ සංචාරය වාරණය කිරීම:

වවුනියාවේ මානව හිමිකම් ක්‍රියාකාරීන් ගේ වාර්තා වලට අනුව 2013 මාර්තු 5 දින උතුරේ පදිංචි අතුරුදහන් වුවන් ගේ පවුල් සාමාජික සාමාජිකාවන් හත්සීයයකට ආසන්න පිරිසක් බස්රථ 11 කින් කොළඹ බලා පිටත් වී තිබුනී. ඔවුන් ගේ අභිලාෂය වුයේ යට අතුරුදහන් වු හෝ අත්තනෝමතික ලෙස රඳවා සිටින තම පවුලේ සාමාජික සාමාජිකාවන් ගේ ඉරණම පිළිබඳ තොරතුරු දැන ගැනීමට මැදිහත් වන ලෙස ඉල්ලා එක්සත් ජාතීන් ගේ කාර්යාලයට පෙළපාලියකින් ගොස් පෙත්සමක් බාර දීමයි.

මෙම බස් රථ සමුහය වවුනියාවට උතුරෙන් පිහිටි ඕමන්තේ යුද්ධ හමුදා මුරපොළේ දී නතර කරනු ලැබිනි. බස්රථ රියදුරන් ගෙන් ප්‍රශ්න කළ අතර ඔවුන්ට තවදුරටත් ඉදිරියට ධාවනය නොකරන ලෙසට තර්ජනය කරන ලද අතර අත්අඩංගුවට ගත් බස්රථ එහි මගීන් සමගම වවුනියාවේ පිහිටි නගර සභා පිට්ටනියට යුද්ධ හමුදා මුරකාවල් මධ්‍යයේ ගාල් කරන ලදී. යුද්ධ හමුදාව මෙම පිරිසට සිය කොළඹ ගමන අත්හැර ආපසු නිවෙස් බලා යන ලෙසට තර්ජනය කළ අතර ආහාර පාන ජලය හෝ වැසිකිලි කැසිකිලි පහසුකම් කිසිවක් ලබා නොදෙන ලද්දේය. මෙම කණ්ඩායමෙන් ඉතා කුඩා කණ්ඩායමකට කොළඹ බලා යාමට ඉඩ දුන් අතර ඔවුහු කොළඹට පැමිණ සිය පෙත්සම එක්සත් ජාතීන් ගේ කාර්යාලයට බාර දෙන ලදී. වවුනියාවේ රැඳි සිටි කණ්ඩායම මාර්තු 6වන දින වවුනියාව නගරයේ උල්සෝෂණයක් පැවැත්විමෙන් පසු ආපසු විසිර ගියෝය.[198]

## සුනිලා අබේසේකර, සුනන්ද දේශප්‍රිය, නිමල්කා ප්‍රනාන්දු, පාක්‍යසෝති සරවනමුත්තු හා ජේ සී වැලිඅමුණ:

2012 මාර්තු මාසයේදී ආණ්ඩුවේ ජනමාධ්‍යයන් විසින් ජිනීවා හි මානව හිමිකම් කවුන්සිලයේ රැස්වීම් වලට සහභාගි වෙමින් සිටි ශ්‍රී ලංකික

සිවිල් සමාජ නියෝජිත පිරිස ඉලක්ක කොට ගෙන තර්ජනාත්මක වැඩ සටහන් විකාශය කරන්නටත් ලිපි පළ කරන්නටත් පටන් ගත්තෝය. ශ්‍රී ලංකා ජනමාධ්‍ය විසින් විශේෂයෙන්ම ඉලක්ක කොට තිබුනේ ඉන්ෆෝම් හා කාන්තාව, මාධ්‍ය සාමුහිකය හා ගෝබල් කැම්පෙන් ෆෝ විමෙන්ස් හියුමන් රයිට්ස් හි සුනිලා අබේසේකර, අධ්‍යක්ෂක, විමෙන්ස් ඉන්ටර්නැෂනල් මුව්මන්ට් එගෙන්ස්ට් ඩිස්ක්‍රිමිනේෂන් හා නීතිවේදීනියක් වන නිමල්කා ප්‍රනාන්දු, විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයෙහි අධ්‍යක්ෂ පාක්‍යසෝති සරවනමුත්තු, එක්සත් ජාතීන් ගේ සිවිල් සංවිධාන රැස්වීම් වලට සහභාගි වන සුනන්ද දේශප්‍රිය හා නීතිඥ ජේ. සී. වැලිඅමුණයි. ඔවුන්ට පොදුවේ එල්ල කළ චෝදනාව වුයේ එල් ටි ටි ඊ සංවිධානයෙන් මුදල් ලබා ගනිමින් 'ජාතිද්‍රෝහි' කටයුතු වල නිරත වන බවයි.
මීට පෙර අවස්ථාවක මාධ්‍යවේදී පොද්දල ජයන්තට පහර දීම[199] හා රටින් පිටව යන ලෙසට තර්ජනය කිරීමේ වගකීම බාර ගත් මහජන අමාත්‍ය මර්වින් සිල්වා මෙවරත් ඉදිරියට පැමිණ සුනන්ද දේශපිය ගේ ඇටකටු කුඩු කරන බව ප්‍රසිධියේ තර්ජනය කළේය.[200]

2012 මාර්තු 23 දින එනම් ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් එක්සත් ජාතීන් ගේ මානව හිමිකම් කමිටු යෝජනාව සම්මත කළ දින, ශ්‍රී ලංකාවේ සිට එහි පැමිණී සිටින ශ්‍රී ලංකික මානව හිමිකම් ආරක්ෂකයින්ට හා සිවිල් සමාජ නියෝජියින්ට හිරිහැර නොකරන මෙන්, ශ්‍රී ලංකා රාජ්‍ය නියෝජිත පිරිසෙන් ඉල්ලා සිටිමට එක්සත් ජාතීන් මානව හිමිකම් කොමසාරිස්වරියට සිදුවිය. මානව හිමිකම් කොමසාරිස්වරිය ගේ මාධ්‍ය ප්‍රකාශක රූපට් කොල්විල් මේ සම්බන්ධයෙන් ප්‍රකාශයක් කරමින්, ' නොකඩවාම පිළිගත

නොහැකි තරමට ශ්‍රී ලංකාවේ සිට ජිනීවා වලට පැමිණ සිටින ශ්‍රී ලාංකික සිවිල් සමාජ නියෝජිත පිරිසට තර්ජනය කිරීම් හා බිය වැද්දීම් කරන බව' කියා සිටියේය.[201] 2012 ජනවාරි සිට ශ්‍රී ලංකාවේ මාධ්‍ය විසින් මානව හිමිකම් ක්‍රියාකාරීන් 'රාජ්‍ය නොවන කල්ලිය' වශයෙන් නොකඩවාම හඳුන්වා දෙමින්, ඔවුහු රාජද්‍රෝහී, ත්‍රස්තවාදීන් ඇසුර කරන කුලී හේවායන් කණ්ඩායමක් ලෙස හඳුන්වා දෙමින් හෙළා දකින බව කියා සිටියේය. ඔවුන් ඝාතනය කිරීමටත් ඔවුන් ගේ නිවාස ගිනිබත් කිරීමට යෝජනා කර තිබූ ඇතැම් පුවත් පත් ලිපි හා මාධ්‍ය වැඩසටහන් පිළිබඳ කර්තෘත්වය ශ්‍රී ලංකා රජය විසින් ජිනීවා මානව හිමිකම් සමුළුවට නිල වශයෙන් එවන ලද නියෝජිත පිරිසට අයත් වූ සාමාජිකයන් විසින් දරන ලද බවත් ඔහු විසින් පෙන්වා දෙන ලද අතර ජිනීවා සිටින ශ්‍රී ලංකා නිත්‍ය නියෝජිතයාට තර්ජනාත්මක ලිපි ලැබෙන බව කියා සිටියේය.[202]

## මාධ්‍යවේදී ඥානසිරි කෝට්ටේගොඩට රටින් පළා යන්නට බල කෙරේ:

ශ්‍රී ලංකාවේ වෘත්තීය ජනමාධ්‍යවේදී සංවිධානයේ සභාපති ඥානසිරි කෝට්ටේගොඩ විසම්මුතිකවාදී මාධ්‍යවේදීන්ට එරෙහි මර්දනයේ තවත් එක් වින්දිතයෙක් වෙයි. 2012 දී ඔහු ජිනීවා හි සැසිවාරයට සහභාගි වීමෙන් පසු ඔහුට එරෙහිව ගෙන යන ලද හෙළා දැකීමේ මාධ්‍ය ප්‍රචාරය නිසා හෙතෙම ලංකාවෙන් පලා ගිය ගියේය. 2013 මාර්තු මාසයේ දී ඇම්නෙස්ටි ඉන්ටර්නැෂනල් සංවිධානයට ප්‍රකාශයක් කළ ඥානසිරි මේසේ කියා සිටියේය.

'මම වසර විස්සක් පමණ සේවා කාලයක් තිබෙන ජනමාධ්‍යවේදීයෙක්. මම බිබිසි සිංහල සේවයට සම්බන්ධ නිසා ආණ්ඩුවට මගේ ප්‍රවෘත්ති හා වැඩ සටහන් වාරණය කරන්නට පුළුවන් කමක් නැහැ. මේ නිසා මම විශ්වාස කරනවා මට පහර දෙන්නෙ ඒ නිසාය කියලා. ගිය අවුරුද්දේ මාර්තු මාසයේ දී මම ඒ වගේ 'නින්දිත මඩ ප්‍රචාරයක' වින්දිතයෙක් වුනා. 2012 ජිනීවා හි යෝජනාව සම්මත වුනාට පස්සේ අයි ටි එන් රූපවාහිනී නාලිකාව මට විරුද්ධව මඩ ප්‍රචාරයක් දියත් කරමින් මගේ ඡායාරූපයක් පවා පෙන්නලා මම දේෂ ද්‍රෝහියෙක් ලෙසට නම් කළා. 2012 මාර්තු මාසයේ මාධ්‍ය සාකච්ඡාවකදී මම මේ ප්‍රශ්නය මතු කළා. 'ඔබ හිතනවා නම් මම දේශ ද්‍රෝහියෙක් කියලා ඇයි මාව අත් අඩංගුවට ගෙන නඩු පවරන්නේ නැත්තේ' කියාලා මම ඇහුව්වා. ආණ්ඩුවේ මාධ්‍ය ප්‍රකාශකයා මගේ ආරක්ෂාව පිළිබඳ යම් සහතිකයක් දුන්නත් ඒ සමගම යුද්ධ හමුදාව මගේ ගෙදරට ඇවිත් මගෙන් දිගින් දිගටම ප්‍රශ්න කළා. මාව හොයන බව දැන ගත් ගමන්ම මම හැංගුනා. ශ්‍රී ලංකාවේ මිනිස්සු පැහැර ගන්නේ මහ දවාලේ. ශ්‍රී ලංකාවේ තවදුරටත් විමර්ශනාත්මක මාධ්‍ය භාවිතයකට අවකාශයක් නැහැ. ආණ්ඩුව ඔබට අකමැති නම් ඔබ දේශ ද්‍රෝහියෙක් ලෙසට හඳුන්වනවා. ආරක්ෂාව පතා මට රටින් පළා යන්නට සිදුවුනා.'[203]

## ප්‍රගීත් එක්නැළිගොඩ ගේ භාර්යාව සන්ධ්‍යා එක්නැළිගොඩ:

අතුරුදහන් මාධ්‍යවේදී ප්‍රගීත් එක්නැළිගොඩ ගේ බිරිඳ සන්ධ්‍යා එක්නැළිගොඩත් මෙවැනිම තර්ජනයකට මුණ දී සිටින්නීයක්. ඇය ද 2012 මාර්තු මාසයේ ජිනීවා හි පැවති මානව හිමිකම් සමුළුවට සහභාගි වූ අතර එහි ඇය සිය සැමියාගේ අතුරුදහන් වීම පිළිබඳ දැනට පවතින තත්වය සමුළුවට ඉදිරිපත් කළේය. ආපසු ශ්‍රී ලංකාවට පැමිණි ඇය මාර්තු මාසය අවසාන සතියේ හෝමාගම මහේස්ත්‍රාත් අධිකරණයේ විභාග වෙමින් තිබෙන සිය සැමියා පිළිබඳ හබයාස් කොපුස් ඉල්ලීම පිළිබඳ නඩු විභාගයේදී රජයේ නීතිඥවරයා ඇයගේ ජිනීවා සංචාරය පිළිබඳව සැරපරුෂ ලෙස දිගින් දිගටම ප්‍රශ්න කරමින් ඇය ජිනීවා හි කළ කී දෑ මෙන්ම ඇයට අන්තර් ජාතික රාජ්‍ය නොවන සංවිධානයන් ගෙන් එම සංචාරය සඳහා කොපමණ මුදලක් ලැබුනේ දැයි ප්‍රශ්න කර සිටියේය. ඔහු ශ්‍රී ලංකා

ආණ්ඩුවට විරුද්ධව කරුණු ඉදිරිපත් කිරීම පිළිබඳව චෝදනා කිරීමට ද පසුබට නොවීය.[204]

## හර්මන් කුමාර ජාතික ධීවර සහයෝගිතා ව්‍යාපාරයඃ

දිර්ඝ කාලයක් තිස්සේ මානව හිමිකම් වෙනුවෙන් පෙනී සිටින ධීවර සහයෝගීතා ව්‍යාපාරයේ කැඳවුම්කරු වන හර්මන් කුමාර රෝමයේ පිහිටි කෘෂිකාර්මික සංවර්ධනය පිළිබඳ අන්තර් ජාතික අරමුදල විසින් සංවිධානය කරන ලද සමුළුවට සහභාගි වීමෙන් පසු තර්ජනයන්ට මුණ දුන් බව වාර්තා විය. මෙම තත්වය 2012 මාර්තු මාසයේ පැවති එක්සත් ජාතීන් ගේ මානව හිමිකම් සමුළුවට ශ්‍රී ලංකා සිවිල් සමාජ නියෝජිත පිරිසේ සාමාජිකයෙක් වශයෙන් සහභාගි වීමෙන් පසු වඩාත් උග්‍ර වූයේය.[205]

ඉන්ධන මිල 2012 පෙබරවාරි මස ඉහළ දමන ලද අතර, ඊට එරෙහිව ධීවර කාර්මිකයින් විසින් පවත්වන ලද විරෝධතා මර්දනය කිරීම පිණිස, පොලීසිය හා ආරක්‍ෂක හමුද විසින් පෙළපාළිකරුවන්ට වෙඩි තබන ලද අතර එහිදී එක් ධීවර කාර්මිකයෙක් මිය ගියේය[206]. ශ්‍රී ලංකා බලධාරීන් හා රාජ්‍ය ජන මාධ්‍ය විසින් එම විරෝධතාව සංවිධානය කළ රාජ්‍ය නොවන සංවිධාන වෙත චෝදනා කරමින්, එම සංවිධාන විසින් මරණයේ වගකීම බාර ගත යුතු යැයි කියා සිටියේය. පෙබරවාරි 23 දින කැබිනට් තීරණ දැනුම් දීමේ පුවත් පත් සාකච්ඡාවේදී ආණ්ඩුවේ ආමාත්‍යවරු ඉහත කී විරෝධතාව එන් ජී ඕ කුමන්ත්‍රණයක් ලෙස හැඳින්වූ අතර ධීවර අමාත්‍යවරයා හර්මන් කුමාර මිනීවරුවෙක් බව ප්‍රකාශ කළ නමුත් ඒ සම්බන්ධයෙන් ප්‍රතිප්‍රකාශයක් කළ හර්මන් කුමාර තම සංවිධානය හෝ තමා එම විරෝධතාවට කිසිදු සම්බන්ධයක් නොතිබූ බව කියා සිටියේය. හර්මන් කුමාර තමාට නිතරම මරණීය තර්ජන හා බිය වැද්දීම් සිදු කරන බවත් තමා ආරක්‍ෂක අංශ වල පරීක්‍ෂාව යටතේ සිටින බව තමාට හැඟී යන බවත් ප්‍රකාශ කරයි. ඇම්නස්ටි ඉන්ටර්නැෂනල් සංවිධානයට ප්‍රකාශයක් කළ හර්මන් කුමාර තමා රෝම සම්මේලනය නිම වී පෙරළා පැමිණි අවස්ථාවේ තමා බලහත්කාරයෙන් පැහැර ගැනීමට දරන ලද උත්සාහයෙන් තමා නුලෙන් බේරී ගිය බව සඳහන් කළේය. හර්මන් කුමාර 2012 පැවති 19 වන මානව හිමිකම් සැසිවාරයෙන් පසු ජිනීවා හි සිට මාධ්‍ය සාකච්ඡා රාශියකට සහභාගී වෙමින් 'ශ්‍රී ලංකා බලධාරීන් ගෙන් උගත් පාඩම් හා සංහිඳියා කොමිෂන් සභාවේ නිර්දේශ ක්‍රියාත්මක කරන මෙන්' ඉල්ලා සිටින ලද අතර එසේ නොකළහොත් එහි ඵලවිපාක 2013 දී ලැබෙනු ඇතැයි කියා සිටියේය.[207]

## 2013 ආණ්ඩුව 'ජිනීවා' විවේචන මඟ හැරීමේ ප්‍රයත්නයකඃ

බ්‍රිතාන්‍යයේ චැනල් 4 රූපවාහිනී නාලිකාව විසින් නිෂ්පාදනය කරන ලද 'සටන් විමුක්ත කලාපයඃ ශ්‍රී ලංකාවේ ඝාතන බිම්' නැමති චිත්‍රපටිය ඇම්නස්ටි ඉන්ටර්නැෂනල් හා හියුමන් රයිට්ස් වොච් යන සංවිධානයන් ගේ අනුග්‍රහයෙන් 2013 මාර්තු 01 දින ජිනීවාහි පිහිටි මානව හිමිකම් මූලස්ථානයේ ප්‍රදර්ශනය කිරීමට නියමිත විය. ඊට විරෝධය පළ කරමින්, 2013 පෙබරවාරි මස එක්සත් ජාතීන් ගේ සංවිධානයේ ශ්‍රී ලංකා තානාපති රවින්ද්‍රනාථ ආරියසිංහ මානව හිමිකම් කොමිෂන් සභාවේ සභාපතිනියට ලිපියක් ලියන ලද්දේය. එම ලිපියෙන් තානාපතිවරයා කියා සිටියේ ප්‍රදර්ශනයට නියමත චිත්‍රපටිය දේශපාලන අරමුණු ඇතිව නිපදවන ලද්දක් නිසාත් එහි අඩංගු කරුණු නැවත විමසීමක් නොකළ නිසාත් එම චිත්‍රපටිය ප්‍රදර්ශනය කිරීම නතර කරන මෙන්ද ඊට අනුග්‍රහය දක්වන සංවිධාන දෙකෙහි මානව හිමිකම් කොමිෂම විසින් පිරිනමා ඇති උපදේශක තනතුරු ඉවත් කළ යුතු බවත් කියා සිටියේය. මෙම ලිපියට ප්‍රතිචාර දක්වන ලද මානව හිමිකම් සභාපති සිය ලිපියෙන් 'උපදේශක තනතුරු දරන සංවිධාන වලට ප්‍රධාන සැසිවාරයන්ට සමගාමීව අතිරේක වැඩ සටහන් සම්පාදනයට අවසර තිබෙන අතර එම වැඩ සටහන් වල අන්තර්ගතය සම්බන්ධයෙන් ඔවුන් වගකීම භාර ගන්නා බවය' තවද සභාපති සිය ලිපියෙන් මානව හිමිකම් කවුන්සිලයේ කටයුතු වලට සහභාගි වන තානාපතිවරු හා රාජ්‍ය

නොවන සංවිධාන ඇතුළු සියළු දෙනාම, එකිනෙකා කෙරෙහි ගෞරවයෙන් හා බුහුමානයෙන් ප්‍රශ්න සාකච්ඡා කළ යුතුයැයි පෙන්වා දුන්නේය. මෙයින් අදහස් වන්නේ අපි අන් අයගේ තර්ක විතර්ක සමහර විට අපි පිළි නොගන්නවා වෙන්ට පුළුවන් වුනත් ඒවා ඉවසීමටත් ඒවාට ගරු කිරීමටත් තරම් ශික්ෂණයක් තිබිය යුතු බවයි. අවසාන වශයෙන් ඔහු ශ්‍රී ලංකා කණ්ඩායමට ද තම මතය විදහා දක්වන යම් අංගයක් ඉදිරිපත් කරන මෙන් ආරාධනා ද කළේය.

ආරක්ෂ අමාත්‍යාංශය මාර්තු 5 දින නිවේදනයක් නිකුත් කරමින් චැනල් 4 චිත්‍රපටියට උපකාර කරමින් මුල්‍යමය වාසි ලබා ගෙන ශ්‍රී ලංකාව පවා දුන් තැනැත්තන් හඳුනා ගන්නට සහයෝග දෙන මෙන් ඉල්ලා සිටින බව දිවයින් පුවත් පත් වාර්තා කළේය.[208] මීට ප්‍රතිචාරයක් වශයෙන් චැනල් 4 චිත්‍රපටියේ නිෂ්පාදක කෝලුම් මැක්රේ ප්‍රකාශයක් කරමින් ශ්‍රී ලංකාවේ වාසය කරන කිසිවෙක් මෙම චිත්‍රපටිය සඳහා තමන්ට උපකාර නොකළ බවත් කිසිවෙකුට මුදල් නොගෙවූ බවත් දැඩිව අවධාරණය කළේය. ශ්‍රී ලංකාව මෙම චිත්‍රපටිය සිය ප්‍රතිවාදීන් හඹා යන්නට හෝ විවේචකයින් නිහඬ කිරීමට යොදා ගන්නේ නම් තමන් ඊට තරයේ විරුද්ධ වන බව කීයා සිටියා පමණක් නොව මෙය සමස්ත ලෝකයා ඉදිරියේම හෙළිදරව් කරන්නට තමන් පසුබට නොවන බවද කියා සිටියේය.

ලක්බිම[209] පුවත් පත මාර්තු 9 දින ශ්‍රී ලංකාණ්ඩුවේ අභ්‍යන්තර ආරංචි මාර්ග උපුටා දක්වමින් කියා සිටියේ ආණ්ඩුව ජිනීවා හි සිටින ද්‍රවිඩ සංවිධාන නියෝජිත පිරිස ඉදිරිපත් කරන අදහස් පිළිබඳව ඉතා පරීක්ෂාවෙන් සිටින බවත් රට හෙළා දකින ප්‍රකාශයන් කළහොත් ඔවුන් පෙරළා ශ්‍රී ලංකාවට පැමිණීමේ දී අත් අඩංගුවට ගන්නා බවටත් තීරණය කොට ඇති බව පළ කළේය.[210]

# 4.නිගමනයයන්

ශ්‍රී ලංකාවේ විසම්මුතිය ප්‍රචණ්ඩ ලෙස මර්දනය කිරීමත් දේශපාලන බලය කේන්ද්‍ර ගත වීමත් එකිනෙක අත්වැල් බැඳ ගත් ක්‍රියාවලියකි. 2005 බලයට පත් වීමෙන් පසු රාජපක්ෂ ආණ්ඩුව සිය බලය තහවුරු කර ගත්තේ ඔවුන් සිතන ආකාරයට ඇතැම් ජනවාර්ගික ප්‍රජා සමූහයන් කෙරෙහි මෙන්ම ආයතන හා දේශපාලන කණ්ඩායම් කෙරෙහි බලපෑමක් කළ හැකියැයි පිළිගන්නා සිවිල් සමාජ ක්‍රියාකාරිකයින් ඉලක්ක කොට මර්දනය කිරීමෙනි. එසේත් නැත්නම් බලධාරීන් ට හානිකර තොරතුරු සන්තකයෙහි ඇති තැනැත්තන් ඉලක්ක කොට මර්දනය කිරීමෙනි. ජාතික මට්ටමින් ප්‍රමුඛ දේශපාලනඥයින් හා ජනමාධ්‍යවේදීන්, ක්‍රියාකාරින්, නිතීවේදීන්, විද්වතුන් හා බලපෑමක් සහිත ව්‍යාපාරිකයින් මර්දනය කරයි. නමුත් රාජ්‍ය මර්දනයේ ගොදුරු බවට පත් වන බොහෝ දෙනෙක් බිම් මට්ටමේ ක්‍රියාකාරින් වන සරසවි ශිෂ්‍යයන්, මානවීය සේවකයින්, බලහත්කාරයෙන් අතුරුදහන් කළ ළමුන් වෙනුවෙන් පෙනී සිටින දෙමාපියන් ආදීන්ය.

ජාත්‍යයන්තර ප්‍රජාව ඉදිරියෙහි ශ්‍රී ලංකා ආණ්ඩුව නොකඩවාම ශ්‍රී ලංකාවේ සිදුවන මානව හිමිකම් කඩවීම් අවම කොට, මානවීය නිතීය මෙන්ම නිතියේ ආධිපත්‍ය ද සහතික කරන බවට හිස් පොරොන්දු දෙයි. අනිත් අතට විශේෂයෙන්ම ශ්‍රී ලංකිකයින්, තමන් සාක්ෂි දරන්නාවූ බරපතළ මානව හිමිකම් හා මානවීය නිතී උල්ලංඝණයන් පිළිබඳ තොරතුරු එක්සත් ජාතීන් හා අනෙකුත් අන්තර් ජාතික සංවිධාන ඇතුළු ජාත්‍යයන්තර ප්‍රජවා සමග හුවමාරු කර ගැනිම වැළැක්වීමට ද ක්‍රියා කරයි.

ශ්‍රී ලංකා රජය යුද්ධ සමයේ දී ශ්‍රී ලංකික හමුදා විසින් අන්තර් ජාතික නිතීය යටතේ වරදක් වන බරපතළ අපරාධ සම්බන්ධයෙන් නොකඩවාම ගොනු වන සාක්ෂි බැහැර කරයි. මෙරට වරදින් නිදොස් කිරීමේ වාතාවරණය අඛණ්ඩවම පවතින බව පිළි ගැනිම ශ්‍රී ලංකා රජය විසින් ප්‍රතික්ෂේප කරයි. නමුත් බරපතළ මානව හිමිකම් හා මානවීය නිතීය උල්ලංඝණය කිරිම සම්බන්ධ පැමිණිලි විභාග කිරිම හෝ එකී වින්දිතයින්ට යුක්තිය ඉටු වීමක් ද සිදු නොවෙයි. 2009 මැයි මාසයට ආසන්නව සිදු වූ අයිතිවාසිකම් උල්ලංඝණයන් අතර බලහත්කාරයෙන් අතුරුදහන් කිරිම හා

අධිකරණ බාහ්‍ය ඝාතන සම්බන්ධයෙන් පමණක් නොව ඊට පෙරාතුව පවා සිදු වූ අයිතිවාසිකම් උල්ලංඝණයන් සම්බන්ධයෙන් කිසිදු පියවරක් ගෙන නොමැත. 2006 දී ත්‍රිකුණාමලයේ දී පාසැල් ශිෂ්‍යයන් පස් දෙනෙකු ඝාතනය කිරීම හා එම වසරේ දීම ඒසීඑෆ් නම් වූ ප්‍රංශ මානවීය ආධාර සංවිධානයේ සේවකයින් 17 දෙනෙකු ඝාතනය කිරීම සම්බන්ධයෙන් කිසිදු පියවරක් නොගැනීම මෙම ප්‍රවණතාවය සංකේතවත් කරන නිදර්ශන දෙකක් වෙයි. මෙම සිද්ධීන් දෙකෙහිම ඇසින් දුටු සාක්ෂිකරුවන්ට අනුව අපරාධය සිදු කොට ඇත්තේ ශ්‍රී ලංකාවේ ආරක්ෂ හමුද විසින් වන අතර මේ දක්වා කිසිදු සැකකරුවෙකුට විරුද්ධව විමර්ශනය කිරීමක් හෝ නඩු පැවරීමක් සිදු කොට නැත.

වධහිංසා පැමිණවීම පිළිබඳ එක්සත් ජාතීන් ගේ ක්‍රියාකාරී කමිටුව හා බලහත්කාර අතුරුදහන් කිරීමට එරෙහි ක්‍රියාකාරී කමිටුව යන කමිටු ඉදිරියේ 2008 මෙන්ම 2012 දීත්[211] තම ආණ්ඩුව මානව හිමිකම් සුරකින ආණ්ඩුවක් බව නැවත නැවතත් ප්‍රකාශ කරන ලදි. මානව හිමිකම් පිළිබඳ නිර්ව්‍යාජ වගවීමක් විදේශිකව මෙන්ම ස්වදේශිකවද කරනු ලබන ඉල්ලීම් වලට ප්‍රතිචාරයක් ලෙසට ශ්‍රී ලංකා ආණ්ඩුවට එල්ල කරන මානව හිමිකම් චෝදනා විභාග කිරීම පිණිස අවස්ථා ගණනාවකදීම විවිධ කොමිෂන් සභා පත් කරන ලදි[212]. නමුත්, එම කොමිෂන් සභාවන් හි නිර්දේශ ද ආණ්ඩුව නොසලකා හැරියේය.[213] මීට අමතරව ශ්‍රී ලංකා රජය විසින් නීතීය හා පරිපාලනය ප්‍රතිසංවිධානය කරමින් මානව හිමිකම් සුරක්ෂිත කිරීම පිණිස ජාතික සැලසුම් කිහිපයක්ම පිළියෙළ කොට ඉදිරිපත් කළ නමුත් ඒවා පිළිගත් අන්තර් ජාතික ප්‍රිමිතීන්ට අනුකූල නොවුවා පමණක් නොව, අතවශ්‍ය ප්‍රතිසංස්කරණයන් ඇති කිරීමට ද අසමත් විය. නිදර්ශනයක් වශයෙන් මෙම සැලසුම් මගින් අත්තනෝමතික ලෙස සිරභාරයට ගෙන රඳවා ගෙන සිටින්නට සාධාරණ නඩු විභාගයක් හෝ නිදහස් කිරීමක් සහතික වූ නමුත් තවමත් සිය ගණනක් රැඳවුම් භාරයේ සිටිති. තවද මෙම සැලසුම් මගින් භාෂණය, සමාගමය හා රැස්වීමේ නිදහසට ගරු කරන බව ප්‍රකාශ කළ අතර, මේ දක්වා ම ආරක්ෂක හමුද විසින් රජය විවේචනය කරන්නන්ට තර්ජනය කිරීම, පහර දීම හා සිර ගෙයි ලෑම පමණක් නොව සමහර විට ඝාතනය කිරීම ද කරනු ලබයි.

මානව හිමිකම් කවුන්සිලය විසින් 2012 සම්මත කරන ලද 19/2 යෝජනාව මෙන්ම ඊටත් වඩා බරපතළ කොන්දේසි සහිත 2013 සම්මත කළ 22/1 යෝජනාව, ශ්‍රී ලංකාවේ හිස් පොරොන්දු පිළිබඳ ජාත්‍යයන්තරව නොකඩවා වර්ධනය වන කණස්සල්ල සංකේතවත් කරයි.

22/1 යෝජනාව ශ්‍රී ලංකාවේ අඛණ්ඩව සිදුවන මානව හිමිකම් උල්ලංඝණයන් පිළිබඳ අවධානයක් යොමු කළ අතර, ආණ්ඩුවෙන් මෙරට සිදුවන අන්තර් ජාතික නීතීය හා මානව හිමිකම් උල්ලංඝණයන් පිළිබඳ චෝදනා සම්බන්ධයෙන් ස්වාධීන හා විශ්වසනීය විමර්ශනයක් කරන මෙන් ඉල්ලා සිටින ලදි. තවද ඉහත කී යෝජනාව ක්‍රියාත්මක කිරීම පිළිබඳව පමණක් නොව දැනටත් සිදුවන මානව හිමිකම් උල්ලංඝණයන් පිළිබඳ ප්‍රගතිය ද වාර්තා කළ යුතු අතර 2013 සැප්තැම්බර් මාසයේ පැවැත්වීමට නියමිත මීළඟ ප්‍රගති සමාලෝචනයේ දී මෙම යෝජනාවේ[214] ප්‍රගතිය විමසන බවද සඳහන් වෙයි. එහෙත් එම යෝජනාව මගින් එක්සත් ජාතීන් ගේ මානව හිමිකම් කොමසාරිස්වරිය, අන්තර් ජාතික මානව හිමිකම් නීතීය හා අන්තර් ජාතික මානවීය නීතීය උල්ලංඝණය කරමින් සිදු කළා යැයි චෝදනා කරනු ලබන මානව හිමිකම් උල්ලංඝණයන් පිළිබඳ අපක්ෂපාත හා පිළිගත හැකි පරික්ෂණයක් අවශ්‍ය බව සඳහන් කරනු ලැබූ නමුත්, එවැනි පරික්ෂණයක් ඉල්ලා සිටීමට ඇය අපොහොසත් වුවාය.

ඇම්නස්ටි ඉන්ටර්නැෂනල් සංවිධානය හා අනෙකුත් රාජ්‍ය නොවන සංවිධාන පමණක් නොව එක්සත් ජාතීන් ගේ සංවිධානයේ මහ ලේකම්වරයා විසින් පත් කරන ලද ශ්‍රී ලංකාවේ වගවීම පිළිබඳ

විද්වත් කමිටුව විසින් ද ශ්‍රී ලංකාවේ සිදු වී යැයි කියනු ලබන යුද්ධ අපරාධ, මානව සංහතියට එරෙහිව කරන ලද අපරාධ මෙන්ම අන්තර් ජාතික නීතීය යටතේ වරදක් වන වෙනත් චෝදනා සම්බන්ධයෙන් ද අන්තර් ජාතික මට්ටමේ ස්වාධීන පරීක්ෂණයක් පැවැත්විය යුතු බවට නොකඩවාම ඉල්ලා සිටිනු ලැබේ.

ශ්‍රී ලංකාවේ සිදුවන වරදින් නිදෙස් කිරීම චක්‍රය බිඳ දැමීම පිළිබඳ ශ්‍රී ලංකාවේ ආණ්ඩුව දක්වන උදාසීනත්වය හේතු කොට ගෙන එක්සත් ජාතීන් ගේ සංවිධානය ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් ක්‍රියාත්මක විය යුතු කාලය එළඹ තිබේ. ශ්‍රී ලංකාවේ යුද්ධය පැවති සමයේ ආණ්ඩුව මෙන්ම එල් ටී ටී ඊ සංවිධානය ද විසින් අන්තර් ජාතික නීතීය උල්ලංඝණය කරමින් සිදු කරන ලදැයි චෝදනා කරනු ලබන යුද්ධ අපරාධ සම්බන්ධයෙන් ස්වාධීන පරීක්ෂණයක් අත්‍යවශ්‍ය වෙයි. එබඳු විමර්ශනයකට අනිවාර්යයෙන්ම යුද්ධයේ අවසාන අදියර ආරම්භ වීමට තුඩු දුන් මානව හිමිකම් උල්ලංඝණයන් විශේෂයෙන්ම ත්‍රිකුණාමලයේ පංච පුද්ගල ඝාතනය හා ප්‍රංශ ආධාර සංවිධානයේ සේවකයින් දහත් දෙනා ඝාතනය ද ඇතුලත් ව සිදු වූ මානව හිමිකම් හා අන්තර් ජාතික නීතීය උල්ලංඝණය වීම පිළිබඳ පරීක්ෂණයක් ඇතුලත් විය යුතුය.

පොදු රාජ්‍ය මණ්ඩලය විසින් එක්සත් ජාතීන් ගේ මානව හිමිකම් කවුසිලය විසින් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා බැලිය යුතුය[215]. එක්සත් ජාතීන් ගේ මානව හිමිකම් කවුන්සිලට ස්වකීය වාර්තා හා යෝජනා මගින් නොකඩවාම ශ්‍රී ලංකාවේ සිදුවන ' බලහත්කාර අතුරුදහන් කිරීම්, අධිකරණ බාහ්‍ය ඝාතන, වධහිංසා පැමිණ වීම, භාෂණයේ හා සමාගමයේ නිදහස උල්ලංඝණය කිරීම, මානව හිමිකම් ආරක්ෂකයින්, සිවිල් සමාජයේ සාමාජිකයින්ට හා ජන මාධ්‍ය වේදීන්ට පහර දීම මෙන්ම අධිකරණයේ ස්වාධීනත්වය හා නීතියේ ආධිපත්‍ය තර්ජනයට ලක් කිරීම' පිළිබඳව ප්‍රකාශයට පත් කරන ලදී. මෙම තත්වය යටතේ පොදු රාජ්‍ය මණ්ඩලය ශ්‍රී ලංකාවේ මානව හිමිකම් තත්වය පිළිබඳව සිය අවධානය යොමු කළ යුතුය. ඊට හේතුව 2013 නොවැම්බර් මස ශ්‍රී ලංකාවේ පැවැත්වීමට නියමිත පොදු රාජ්‍ය මණ්ඩලීය නායක සමුළුව හා ඉන් අනතුරුව ශ්‍රී ලංකාව එහි සභාපති පදවිය දෙවසරකට නිල වශයෙන් ශ්‍රී ලංකාව භාර ගැනීම සිදුවිය හැකිය. ශ්‍රී ලංකාව වැනි මානව හිමිකම් සම්බන්ධයෙන් අපකීර්තිමත් වාර්තා ඇති රටක් පොදු රාජ්‍ය මණ්ඩලය තුල එවැනි තත්වයකට පත් වීමට ඉඩ දීම පොදු රාජ්‍ය මණ්ඩලීය මුලධර්ම වලට හාත් පසින්ම පටහැනිය.

මේ මොහොත එක්සත් ජාතීන් ගේ සංවිධානයට මෙන්ම පොදු රාජ්‍ය මණ්ඩලයට ද තීරණාත්මකය. 'ශ්‍රී ලංකාව විසම්මුතියට පහර දෙයි' මැයෙන් ඇම්නස්ටි ඉන්ටර්නැෂනල් සංවිධානය නිකුත් කොට ඇති වාර්තාවේ ප්‍රලේඛනය කොට ඇති සිද්ධින් වැනි මානව හිමිකම් කඩවීම් එළදයි ලෙස අධ්‍යයනය කිරීම මගින් හා එකී වරදවල් සම්බන්ධයෙන් අණ දුන් තැනැත්තන් පමණක් නොව වරදක් සිදු වූ බව දැන දැනත් නිහඬව සිටි තැනැත්තන් හට ද ශ්‍රී ලංකා ආණ්ඩුව නීත්‍යානුකූල නඩු විභාගයන් ආරම්භ කිරීම වැදගත් කඩඉම් සලකුණක් වනු ඇත. එබඳු පියවරක් මානව හිමිකම් උල්ලංඝණය කිරීම සම්බන්ධයෙන් වගවීම පිණිස ශ්‍රී ලංකාව සතු අධ්‍යාශය හා හැකියාව පෙන්නුම් කර ශ්‍රී ලංකාවේ වාසය කරන විසම්මුතිකවාදීන් ග්‍රහණයට හසු කොට ගෙන ඇති අයෝමය හස්තය සලකා බලන විට, අන්තර් ජාතික මැදිහත් වීමක් අනිවාර්ය වෙයි. ශ්‍රී ලංකාවට සිය අන්තර් ජාතික වගවීම ඉටු කරනු පිණිස බලකිරීම එක්සත් ජාතීන් ගේ සංවිධානයේ මෙන්ම පොදු රාජ්‍ය මණ්ඩලයේ ද ද්විපාර්ශික සාමාජිකයින් ගේ භූමිකාවක් වෙයි.

ශ්‍රී ලංකාවේ ශ්‍රේෂ්ඨාධිකරණයෙහි සාමාජිකයින් මෙන්ම අධිකරණ ව්‍යුහයෙහි සාමාජිකයින් ද ඇතුළත්ව ශ්‍රී ලංකා ආණ්ඩුව සිය ගුණදොස් විවේචනය කරන්නන් නොඉවසයි. එවැන්නන්ට බලධාරින් සිය අනුගාමිකයින් ලවා ප්‍රචණ්ඩත්වය මුදා හරිනවා පමණක් නොව නීතියේ ආධිපත්‍යයෙහි යම් කිසිවක් ශේෂ වී ඇත්නම් එහි පිළිසරණ පවා ලබා ගැනිමද වළක්වයි. වරදින් නිදෙස් වීම රජ කරවමින් විසම්මුතියෙහි ගෙල සිරකර තිබෙනතාක් කල් ශ්‍රී ලංකා වර්තමාන රජයේ සංහිඳියාව පිළිබඳ ප්‍රතිපත්තිය හිස් ප්‍රලාපයක් පමණකී.

## නිර්දේශ:

**ඇම්නස්ටි ඉන්ටර්නැෂනල් සංවිධානය විසින් එක්සත් ජාතීන් ගේ සංවිධානයේ සාමාජික රටවල් වෙතින් පහත සඳහන් යෝජනාවන්ට සහයෝග දෙන මෙන් ඉල්ලා සිටියි.**

- ශ්‍රී ලංකා ආණ්ඩුව හා එල්. ටී. ටී. ඊ. සංවිධානය වැනි ආයුධ සන්නද්ධ කණ්ඩායම් විසින් සිදු කරනු ලැබූ බවට චෝදනා කරන අන්තර් ජාතික නීතිය යටතේ වරදක් වන කාරණා සම්බන්ධයෙන් විශ්වසනීය හා අපක්ෂපාත පරික්ෂණයක් පැවැත්වීම පිණිස කටයුතු කිරීම; එබඳු පරික්ෂණයක් පැවැත්විය යුත්තේ අන්තර් ජාතික ප්‍රමිතීන්ට අනුකූලව වන අතර පිළිගත හැකි සාක්ෂි තිබෙන පැමිණිලි සම්බන්ධ වගකිව යුත්තන්ට අන්තර් ජාතික ප්‍රමිතීන්ට අනුකූලව පවත්වනු ලබන සාධාරණ නඩු විභාග ආරම්භ කිරීම;

- එක්සත් ජාතීන් ගේ සංවිධානයේ මානව හිමිකම් ක්ෂේත්‍ර නියෝජිතයින් හා එබඳු යාන්ත්‍රණ සමඟ සහයෝගයෙන් කටයුතු කරනු ලබන පුද්ගලයින්ට තර්ජනය කිරීම හා පළිගැනීම වලක්වන පියවරයන් සහිත මානව හිමිකම් ආරක්ෂකයින් ආරක්ෂා කරන එක්සත් ජාතීන් ගේ යාන්ත්‍රණයන් ශක්තිමත් කිරීම;

- විශේෂයෙන්ම දේශීය වශයෙන් වගවීම පිළිබඳ ක්‍රියාවලින් ගේ ඵලදායිත්වය ඇතුළු ශ්‍රී ලංකාවේ මානව හිමිකම් තත්වය ඉතා සූක්ෂම ලෙස නියාමනය කිරීම;

- 2013 සැප්තැම්බර් 01 දිනට යෙදී ඇති එක්සත් ජාතීන් ගේ මානව හිමිකම් කවුන්සිලයේ 24වන සැසිවාරයේ දී යම් හෙයකින් අන්තර් ජාතික නීතියේ ප්‍රකාරව හෝ මානව සංහතියට එරෙහිව වරදක් කර ඇතැයි අනුමාන කරන සිද්ධීන් හා සම්බන්ධ සැකකරුවන් අධිකරණය ඉදිරියට රැගෙන විත් නොමැති නම් හා භාෂණයේ නිදහස, සමාගමයේ හා රැස්වීමේ නිදහස සම්බන්ධයෙන් සංවිධානාත්මක ප්‍රහාරයන් එල්ල කිරීම වැළැක්වීමට නිසි පියවර ගෙන නොමැති නම් ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් දැඩි පිළිවෙතක් අනුගමනය කරන ලෙසට ඉල්ලා සිටිම;[216]

**ඇම්නස්ටි ඉන්ටර්නැෂනල් සංවිධානය පොදු රාජ්‍ය මණ්ඩලීය මහ ලේකම්වරයා ගෙන් සහ එහි සාමාජික රාජ්‍යයන් ගෙන් මෙසේ ඉල්ලා සිටියි;**

- ශ්‍රී ලංකා ආණ්ඩුව ක්‍රමානුකූල ලෙස සිදු කරන මානව හිමිකම් උල්ලංඝණයන් මාධ්‍ය වාරණයන් හා සිවිල් සමාජයට පනවන තංහඩි අධිකරණයේ ස්වාධීනත්වය යටපත් කිරීම ඇතුළු පොදු රාජ්‍ය මණ්ඩලීය හර පද්ධතීන් ශ්‍රී ලංකාව තුළ බරපතළ ලෙස හා නොකඩවාම උල්ලංඝණය කිරීම පිළිබඳව වහාම ඵලදායි ලෙස හා පාරදෘශ්‍ය ලෙස සාකච්ඡාවට ගැනීම;

- එක්සත් ජාතීන් ගේ මානව හිමිකම් කවුන්සිලයේ 2013 සම්මත කළ 22/1 සහ 2012 පවත්වන ලද කාලීන විමර්ශන සැසිවාරයේ හෙළිදරව් කිරීම් ක්‍රියාත්මක කිරීම ඇතුළු ශ්‍රී ලංකාවේ සංහිඳියාව ඇති කිරීම හා වගවීම සම්බන්ධයෙන් එක්සත් ජාතීන් ගේ සංවිධානය දරන ප්‍රයත්නයට ක්‍රියාකාරි ලෙස සහයෝගය දීම;

- පොදු රාජ්‍ය මණ්ඩලීය නායක සමුළුව ශ්‍රී ලංකාවේ පැවැත්වීමට පෙර යුද්ධ අපරාධ සම්බන්ධයෙන් චූදිතයින් සහ මානව සංහතියට එරෙහිව කරන ලද අපරාධ සම්බන්ධ චූදිතයින් අධිකරණයට ඉදිරිපත් කිරීම ද, භාෂණයේ නිදහස හා සමාගමයේ මෙන්ම රැස්වීමේ නිදහස ට නොකඩවා එල්ල කරන ප්‍රහාර ඇතුළු ශ්‍රී ලංකා ආණ්ඩුව ක්‍රමානුකූලව මානව හිමිකම් උල්ලංඝණය කිරීම වැළැක්වීම පිණිස කටයුතු කරන බවටද සහතිකයක්

නොමැත්තේ නම්, 2013 නොවැම්බර් මස පැවැත්වීමට නියමිත පොදු රාජ්‍ය මණ්ඩල නායකයින් ගේ රැස්වීම හා 2013-2015 දක්වා පොදු රාජ්‍ය මණ්ඩලයේ සභාපති ධුරය දැරීමට තිබෙන අපේක්ෂාව වැළැක්වීමට කටයුතු කිරීම;

- භාෂණයේ නිදහසට සාමකාමී ලෙස රැස්වීමට හා සමාගමයට තිබෙන අයිතියට ගරු කිරීම හා ආරක්ෂා කිරීමත් එය සක්ෂාත් කර ගැනීම පිණිස ශ්‍රී ලංකා ආණ්ඩුව අන්තර් ජාතික නීතිය හා ප්‍රමිතීන් යටතේ කටයුතු කිරීම;

- සිය අයිතිවාසිකමක් වූ භාෂණයේ නිදහස භුක්ති විඳින මාධ්‍යවේදීන්, නීතිඥවරුන්, මානව හිමිකම් ආරක්ෂකයින්, සිවිල් සමාජ ක්‍රියාකාරින් හා අනෙකුත් තැනැත්තන් හට පහර දීම තර්ජනය කිරීම හා රඳවා තබා ගැනීම, අවමන් සහගත ලෙස සැලැකීම, තර්ජනය කිරීමට ලක් වීම සම්බන්ධයෙන් සිය වගකීම රජය විසින් ප්‍රසිද්ධියේ පිළිගැනීම; කොන්දේසි විරහිතව එබඳු තර්ජන, අවමන් සහගත සැලකීම, බිය වැද්දීම කරන ලබන්නන් ගේ දේශපාලන තරාතිරම නොසලකා තවදුරටත් නොඉවසන බව රජය විසින් ප්‍රකාශයට පත් කිරීම;

- මානව හිමිකම් කඩ වීමට ලක් වන සෑම තැනැත්තෙකු ගේම පැමිණිලි පැමිණිලිකරු ගේ මෙන්ම සැකකරුගේ ද තරාතිරම හෝ නිල බලය නොබලා වහාම ස්වාධීනවත් අපක්ෂපාතවත් හා ඵලදායි ලෙසත් විමර්ශනය කරන බවට සහතික වීම; අපරාධයක් සිදු කිරීමට අණ දෙන නිලධාරින් මෙන්ම එබඳු තොරතුරු පිළිබඳ දැනුමක් ඇති එසේත් නැත්නම් එබඳු තොරතුරු ලබන තැනැත්තන් එබඳු අපරාධයක් වැළැක්වීමට ක්‍රියා නොකිරීම සම්බන්ධයෙන් වරදක් කරනු ලබන අතර, එකී තැනැත්තන් මෙන්ම සැකකරුවන් ද අන්තර් ජාතික ප්‍රමිතීන්ට යටත්ව සාධාරණ නඩු විභාගයකට යටත් කළ යුතුය.

- ත්‍රිකුණාමලයේ පංච සිසු ඝාතනය, ප්‍රංශ ආධාර සේවකයින් දහත් දෙනෙකු ඝාතනය කිරීම ඇතුළු 2006 බරපතළ මානව හිමිකම් උල්ලංඝණය කිරීම් 16 ක් පිළිබඳ පරීක්ෂණ කොමිෂන් සභා වාර්තාවද, 2013 පෙබරවාරි මස නිකුත් කළ එක්සත් ජාතීන් ගේ මානව හිමිකම් කොමිෂන් සභාවේ නිර්දේශ ඇතුළත් ' කල් ඉකුත් වී ගිය පැමිණිලි විභාග කිරීම පිණිස අන්තර් ජාතික ආධාර බාර ගැනීම' නම් වූ වාර්තාවද ( A/HRC/22/38) ප්‍රකාශයට පත් කිරීම;

- 2011 දෙසැම්බර් මස නිකුත් කරන ලද වධහිංසා පැමිණවීමට එරෙහි එක්සත් ජාතීන් ගේ කමිටු වාර්තාවේ[217] සඳහන් කළ අන්දමට 'මානව හිමිකම් නියාමකයින් හා වධහිංසා පැමිණවීම මැඩපැවැත්වීම පිණිස ක්‍රියාකරන තැනැත්තන් ඔවුන් කරනු ලබන මෙහෙවර හේතු කොට ගෙන තර්ජනය කිරීම් හා ප්‍රචණ්ඩ ක්‍රියාවන් ගෙන් ආරක්ෂා කිරීම ; මානව හිමකම් ආරක්ෂකයින්, නීතිවේදීන්, මාධ්‍යවේදීන් හා සිවිල් සමාජ ක්‍රියාකාරිකයින් විසින් මුහුණ දී සිටින අභියෝගාත්මක වටපිටාව සැලකිල්ලට ගෙන ඔවුන් ගේ ආරක්ෂාව කඩවීම පිළිබඳ පැමිණිලි විමර්ශනය කිරීම හා නඩු පැවරීම ද' ශ්‍රී ලංකා රජය සහතික කළ යුතුය.

- ශ්‍රී ලංකික පුරවැසියන්ට භාෂණයේ නිදහසට හා ප්‍රකාශනය ඇතුළු අදහස් පළ කිරීමේ නිදහසට ඇති හිමිකමෙහි අංගයක් වන, අන්තර් ජාලය ඇතුළු තමන්ට ලබා ගත හැකි මෙන්ම පාවිච්චි කළ හැකි සංනිවේදන මාධ්‍යයන් මඟින් තොරතුරු ගවේෂණය කිරීමට, ලබා ගැනීමට හා අදහස් උදහස් බෙද හැරීමට තිබෙන අයිතිය තහවුරු කිරීමට පියවර ගැනීම;

- තොරතුරු ලබා ගැනීමට ඇති හිමිකම ඇතුළු භාෂණයේ නිදහස සීමා කරන වාරණයන් මාධ්‍ය ආයතන වසා දැමීම ඇතුළු වෙනත් ක්‍රියාකාරකම් මඟින් ශ්‍රී ලංකාව සිය අන්තර් ජාතික මානව හිමිකම් වගකීම් උල්ලංඝණය කිරීම නිමා කිරීම;

- ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත ඇතුළු භාෂණයේ නිදහස සාමකාමීව රැස්වීමේ නිදහස හා සමාගමයේ නිදහස උල්ලංඝණය කරන අණ පනත් නීතී රීතී හා රෙගුලාසි අහෝසි කිරීම සංශෝධනය කිරීම හා එබඳු අණ පනත් නීතී රීතී හා රෙගුලාසි ක්‍රියාත්මක කිරීම අහෝසි කිරීම;

- සාමකාමීව අන්තර් ජාතික නීතියේ දක්වා ඇති හා ශ්‍රී ලංකික නීතියේ දක්වා ඇති නිත්‍යානුකූල සීමාවන්ට යටත්ව රැස්වීමේ හා සමාගමයේ නිදහසට ඇති හිමිකම සහතික කළ යුතුය. එබඳු රැස්වීම් වලට ආරක්ෂාව සැපයීමේ දී නීතිය බලාත්මක කිරීම පිළිබඳ අන්තර් ජාතික ප්‍රමිතීන්ට අනුකූලව එය කළ යුතු අතර සිය රාජකාරි කටයුතු කිරීමට අත්‍යවශ්‍ය වන අවස්ථාවකදි පමණක් බලය පාවිච්චි කරන බවට සහතික විය යුතුය.

- එක්සත් ජාතීන් ගේ මානව හිමිකම් කවුසිලයේ 2013 පෙබරවාරි මස වාර්තාවේ ( A/HRC/22/28)[218] නිර්දේශ ක්‍රියාත්මක කරමින් ගුණානුස්මරණ හා සංවත්සර පැවැත්වීම වැනි සිවිල් සමාජය හා සුළු ජන ප්‍රජා නියෝජිතයින් සහභාගිත්වයෙන් ප්‍රවර්ධනය කරනු ලැබිය හැකි සංහිඳියාව වැනි සමාජ ඒකාග්‍රතාවය වර්ධනය කරන පියවරයන් ගැනීමට තිබෙන ඉඩකඩ සහතික කළ යුතුය.

- එක්සත් ජාතීන් ගේ විශේෂ නියෝජිතයින් වශයෙන් ශ්‍රී ලංකාවට පැමිණීමට බලාපොරොත්තු වන භාෂණයේ නිදහස පිළිබඳ විශේෂ නියෝජිතවරයා වද, සාමකාමීව රැස්වීමේ හා සමාගමයේ නිදහස පිළිබඳ විශේෂ නියෝජතවරයා වද, විනිශ්චයකාරවරුන් ගේ හා නීතීවේදීන් ස්වාධීනත්වය පිළිබඳ විශේෂ නියෝජිතවරයාටද, මානව හිමිකම් ආරක්ෂකයින් පිළිබඳ විශේෂ නියෝජිතවරයාටද, බලහත්කාර අතුරුදහන් කිරීම් පිළිබඳ ක්‍රියාකාරි කමිටුවටද, අධිකරණ බාහ්‍ය ඝාතන පිළිබඳ විශේෂ නියෝජිවරයාටද, සුළු ජන ගැටළු පිළිබඳ ස්වාධීන විශේෂඥවරයාට හා කාන්තාවන්ට නීතීය හා නීතී භාවිතයේ ඇති වෙනස්කම් පිළිබඳව ක්‍රියාකාරි කමිටුවටද මෙරටට පැමිණීමට අවසර ලබා දීම ඔවුන් සමඟ සහයෝගයෙන් කටයුතු කළ යුතුය.[219]

- යුද්ධ අපරාධ හා මානව සංහතියට එරෙහි අපරාධ ඇතුළු අන්තර් ජාතික නීතිය යටතේ වරදක් කර ඇති සෑම සැකකරුවෙකුටම අන්තර් ජාතික ප්‍රමිතීන්ට යටත්ව සාධාරණ නඩු විභාගයක් පවත්වන බවට සහතික වීම;

**-නිමි-**

# සටහන්:

[1] 1993 දී ඇම්නස්ටි ඉන්ටර්නැෂනල් සංවිධානය පළ කළ වාර්තාවක් මඟින් ඒවන විට 2,000 කට ආසන්න පිරිසක් එල්. ටී. ටී. ඊ. ය විසින් අත්අඩංගුවේ තබා ගෙන සිටින බටව වාර්තා කරන ලද අතර, "බොහෝ රැඳවියන් ගේ ඉරණම පිළිබඳව ඔවුන් ගේ ඥාතීන්ට දැනුම් නොදුන් බවත් ඉන් ඇතැමෙක් කෲර වධ බන්ධන වලට හා ඝාතනයට ලක් කෙරුන බවත්, එසේම එල්. ටී. ටී. ඊ. ය කප්පම් ගැනීම පිණිස තැනැත්තන් පැහැර ගත් බවට ද පැමිණිලි තිබින. බලන්න-

*Sri Lanka: "An assessment of the human rights situation"* (Index: ASA 37/001/1993). *Sri Lanka: "A Climate of Fear in the East"* (Index: ASA 37/001/2006); Sharika Thiranagama, "In Praise of Traitors: Intimacy, Betrayal and the Sri Lankan Tamil Community," *Traitors; Suspicion, Intimacy, and the Ethics of State-Building*. Sharika Thiranagama and Tobias Kelly ed., University of Pennsylvania Press, 6 පරිච්ඡේදය , 128 පිටුව: රාජද්‍රෝහී වීම යන්නෙහි අර්ථය නොකඩවාම පුළුල් වීය. ඊට ප්‍රසිද්ධියේම එල්. ටී. ටී. ඊ. යට විරුද්ධ වීම, ශ්‍රී ලංකා යුද්ධ හමුදව සමඟ සම්බන්ධතා පැවැත්වීම, එල් ටී ටී ඊ විසින් අය කළ බදු නොගෙවීම වැනි කරුණු ඇතුලත් විය. එක් වරක් රාජද්‍රෝහීන් වශයෙන් වර්ග කළ තැනැත්තෙක් බොහෝ විට අඛණ්ඩවම රාජද්‍රෝහීන් වශයෙන් හදුන්වනු ලැබින. එල් ටී ටී ඊ විසින් දහස් ගණනක් අත් අඩංගුවට ගෙන දඩ නියම කළ අතර, බොහෝ දෙනෙක් ඝාතනය කරනු ලැබින. එල්. ටී. ටී. ඊ. ය විසින් පාලනය කළ උතුරු හා නැගෙනහිර පළාත් වළ සිදු කරන ලද අධිකරණ බාහ්‍ය ඝාතන වල මූලික අරමුණ වුයේ 'රාජද්‍රෝහීන' සමුල ඝාතනය කිරිමයි. එල්. ටී. ටී. ඊ. ය දෙකඩ විමෙන් පසු මෙම තත්වය වඩාත් උග්‍ර විය. දෙපාර්ශවය විසින් ම අනෙක් පාර්ශවය රාජද්‍රෝහීන් වශයෙන් හැඳින්වු අතර, එහි ප්‍රතිඵලය වුයේ ද්‍රවිඩ ජනතාව තව තවත් ප්‍රචණ්ඩත්වයට හා සෝදිසි කිරිමට ලත් විමයි"

[2] ශ්‍රී ලංකාවේ 1979 ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත භාෂණයේ නිදහස පිළිබඳ ව දැඩි සීමාවන් අඩංගු වු පනතකි. ඒ අනුව ආගමික, වාර්ගික හෝ ජාතිවාදී භෙද ඇති කිරිමට තුඩු දෙන හෝ විවිධ ජාතීන් අපහසුතාවයට පත් වන, එසේත් නැත්නම් විවිධ ජනවර්ග හෝ ආගමික කණ්ඩායම් අතර ගැටුම් ඇති කිරිමට හේතු වන වාචික හෝ ලිඛිත ප්‍රකාශන කිරිම තහනම් වෙයි. (1 වන කොටස 2(1) එච්) මීට අමතරව ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ වරදක් වන කාරණයක් සම්බන්ධයෙන් කරනු ලබන විමර්ශන හෝ විමර්ශනය කිරිමට නියමිත කාරණයක් සම්බන්ධයෙන් යම් තොරතුරක් මුද්‍රණය කිරිම හෝ ප්‍රකාශයට පත් කිරිම තහනම් වේ. (5 වන කොටස) බලන්න:Amnesty International, "*The Prevention of Terrorism Act,"* in *Locked Away, Sri Lanka's Security Detainees* (Index: ASA 37/003/2012), pp13-14 See also, Amnesty International, *Briefing to the UN Committee Against Torture* (Index: ASA 37/016/2011), 5 පිටුව

[33] "ශ්‍රී ලංකාවෙන් පිටු වහල් කරන ලද මාධ්‍ය වේදීන් ජිනීවා හි මානව හිමිකම් කවුන්සිලය ඉදිරියේ පෙනී සිටිම සිය රටට ද්‍රෝහි විමක් වන අතර මෙරට අපහසුතාවයට පත් කිරිමක් ද වෙයි." අමාත්‍ය කෙහෙළිය රඹුක්වැල්ල 2012 ජනවාරි 26 දින ආණ්ඩුව සතු පුවත් පතක් වන දිනමිණ පුවත් පත: " කව්දෝ කියලා තියෙනවා යම්කිසි වෙක් අන් අයගේ මුදලට වහල් වෙලා සිය ජන්ම භූමිය පවා දෙන්නේ නම් ඔහුට ජීවත් වන්නට ඉඩ දෙනවාට වඩා ඝාතනය කිරිම වඩාත් සුදුසුයි. ඔවුන් මේ රටේ ජිවත් වනවා නම් අපට අපේ ඇස් දෙකින්ම බලා ගන්නට පුළුවන් ඔවුන්ට හිමි අවාසනාවන්ත ඉරණම කුමක් ද කියා" විමසුම: ප්‍රධාන ප්‍රවෘත්ති ප්‍රකාශයට පසු ප්‍රචාරය වන කාලීන තොරතුරු විමර්ශන වැඩ සටහනකි. අයි. ටී. එන්. රූපවාහිනී නාලිකාව 2012 මාර්තු 12

[4] Govt opposes internationalization of national issues," *Daily News*, 6 June 2012, http://www.dailynews.lk/2012/06/06/news03.asp, වෙබ් අඩවි පිවිසුව 21 මාර්තු 2013

[5] UN Human Rights Council Resolution 19/2, "Promoting reconciliation and accountability in Sri Lanka," adopted 23 March 2012, A/HRC/RES/19/2. http://www.ohchr.org/Documents/HRBodies/HRCouncil/RegularSession/Session19/A-HRC-19-2en.pdf,pp.7-7, වෙබ් අඩවි පිරික්සුම 21 මාර්තු 2013.

[6] 2012 මාර්තු 23 දින එක්සත් ජාතින් ගේ මානව හිමිකම් කොමසාරිස්වරිය 19/2 යෝජනාව සම්මත විමෙන් පසු ශ්‍රී ලංකික සිවිල් සමාජ නියෝජිත පිරිසට නින්ද අපහාස කිරිම තරයේ හෙළා දකින ලද අතර එය අසම්මත හා පිළි ගත නොහැකි ක්‍රියාවක් බව කියා සිටියාය. *Briefing note on Sri Lanka / human rights defenders*, 23 March 2012, http://www.ohchr.org/EN/NewsEvents/Pages/DisplayNews.aspx?NewsID=12008&LangID=E, . වෙබ් අඩවි පිරික්සුම 21 මාර්තු 2013.

[7] UN Human Rights Council Resolution 22/1 on "*Promoting reconciliation and accountability in Sri Lanka,"* introduced as draft resolution A/HRC/22/L.1/Rev.1 and adopted 21 March 2013.

[8] "Disinformation campaign against a Senior Researcher of CPA," 21 January 2013, http://f.cl.ly/items/413i450F3f3B470v2M1S/Statement%20on%20FB%20campaign%20on%20BF.pdf, accessed 21 March 2013

[9] බලන්න: Committee to Protect Journalists, "Attacks on the Press in 2012, Sri Lanka," February 2013, http://www.cpj.org/2013/02/attacks-on-the-press-in-2012-sri-lanka.php, accessed 21 March 2013; see also: Journalists for Democracy in Sri Lanka (JDS), "Media workers killed in Sri Lanka (2004 - 2010)," http://www.jdslanka.org/index.php/killed-media-workers, accessed 21 March 2013

[10] 2011 නොවැම්බර් මස ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ සභාපති අනුෂ පැල්පිට මහතා ඇසෝසියේටි ප්‍රේස් නැමති පුවත් පත් එජන්සියට ප්‍රකාශයක් කරමින් සිය කොමිෂන් සභාව විසින් ලංකාඊනිව්ස්,කොම්, ශ්‍රී ලංකාමිරර්. කොම්, ශ්‍රී ලංකාගාර්ඩියන්.කොම්, පැපරාසිගොසිෆ්9.කොම් හා ලංකාවේනිව්ස්.කොම් යන වෙබ් අඩවි අවහිර කොට තිබෙන බව කියා සිටියේය. (http://news.yahoo.com/sri-lanka-blocks-5-news-websites-over-insults-094158881.html, accessed 21 March 2013

[11] 2012 ජනමාධ්‍ය හා ප්‍රවෘත්ති අමාත්‍යාංශයේ ලේකම් ඩබ්.බී. ගනේගල මහතා කළ ප්‍රකාශයකට අනුව ජනවාරි මස ශ්‍රී ලංකා ආණ්ඩුව වෙබ් අඩවි ලියාපදිංචි කිරීම ආරම්භ කරන ලදි. පළමු වටයේ දී අයදුම් පත් 81 ලැබුන අතර අවසර දෙන ලද්දේ ඉන් අයදුම් පත් 21කට පමණි. 2012 ජුලි මාසයේ දී අමාත්‍ය මණ්ඩලය 1973 අංක 05 දරන ශ්‍රී ලංකා පුවත් පත් මණ්ඩල පනත සංශෝධනය කරමින්, වෙබ් අඩවියක් ලියා පදිංචි කිරීමේ ගාස්තුව රුපියල් 100,000 දක්වාද, අළුත් කිරීමේ ගාස්තුව රුපියල් 50,000 දක්වා ද වැඩි කළේය. මෙම නව ගාස්තු ශ්‍රීලංකිකයන් බහුතරයකට ඉතා විශාල මුදලක් වන අතර අමාත්‍යාංශයේ ලේකම් ඩබ්.බී.ගනේගල මහතා කියා සිටියේ ආරම්භයේදී වෙබ් අඩවි ලියා පදිංචිය නොමිලේ කිරීමට බලාපොරොත්තු වූ නමුත් නව ගාස්තු ක්‍රමයක් හඳුන්වා දෙන ලද්දේ ආණ්ඩුවට මඩ ගසන 'මඩ වෙබ්' අඩවි පවත්වා ගෙන යාම අධෛර්‍ය කිරීම පිණිසය. 2012 අගෝස්තු මාසයේ දී මෙම අයක්‍රමය සංශෝධනය කළ අතර වර්තමාන ගාස්තුව වන්නේ ලියා පදිංචි ගාස්තුව රුපියල් 25,000 ක්ද අළුත් කිරීමේ ගාස්තුව රුපියල් 10,000 ක්ය. ශ්‍රී ලංකාවේ පුවත්පත් හා සඟරා ලියා පදිංචිය සඳහා ගාස්තුවක් අය නොකෙරේ.

[12] Swaminathan Natarajan, "*Media Freedom in Post War Sri Lanka and its Impact on the Reconciliation Process*," University of Oxford, 2012

[13] යම් කිසි තැනැත්තෙක් ආරක්ෂක හමුද විසින් රාජ්‍ය අනුග්‍රහය හා නිල අවසරය ඇතිව අත්ඩංගුවට ගැනීම මෙන්ම රඳවා තිබෙන ස්ථානය හෙළිදරව් නොකිරීම හා නීතියේ පිළිසරණ ලබා ගැනීමට ඉඩ නොතැබීම අන්තර් ජාතිත නීතිය උල්ලංඝණය කිරීමක් වෙයි.

[14] ශිටපු යුද්ධ හමුදපති හා අණදෙන නිලධාරි ජනරල් සරත් ෆොන්සේකා 2009 දෙසැම්බර් මස කළ ප්‍රකාශයකට අනුව තමා මාධ්‍යවේදියෙකු ගෙන් දැනගත් පරිදි ආරක්ෂ ආමාත්‍යාංශයේ ලේකම් ගෝඨාභය රාජපක්ෂ මහතා 58 වන සේනාංකයෙහි අණ දෙන නිලධාරියාට බාර වන හා යටත් වන සියළුම එල්. ටි, ටි. ඊ. සාමාජිකයින්ට වෙඩි තබන්නනට නියෝග කර තිබුනි. Frederica Jansz, "Gota Ordered Them To Be Shot – General Sarath Fonseka," *The Sunday Leader*, 13 December 2009, http://www.thesundayleader.lk/2009/12/13/%E2%80%9Cgota-ordered-them-to-be-shot%E2%80%9D-%E2%80%93-general-sarath-fonseka වෙබ් පිරික්සුම 2013 මාර්තු 23: එක්සත් ජාතීන් ගේ සංවිධානයේ මහ ලේකම් බෑන් කිං මූන් විසින් පත් කළ විද්වත් කමිටුව 2011 මාර්තු මස නිකුත් කළ සිය වාර්තාවෙහි විද්වත් කමිටුව ඉදිරියෙහි ශ්‍රී ලංකා යුද්ධ හමුදවේ අණ දෙන නිලධාරින් හා ජ්‍යෙෂ්ඨ රාජ්‍ය නිලධාරින් මෙන්ම එල්. ටි. ටි. ඊ. සංවිධානයේ මිල්ටරි හා සිවිල් නායකයින් ද අන්තර් ජාතික නීතිය යටතේ වරදක් වන යුද්ධ අපාරධ සිදු කළ බවට පිළි ගත හැකි සාක්ෂි ඉදිරිපත් වු බවට නිගමනය කළේය..http://www.un.org/News/dh/infocus/Sri_Lanka/POE_Report_Full.pdf, වෙබ් අඩවි පිවිසුම මාර්තු 23 2013.

[15] යුද්ධ හමුදව, උතුරු හා නැගෙනහිර පළාත් වල සිවිල් ආරක්ෂ කටයුතු මෙන්ම සිවිල් පරිපාලන කටයුතු ද සිවිල් වැසියන් විසින් කරනු ලබන ඇතැම් ව්‍යාපාර ද කරනු ලබයි. උදහරණයක් වශයෙන් යුද්ධ හමුදව අධ්‍යාපන කටයුතු මෙන්ම ආපන ශාලා හා හෝටල් පවත්වා ගෙන යනු ලබයි. මේ කටයුතු කිරීමේ දි යුද්ධ හමුදව බොහෝ විට ප්‍රයෝජනයට ගනු ලබන්නේ පුද්ගලික ඉඩම්යි.

[16] 2010 ජුනි 22 දින එක්සත් ජාතීන් ගේ මහ ලේකම් බෑන් කිං මූන් විසින් ශ්‍රී ලංකාවේ යුද්ධය පැවති අවසාන අදියරයේ දී සිදු වු බවට චෝදනා කරනු ලබන යුද්ධ අපරාධ සම්බන්ධයෙන් එරට වගවීම පිළිබඳව මහ ලේකම්වරයාට උපදේස් දෙනු පිණිස පත් ත්‍රී පුද්ගල විද්වත් කමිටුව සිය වාර්තාව 2011 දි ප්‍රකාශයට පත් කළේය.

මෙම වාර්තාව : http://www.un.org/en/rights/srilanka.shtml යන වෙබ් අඩවියෙහි ලබා ගත හැකිය.

[17] See for example, Networking for Rights in Sri Lanka (NfR), INFORM Human Rights Documentation Centre, Sri Lanka, Free Media Movement, Sri Lanka (FMM), "Human Rights Defenders, Freedom of Assembly, Freedom of Association and Dissent in Sri Lanka, NGO Submission, Universal Periodic Review - second cycle on Sri Lanka (14th UPR Working Group – Oct / Nov. 2012), April 23, 2012, https://nfrsrilanka.files.wordpress.com/2012/06/nfr-sri-lanka-joint-upr-submission-sri-lanka-nov-2012-defenders-freedom-of-assembly-freedom-of-association-and-dissent.pdf, වෙබ් පිවිසුම 2 April 2013.

[18] For a recent discussion of the policy implications of Sri Lanka's repression of dissent, see International Crisis Group, "Sri Lanka's Authoritarian Turn: The Need for International Action," *Asia Report No. 243*, 20 February 2013.

[19] පර්ත් ප්‍රකාශණය: "*2011 Commonwealth Heads of Government Meeting*," October 2011, http://www.thecommonwealth.org/document/181889/34293/35232/249249/perth_communique.htm, accessed 19 March 2013. See also "*Charter of the Commonwealth*," 2012

[20] Human Rights Committee, General Comment No. 34, 12 September 2011, UN Doc. CCPR/C/GC/34, para13

[21] See, for example, Human Rights Committee, General Comment No. 34, paras21-36.

[22] Human Rights Committee, General Comment No. 29, 31 August 2001, CCPR/C/21/Rev.1/Add.11, paras 2-5.

[23] Human Rights Committee, Fourth Periodic Report, Sri Lanka, 18 October 2002, CCPR/C/LKA/2002/4.

[24] Human Rights Committee, Concluding observations, Sri Lanka, 1 December 2003, CCPR/CO/79/LKA.

[25] Human Rights Committee, Fifth Periodic Report, Sri Lanka, 29 October 2012, CCPR/C/LKA/5.

[26] Ibid, para 323

[27] ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවේ 15 වන වගන්තිය

[28] The Citizens' Movement for Good Governance (CIMOGG), "*RIGHT TO INFORMATION LAW*," http://cimogg-

srilanka.org/2007/01/right-to-information-law/, accessed 21 March 2013.

[29] ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවේ 15 වන වගන්තිය

[30] ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවේ 15 වන වගන්තිය

[31] ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත පිළිබඳව සවිස්තරාත්මක විග්‍රහයක් සඳහා බලන්නः Amnesty International, "*The Prevention of Terrorism Act," in Locked Away: Sri Lanka's Security Detainees* (Index: ASA 37/003/2012), pp13-14, available at: https://www.amnesty.org/en/library/info/ASA37/003/2012/en; See also, Amnesty International, *Briefing to the UN Committee against Torture* (Index: ASA 37/016/2011), p5, available at: http://www.amnesty.org/en/library/info/ASA37/016/2011/si

[32] Human Rights Committee, General Comment No. 34, paras18-19.

[33] Information Ministry Sec's comment draws fire from media associations," *Sunday Times*, 5 August 2012, http://www.sundaytimes.lk/120805/news/information-ministry-secs-comment-draws-fire-from-media-associations-8001.html, accessed 21 March 2013.

[34] Subject: LTTE Strikes Again In The North, Situation Tense And Confused In The East," *Origin Embassy Colombo (Sri Lanka),* Cable time Wed, 7 Dec 2005 11:28 UTC, Classification CONFIDENTIAL http://wikileaks.org/cable/2005/12/05COLOMBO2058.html, accessed 21 March 2013.

[35] ශ්‍රී ලංකාණ්ඩුවේ විදේශ අමාත්‍යවරයා වු ද්‍රවිඩ ජාතික ලක්ෂ්මන් කදිරගාමර් 2005 අගෝස්තු මස ඝාතනය කරන ලදි. කේතිස් ලෝගනාදන් ද්‍රවිඩ දේශපාලන ක්‍රියාකාරිකයෙක් මෙන්ම මාවන හිමිකම් ආරක්ෂයෙක් වූද රජයේ සාම ලේකම් කාර්යාශයේ නියෝජිතයක් වු අතර කදිරගාමර් ඝාතනයෙන් හරියට වසරක් පිරෙන ද එනම් 2006 අගෝස්තු 06 දින ඝාතනය කළේය. එල් ටි ටි ඊ ට හිතවත් වෙබ් අඩවියක මෙම ඝාතනය හඳුන්වා දි තිබුනේ දේශ ද්‍රෝහියෙක් වු පුංචි කදිරගාමර් ගේ මරණය ලෙසටය. Minister condemns Nitharsanam's 'popular Tamil traitor' report," *Daily News*, 18 August 2006, http://www.dailynews.lk/2006/08/15/news15.asp, accessed 21 March 2013).

[36] මෙම සිද්ධියෙන් දිවි ගලවා ගත් දෙනෙකු සිය රටින් පළා ගොස් විදේශගතව ජිවත් වෙයි. ඉන් එක් අයෙක් කෝකිල රාජා පරරාජසිංහම් වන අතර ඔහු 2008 පත් කරන ලද බරපතළ මානව හිමිකම් උල්ලංඝණයන් විමර්ශනය කිරිම පිණිස පත් කරන ලද විශේෂ ජනාධිපති කොමිෂන් සභාවට ලිඛිත ප්‍රකාශයක් ඉදිරිපත් කරමින් මෙසේ කියා සිටියේය. " සිද්ධියෙන් පැය දෙකකට පමණ පසු මට රෝහලේ දි සිහිය ලැබුනා. මා සිටි වාට්ටුවේ යෝගනාදන් පුනගුලලාලන් ද ප්‍රතිකාර ලබමින් සිටියා. වෛද්‍යවරු මගේ රැධිරය ලිටර් 4.5 පමණ ගලා ගොස් තිබු බව සඳහන් කළා. මම හිතා ගෙන සිටියේ මට තුවාල වුනේ අත් බෝම්බයෙන් කියලයි. පස්සේ තමයි මම දැන ගත්තේ මටත් වෙඩි තබා තිබුනා කියලා. බෝම්බය පිපිරි ගියාට පස්සේ එස් ටි එෆ් එකෙන් වෙඩි තිබ්බා කියලා වෛද්‍යවරු අපට කිව්වා. ජිවතුන් අතර සිටින මගේ අනෙක් මිත්‍රයා මට කිව්වා අත් බෝම්බය පිපිරි ගියාට පස්සේ නිල ඇඳුමින් සිටි එස් ටි එෆ් භටයින් අපිව වාහනයක පිටු පසට ඇද ගෙන ගොස් දමා තලා පෙලා දැම්මා කියලා. ඊට පස්සේ ආයෙත් බිමට ඇද දමලා අපිට කිප විටක් වෙඩි තබා තිබුනා. ඒ වේලාවේ තමයි මගේ යාළුවෝ පස් දෙනා මිය ගියේ." මෙම ප්‍රතාශයේ උපුටා ගත් කොටස් 2008 මාර්තු 17 වන හා 22 වන දින වල ඩේලි මිරර් පුවත් පතෙහි පළ කරන ලදී. මෙම පුවත්පත් ප්‍රකාශයේ පිටපතක් ඇම්නස්ටි කාර්යාලයේ තිබෙන අතර ඩේලි මිරර් පුවත්පතෙහි මෙම ලිපි වෙබ් ලේඛනාරක්ෂාගාරයෙන් ඉවත් කොට ඇත.

[37] " විකි ලික්ස් වෙබ් අඩවියෙහි පළ වු එක්සත් ජනපද තානාපති කාර්යාලයේ රහස්‍ය වාර්තාවකට අනුව මෙම සිද්ධියේ දි පණ බේරා ගත් එක් ශිෂ්‍යයෙකු මානව හිමිකම් කොමිෂන් සභාවට ප්‍රකාශයක් කරමින් අත් බෝම්බ ප්‍රහාරයෙන් පසු නිල ඇඳුම් ඇඳ ගත් කිහිප දෙනෙක් ජීප් රියකින් පැමිණ ශිෂ්‍යයන්ට පහර දි ඇත. ශිෂ්‍යයන් පස් දෙනෙකුට මුනින් අතට බිම දිගා වන ලෙස නියෝග කළ ඔවුන් එම ශිෂ්‍යයන් ගේ හිසට දිගින් දිගටම වෙඩි තබා ඇත. අත් බෝම්බ ප්‍රහාරයෙන් බරපතළ ලෙස තුවාල ලබා සිටි අනෙක් සිසුන් එසේ මිය යන්නට ඉඩ හරින ලදි. Sri Lanka: Escalating Violence Shifts To Trincomalee, Origin Embassy Colombo (Sri Lanka), Cable time Mon, 9 Jan 2006 11:39 UTC, Classification: CONFIDENTIAL, http://wikileaks.org/cable/2006/01/06COLOMBO55.html, accessed 23 March 2013.

[38] Committee to Protect Journalists, "Attacks on the Press in 2006 - Sri Lanka," February 2007, http://www.unhcr.org/refworld/docid/47c567442.html, accessed 23 March 2013.

[39] ත්‍රිකුණාමල මහේස්ත්‍රාත් අධිකරණය නඩු අංක බිආර් 11/2006

[40] 2006 ඔක්තෝබර් මස එක්සත් ජනපද තානාපති රොබට් බ්ලේක් හමු වු ජනාධිපති උපදේශක බැසිල් රාජපක්ෂ මහතා ත්‍රිමල ශිෂ්‍ය ඝාතනය සම්බන්ධයෙන් වගකිම එස් ටි එෆ් සතු බව ප්‍රකාශ කරන ලදි. " බලාපොරොත්තු නොවු විවෘත භාවයකින් කථා කළ බැසිල් රාජපක්ෂ මහතා ජනවාරි මස සිදු වු ඝාතනය එස් ටි එෆ් භටයින් විසින් කළ බව රජය දන්වා බවත් එය ඔප්පු කිරිමට රජය සුදනම් බව කියා සිටි අතර, දැනට සාක්ෂි සම්බන්ධයෙන් ඇති වි තිබෙන පරස්පරය විසඳිමට අපරාධ විද්‍යාව පිළිබඳ විශේෂඥ සහාය ලබා ගත යුතුව ඇතැයි ඔහු ප්‍රකාශ කොට ඇත. අපරාධය සිදු කරන ලද්දේ කවරෙක් විසින් ද යන්න අප දන්නා නමුත් අධිකරණය ඉදිරියට ගොස් එය ඔප්පු කිරිමට නොහැකි බව බැසිල් රාජපක්ෂ මහතා වැඩිදුරටත් ප්‍රකාශ කොට තිබුනි.

[41] University Teachers for Human Rights (Jaffna), Special Report No. 24, "The Five Students Case in Trincomalee," 19 April 2007, (Advance Copy to the Commission of Inquiry : 26th February 2007), http://www.uthr.org/SpecialReports/spreport24.htm, accessed 22 March 2013.

[42] ඇම්නස්ටි ඉන්ටර්නැෂනල් සංවිධානයः "විසි වසරක මායාව ශ්‍රී ලංකාවේ පරික්ෂණ කොමිෂන් සභා" ः ( index: ASA 37/005/2009)

[43] වෛද්‍ය මනෝහරන් සමග පවත්වන ලද සම්මුඛ සාකච්ඡා 2006-2013 වැඩි විස්තර පිණිස විසි වසරක මායාව ශ්‍රී ලංකාවේ පරික්ෂණ කොමිෂන් සභා ( Index: 37/005/2009)

[44] Report of the Office of the United Nations High Commissioner for Human Rights on advice and technical assistance for the Government of Sri Lanka on promoting reconciliation and accountability in Sri Lanka, A/HRC/22/38

[45] මෙම ඝාතනය පිළිබඳ විස්තරාත්මක විග්‍රහයක් සඳහා බලන්න: ඇම්නස්ටි ඉන්ටර්නැෂනල් සංවිධානය- " විසි වසරක මායාව" ශ්‍රී ලංකාවේ පරික්ෂණ කොමිෂන් (Index: ASA 37/005/2009)

[46] මෙම ඝාතනයේ වගකීම පිළිබඳව ශ්‍රී ලංකා යුද්ධ හමුදාව හා එල්. ටී. ටී. ඊ. ය අතර එකිනෙකාට ඇඟිලි දික් කර ගන්නා ලද නමුත් ලබා ගත හැකි සාක්ෂි අනුව මෙම ඝාතනය ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ කොමාන්ඩෝ භටයින් ගේ කාර්යක් බව සනාථ කෙරිණ. වැඩිදුර විස්තර පිණිස විසි වසරක මායාව ශ්‍රී ලංකාවේ පරික්ෂණ කොමිෂන් සභාව නම් ප්‍රකාශනය බලන්න.

[47] මෙම ජනාධිපති පරික්ෂණ කොමිෂන් සභාව පිළිබඳ විවේචනයක් පිණිස බලන්න: ඇම්නස්ටි ඉන්ටර්නැෂනල් සංවිධානය- විසි වසරක මායාව: ශ්‍රී ලංකාවේ පරික්ෂණ කොමිෂන් සභා (Index: ASA 37/005/2009)

[48] “Family of Sri Lanka massacre victims doubt justice,” 24 March 2008, http://in.reuters.com/article/2008/03/24/idINIndia-32655020080324, accessed 21 March 2013

[49] බලන්න: "වින්දිතයින් හා සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම" විසිවසරක මායාව: ජනාධිපති පරික්ෂණ කොමිෂන් සභා ( Index ASA 37/005/2009) 35-42 පිටු

[50] ඉහත ප්‍රකාශනය බලන්න.

[51] IFEX, “Defence Ministry imposes unofficial censorship on media,”,29 September 2006, http://www.ifex.org/sri_lanka/2006/09/29/defence_ministry_imposes_unofficial, accessed 22 March 2013.

[52] “Jail for rumour mongers,” *Daily News*, 28 June 2006, http://www.dailynews.lk/2006/06/29/sec01.asp, accessed 21 March 2013. See also, “False SMS messengers arrested in Sri Lanka,” *Colombo Page*, 28 January 2010, http://www.colombopage.com/archive_10/Jan1264697154CH.html, accessed 21 March 2013.

[53] Editorial: Providing security to Tamils now will define northeastern politics of the future,” *Northeastern Monthly*, July 2006.

[54] Conflict: Situation after Geneva, by: JST,” *Northeastern Monthly*, 8 November 2006. Note: In January 2007, එවකට එම ප්‍රදේශයේ ප්‍රධාන අණ දෙන නිලධාරියා වුයේ ලුතිනන් ජනරාල් සරත් ෆොන්සේකා ප්‍රකාශයක් කරමින් තමා ගේ අරමුණ එල් ටී ටී ඊ ය නැගෙනහිර පළාතින් පළවා හැර ඉන් අනතුරුව උතුරු පළාත ආක්‍රමණය කිරීම බව කියා සිටියේය. රජය ආරම්භයේ දී මෙම ප්‍රකාශය අනුමත නොකළ නමුත් පසුව එය ඉතා සාදරයෙන් වැළඳ ගත්තේය.

[55] වීකි ලික්ස් හි පළ වු ඇමෙරිකානු තානාපති කාර්යාලයේ රහස්‍ය කේබල් පණිවුඩයකට අනුව 2007 ජනවාරි මාසයේ දී තානාපති රොබට් බ්ලේක්, ආරක්ෂක ලේකම් ගෝඨාභය රාජපක්ෂ සමග පැවති සාකච්ඡාවක දී වාකරේ හි වර්ධනය වන මානවීය අර්බුදය පිළිබඳව කරුණු ඉස්මතු කළ බවත් එම ප්‍රදේශයට එක්සත් ජාතීන් මානවීය ආධාර කණ්ඩායම් වලට හා රතු කුරුස සංවිධානයට ඇතුළ් වීමට අවසර දෙන මෙන් ද ඉල්ලා තිබුනි. එම කේබල් පණිවුඩයට අනුව සිවිල් වැසියන් විසින් මුහුණ දී සිටි උග්‍ර ආහාර අර්බුදය ඉතා ඉක්මනින් මානවීය අර්බුදයකට වර්ධනය විය හැකි බවද රොබට් බ්ලේක් විසින් තවදුරටත් පෙන්වා දී තිබුනි. http://wikileaks.org/cable/2007/01/07COLOMBO57.html

[56] [56] 2007 අප්‍රියෙල් මස නිකුත් කළ වාර්තාවකින් ඇම්නස්ටි ඉන්ටර්නැෂනල් සංවිධානය මේසේ ප්‍රකාශ කොට තිබුනි." එදිරිවාදිකම් වේගයෙන් වර්ධනය වත්ම එම ප්‍රදේශ වලට ළඟා විම සීමා කරන ලදි. උදාහරණයක් වශයෙන් 2006 නොවැම්බර් මස අවසාන භාගයේ සිට වාකරේ නගරය එල් ටී ටී ඊ ය විසින් අත්පත් කර ගෙන තිබු අතර, මඩකලපුවෙන් උතුරු ප්‍රදේශය ශ්‍රී ලංකා යුද්ධ හමුදාව භාරයට පත් වුයේ 2007 ජනවාරි 19 දිනය. මේ අතරතුර කාලයේ දී එක්සත් ජාතීන් ගේ සංවිධාන නියෝජිතයින්ට හා අන්තර් ජාතික රතු කුරුස සංවිධානයට ඉහත කී ප්‍රදේශ වලට ළ,ගා විමට තිබුනේ ඉතාමත් සීමිත ඉඩකඩකි. ද්‍රවිඩ පුනරුත්ථාපන සංවිධානය එල් ටී ටී ඊ සංවිධානය විසින් පාලනය කළ ප්‍රදේශ වල සහන සේවා කටයුතු වල නියැළි සිටි අතර එම සංවිධානයට එහි ළඟා විමට රජයේ හමුද විසින් අවසර නොදෙන ලදි. ආධාර සංවිධාන වාර්තා කළ ආකාරයට 2007 මාර්තු මාසයේ දී නැවත වරක් රජයේ හමුද ප්‍රතිප්‍රහාර දීමට පෙරාතුව රජය මෙන්ම එල් ටී ටී ඊ සංවිධානයද කිසිම ආධාර සංවිධානයකට සිවිල් වැසියන් කරා ළඟා විමට ඉඩ නොදිම නිසා සිවිල් වැසියන් ඉතා බරපතළ මානවීය අර්බුදයකට ගොදුරු බව ප්‍රකාශ කළේය.", *Sri Lanka: "urgent need for effective protection of civilians as conflict Intensifies"* (Index: ASA 37/009/2007).

[57] ඔහු අධිකරණයේ දී තමා කෲර වධහිංසා වලට ලක් කරන බවට තර්ජනය කළ බවත් තමා සමග අත් අඩංගුවට ගත් තවත් තැනැත්තෙකුට තමා ඉදිරිපිට දීම වධහිංසා පැමිණ වු බවත් ( එම තැනැත්තා ට වධහිංසා පැමිණ වු බව අධිකරණ වෛද්‍ය නිලධාරිවරයා ද සනාථ කොට තිබුනි) මේ තත්වය යටතේ තමා පොලිසිය විසින් ලියන ලද ප්‍රකාශයට අත්සන් කිරිමට පෙළඹුන බවත් කියා සිටියේය.

[58] Art 15 CAT, to which Sri Lanka acceded in 1994; Article 12 of the 1975 UN Declaration on the Protection of All Persons from Being Subjected to Torture and Other Cruel, Inhuman or Degrading Treatment or Punishment; Human Rights Committee General Comment No. 20, para. 12; General Comment No. 32, 23 August 2007, UN Doc. CCPR/C/GC/32, paras6, 41 and 60; see also Principles 21 and 27 of the 1988 UN Body of Principles for the Protection of All Persons under Any Form of Detention or Imprisonment.

[59] Human Rights Committee, General Comment No. 32, para41

[60] Report of the Secretary General's Panel of Expert of Sri Lanka, 31 March 2011, p113, para 416.

[61] Lasantha's Killers Roam Free*," The Sunday Leader*, 6 January 2013

[62] කන්දේගෙදර පියවංශ හා පි ජේසුදසන් යන දෙදෙනා සැක පිට අත් අඩංගුවට ගනු ලැබූ අතර ජේසුදසන් පොලිස් අත් අඩංගුවේ දී මිය ගියේය. හිටපු යුද්ධ හමුද බුද්ධි අංශ නිලධාරියෙකු වූ කේ පියවංශ ඝාතනය පිළිබඳව විඩියෝ කැමරාවක් ඉදිරියේ කළ ප්‍රකාශයකින් අනතුරුව ඇප පිට මුද හරින ලදී. වික්‍රමතුංග ගේ නීතිඥයින්ට මෙම ප්‍රකාශයේ පිටපතක් ලබා දීම පොලිසිය විසින් ප්‍රතික්ෂේප කරන ලදී.

[63] Reporters Without Borders, "Outrage at Fatal Shooting of Newspaper Editor in Colombo,", 8 January 2009, updated 29 January 2009, http://en.rsf.org/sri-lanka-outrage-at-fatal-shooting-of-08-01-2009,29916.html, accessed 21 March 2013.

[64] "Editorial: And Then They Came For Me," *The Sunday Leader*, 11 January 2009, http://www.thesundayleader.lk/20090111/editorial-.htm, accessed 21 March 2013.

[65] කීත් නෝයර් ද නේෂන් පුවත් පතෙහි සාහය සංස්කාරක හා ආරක්ෂක තීරු ලිපි ලේඛකයෙක් වූ අතර ඔහු 2008 මැයි මස 22 වන දින තමා ගේ නිවස අසල දී ආයුධ සන්නද්ධ කල්ලියක් විසින් පැහැර ගෙන යන ලදී. පසු දින උදෑසන ඔහු මුදා හැර තිබූ අතර සිදු වී තිබූ බරපතළ තුවාල හේතු කොට ගෙන ඔහු රෝහල් ගත කෙරිණ. පසුව නොයර් රටින් පිට ව ගිය අතර මේ වන තෙක් ඔහුට පහර දුන් තැනැත්තන් පිළිබඳ කිසිදු විමර්ශනයක් නොකළේය.

[66] D.B.S. Jeyaraj, "Poddala Jayantha: Latest Journalist victim in Sri Lanka," 5 June 2009, http://dbsjeyaraj.com/dbsj/archives/710, accessed 21 March 2013.

[67] Ibid.

[68] See, http://www.dinamina.lk/2009/05/22/_art.asp?fn=e090522 for original article, accessed 21 March 2013.

[69] D.B.S. Jeyaraj, "Poddala Jayantha: Latest Journalist victim in Sri Lanka," 5 June 2009, http://dbsjeyaraj.com/dbsj/archives/710, accessed 21 March 2013.

[70] Kishali Pinto Jayawardene, "The 'chilling' of free expression in Sri Lanka," *the Sunday Times, 8 July 2012, http://www.sundaytimes.lk/120708/columns/the-chilling-of-free-expression-in-sri-lanka-5383.html*, accessed 22 March 2013.

